කාර්යසාධන වර්තාව

2015

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව

පටුන

	පිටුව
❖ අන්තර්ගතය	2
❖ ස්තුතිය	3
❖ දැක්ම හා මෙහෙවර	4

01. අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය	05 - 09
02. පාලන අංශයේ කාර්යසාධනය	10 – 15
03. පුහුණු අංශයේ කාර්යසාධනය	16 - 21
04. විමර්ශණ අංශයේ කාර්යසාධනය	22 – 23
04.1 - 2015 සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය	24
05. සමාජ සුභසාධන අංශයේ කාර්යසාධනය	25 - 31
06. සමාජ ආරක්ෂණ අංශයේ කාර්යසාධනය	32 - 34
07. සමාජ සංවර්ධන අංශයේ කාර්යසාධනය	35 - 45
08. ප්‍රජාමූල සංවිධාන අංශයේ කාර්යසාධනය	46 - 49
09. ජීවනෝපාය සංවර්ධන අංශයේ කාර්යසාධනය	40 - 66
10. අලෙවි සංවර්ධන අංශයේ කාර්යසාධනය	67 - 76
11. තොරතුරු තාක්ෂණ අංශයේ කාර්යසාධනය	77
12. මාධ්‍ය අංශයේ කාර්යසාධනය	78
13. ප්‍රජාමූල බැංකු අංශයේ කාර්යසාධනය	79 – 115
14. ගිණුම් වාර්තා	116

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව

ස්තූතිය

2013 අංක 1 දරණ දිවිනැගුම පනතින් පිහිටුවා ඇති දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අභිලාෂයන් මුදුන් පමුණුවා ගනිමින්, රටටත්, රටේ දිළිඳු ජනතාවටත් කාර්යක්ෂම හා ගුණාත්මක සේවයක් ඉටුකිරීම සඳහා, 2015 වර්ෂයේදී ඇපකැපවී කටයුතු කල දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ සියලුම කාර්යමණ්ඩලයට පළමුව කෘතඥතාවය පලකරමි.

තවද, ඉහත පරිදි වන ජනතා සේවයන් සැලසීමේදී, නිසි මහපෙන්වීම් ලබාදෙමින්, මෙම දෙපාර්තමේන්තුව වෙත දැක්වූ කාරුණික සහයෝගය වෙනුවෙන් මුදල් අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ හා නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශයේ හා සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශයේ ලේකම්තුමන්ලා ඇතුළු අදාල සියලු නිලධාරීන්ටත්, සමස්ථ කාර්ය මණ්ඩලය වෙනුවෙන් ස්තූතිය පිරිනමමි. එමෙන්ම, දෙපාර්තමේන්තුවේ සංවර්ධන කටයුතු, සහනාධාර සහ සමාජ සුභසාධන සේවා නිසිපරිදි පවත්වාගෙන යාමට දිවයිනේ සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන් දැක්වූ කාරුණික සහයෝගය හා රාජකාරී කැපවීම් කෘතවේදීව සිහිපත්කරමි.

අවසාන වශයෙන්, 2015 වසරේ අප දෙපාර්තමේන්තුවේ රාජකාරී කටයුතු පවත්වාගෙන යාමේදී, නන් අයුරින් සහයෝගය දැක්වූ සියලුම අදාල රාජ්‍ය ආයතනවලටත්, අනෙකුත් අදාල ආයතන හා පුද්ගලයන්ටත් ස්තූතිය පුදකරමි.



චන්ද්‍රා වික්‍රමසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව

අපගේ දැක්ම

“ දිළිඳුබව තුරන් කරමින්, ජීවනෝපාය ආර්ථික කටයුතු තුලින් සවිබල ගැන්වූ ප්‍රජාවක් ”

අපගේ මෙහෙවර

“ප්‍රජාව සවිබල ගැන්වීම, මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීම හා ජීවනෝපාය කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධනය මඟින් ජාතික සංවර්ධනය වේගවත් කිරීමට දායක වීම හා ආහාර සුරක්ෂිතතාවය තහවුරු කරමින්, දිළිඳුබව තුරන් කළ හා සමාජ සාධාරණත්වය සහතික කෙරෙන සමෘද්ධිමත් ජාතියක් ගොඩනැඟීමට ප්‍රබලව දායකවීම”

01. අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

1995 අංක 30 දරණ පනත මඟින් පිහිටුවා තිබූ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, 1996 අංක 18 දරණ පනත මඟින් පිහිටුවා තිබූ ශ්‍රී ලංකා දක්ෂිණ සංවර්ධන අධිකාරිය සහ 2005 අංක 26 දරණ පනත මඟින් පිහිටුවා තිබූ ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරිය යන අධිකාරි තුන සහ උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව සහ සමෘද්ධි කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව යන දෙපාර්තමේන්තු දෙක ද ඇතුලුව, රාජ්‍ය ආයතන 05ක් ඒකාබද්ධ කරමින්, 2013 අංක 01 දරණ දිවි නැගුම පනතට අනුව, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. දිවිනැගුම පනතේ විධිවිධාන අනුව, ගරු ආර්ථික සංවර්ධන අමාත්‍යතුමා විසින් 2014 ජනවාරි 03 දිනැති අංක 1843/47 දරණ ගැසට් නිවේදනය පළ කිරීමෙන් පසු, මෙම දෙපාර්තමේන්තුව නිල වශයෙන් ස්ථාපිත කරන ලදී. අනතුරුව, ඉහත ආයතන 05 හි සේවය කරන ලද 26,000 කට අධික සේවකයින් නව දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය කරන ලදී. මෙම දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරිත්වය දිවයිනේ දිස්ත්‍රික් 25 තුළ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 332 ක් තුළ සහ ග්‍රාම නිලධාරී වසම් 14,022 ක් ආවරණය වන පරිදි පැතිර පවතී. ඒ අනුව, දෙපාර්තමේන්තුවේ කටයුතු ක්‍රියාත්මක කිරිම සඳහා දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් වශයෙන් දිස්ත්‍රික් ලේකම්වරුන්ද, දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන්ද, ප්‍රාදේශීය ලෙකම්වරුන්ද සෘජුව දායක වේ.

දිවයිනේ ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ළඟා කර ගැනීම සඳහා, දිළිඳුබව තුරන්කිරීමේ සහ සමාජ සාධාරණත්වය සහතික කිරීමේ ජාතික ප්‍රතිපත්තිය බලාත්මක කරමින් පුද්ගලයා, පවුල, කණ්ඩායම් සහ ප්‍රජාව කේන්ද්‍ර කරගත් ජීවනෝපාය සංවර්ධන ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම මෙම දෙපාර්තමේන්තුවේ එක් ප්‍රධාන අරමුණකි. මේ සඳහා, දිවයින පුරා දිවි නැගුම ප්‍රජාමූල සංවිධාන ස්ථාපිත කොට, ජාතික, දිස්ත්‍රික්ක හා ප්‍රදේශිය මට්ටමේ සම්බන්ධීකරණ ජාලයන් ගොඩනැගීම, ක්ෂුද්‍ර මූල්‍ය බැංකු පද්ධතිය ප්‍රවර්ධනය කිරීම මඟින් ඉලක්කගත ප්‍රජාවට ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් සැපයිම හා ජාතික සංවර්ධන ක්‍රියාවලියට ජනතාව ඒකරාශි කිරීම දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ තවත් මූලික අරමුණකි. මේ සඳහා, 2013 අංක 01 දරණ දිවි නැගුම පනතේ විධි විධාන අනුව, දෙපාර්තමේන්තුව පහත පරිදි වන ප්‍රධාන ධාරා තුනක් යටතේ ක්‍රියාත්මක වේ.

(I) නිල ව්‍යුහය සහිත දෙපාර්තමේන්තු ධාරාව

(II) ප්‍රජා මූල බැංකු පද්ධති ධාරාව

(III) ප්‍රජා මූල සංවිධාන ධාරාව

(I) නිල ව්‍යුහය සහිත දෙපාර්තමේන්තු ධාරාව

දෙපාර්තමේන්තුවේ නිල ව්‍යුහයේ සංයුතිය පහත පරිදි වන නිල තන්ත්‍රයකින් සමන්විත වේ. එනම්, ප්‍රධාන කාර්යාලය, අධ්‍යක්ෂ ජනරාල්, අතිරේක අධ්‍යක්ෂ ජනරාල් සහ පාලන, සමාජ ආරක්ෂණ හා සමාජ සුභසාධන, සමාජ සංවර්ධන, ප්‍රජා මූල සංවිධාන, ජීවනෝපාය සංවර්ධන, තොරතුරු තාක්ෂණ, මාධ්‍ය, ප්‍රජා මූල බැංකු, ගිණුම් හා මූල්‍ය සහ අභ්‍යන්තර විගණන යන අංශවල අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන ගණකාධිකාරි, ප්‍රධාන අභ්‍යන්තර විගණක යන අංශ ප්‍රධානීන්ගෙන් යුත් අංශ 12 ක් සහිතව ප්‍රධාන කාර්යාලයේ රාජකාරී කටයුතු ක්‍රියාත්මක කරනු ලබයි. දිස්ත්‍රික් මට්ටමින්, දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන් / දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ මෙහෙයවීම යටතේ, දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන් සහ එම කාර්ය මණ්ඩලය මඟින් දිස්ත්‍රික්, ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ හා ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් දිවිනැගුම පනතේ අරමුණු ළඟා කර ගැනීමට අදාල රාජකාරී ක්‍රියාත්මක කරනු ලබයි. ප්‍රජා මූල බැංකු කටයුතු, ප්‍රජා මූල සංවිධාන ගොඩනැඟීම සහ සංවර්ධන ව්‍යාපෘති ගම් මට්ටමින් ක්‍රියාත්මක කිරීම ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ මූලිකත්වයෙන්, දිවිනැගුම කළමනාකරුවන් සහ දිවිනැගුම සංවර්ධන නිලධාරීන් ඇතුළු අනෙකුත් සියලු කාර්යාල හා ක්ෂේත්‍ර නිලධාරීන් විසින් ඉටු කරනු ලබයි.

(II) ප්‍රජාමූල බැංකු පද්ධති ධාරාව

මෙම අංශයේ කාර්යභාරය වන්නේ, ප්‍රධාන කාර්යාලයේ බැංකු මූල්‍ය අධ්‍යක්ෂ යටතේ පාලනය වන කාර්ය මණ්ඩලය මඟින් සහ දිවයින පුරා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 332 කට අදාල මූලස්ථාන කාර්යාල හා ප්‍රජාමූල බැංකු සමිති සහ ග්‍රාමනිලධාරි වසම් මට්ටමින් ක්‍රියාත්මක වන බැංකු 1074 කට අදාල සියලු කාර්ය මණ්ඩලය මඟින් මෙම බැංකු පද්ධතිය ක්‍රියාත්මක කිරීමයි. එම පද්ධතිය මඟින්, සමෘද්ධි සහනාධාර බෙදාදීම, ප්‍රතිලාභීන්ගේ අනිවාර්ය ඉතිරි කිරීමේ තැන්පතු පවත්වා ගෙනයාම, ප්‍රතිලාභීන්ට හා අඩු ආදායම්ලාභීන්ට ක්ෂුද්‍රමූල්‍ය ණය නිකුත් කිරීම, ඉතිරි අරමුදල් වැඩි ප්‍රතිලාභ ලැබෙන මූලාශ්‍රවල ආයෝජනය කිරීම සහ වෙනත් සමාජ සුභසාධන කටයුතු ක්‍රියාත්මක කිරීමද කරනු ලබයි.

2015 වර්ෂය තුළදී, ජීවනෝපාය කටයුතු සඳහා ණය පහසුකම් අත්‍යවශ්‍ය ග්‍රාමීය ජනතාවට විවිධ ක්‍රම මඟින් ලබාදී තිබූ මුළු ණය වටිනාකම රු.මි. 26,184 කි. ඊට අදාල ණය සංඛ්‍යාව 462,970 කි. 1999 සිට 2015 වර්ෂය අවසාන වන විට ප්‍රතිලාභීන්ට ලබා දී තිබූ මුළු ණයවල සමුච්චිත වටිනාකම රු.මි. 152,890 කි. ඊට අදාල සමුච්චිත ණය සංඛ්‍යාව 6,851,459 කි. තවද, මෙම අංශයේ සියලු කටයුතු නව තොරතුරු තාක්ෂණ ක්‍රමවේද ඔස්සේ ක්‍රියාවලි ගතකොට, ජනතාවට වඩා කාර්යක්ෂම හා ගුණාත්මක සේවාවක් ලබාදීමට අපේක්ෂිතය. මෙම අංශයට අදාල කාර්යසාධනය සම්බන්ධ තොරතුරු අංක 13 පරිච්ඡේදය යටතේ දක්වා ඇත.

(III) ප්‍රජාමූල සංවිධාන ධාරාව

දිවි නැගුම පනතේ අංක 09 සිට 14 දක්වා වන වගන්ති අනුව, ප්‍රජා මූල සංවිධාන පිහිටුවීම පිළිබඳ මූලික විධිවිධාන සඳහන් කර ඇත. පනතේ අදාල වගන්ති අනුව, ව්‍යවස්ථානුකූලව, නිල වශයෙන් ප්‍රජා මූල සංවිධාන පිහිටුවීමට නියමිත වී ඇති අතර, මේ වන විට ඊට අදාල ව්‍යවස්ථාව කෙටුම්පත් කොට, නීතිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර ඇත. ප්‍රජා මූල සංවිධාන පිහිටුවා, ශක්තිමත් කොට, ප්‍රජාව බලගන්වා, ඔවුන් ආර්ථික, සාමාජයීය හා අධ්‍යාත්මික වශයෙන් සංවර්ධනය කරමින් ප්‍රජා මූල බැංකු හා ජීවනෝපාය වැඩසටහන් සඳහා යොමු කිරීමේ අරමුණින්, 2014 වර්ෂය තුළදි ප්‍රජා මූල සංවිධාන 38,696 ක් පිහිටුවන ලදි. පනතේ සඳහන් අරමුණු ළඟාකර ගැනීම සඳහා, 2015 වසර තුලදී පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් 03 ක්, (එනම්, සිංහල මාධ්‍ය 02 ක් හා දෙමළ මාධ්‍ය 01 ක්) පවත්වා, තෝරාගත් කළමණාකරුවන් 139 දෙනෙකුට, (එනම්, සිංහල 89 ක් හා දෙමළ 50 ක්) ප්‍රජාමූල සංවිධාන ශක්තිමත් කිරීමට හා ප්‍රවර්ධනය කිරීමට අදාල විෂයය දැනුම ලබාදෙන ලදී. එමෙන්ම, ප්‍රජාමූල සංවිධාන නෛතිකව සථාපිතකොට ඒවායේ සමාජික ප්‍රජාව සවිබල ගැන්වීමේ කටයුතු එළඹෙන වසරවලදීද සිදුකිරීමට නියමිතය. මෙම අංශයට අදාල 2015 වසරේ කාර්යසාධනය සම්බන්ධ සවිස්තරාත්මක තොරතුරු අංක 08 පරිච්ඡේදය යටතේ දක්වා ඇත.

එමෙන්ම, 2015 වසරට අදාලව දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ලඟා කර ගත් කාර්යසාධනය පිළිබඳ සාරංශ විස්තරයක් පහත දක්වා ඇත.

ජීවනෝපාය සංවර්ධනය මූලික කොටගත් සංවර්ධන ව්‍යාපෘති

2015 ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා, මහා භාණ්ඩාගාරයෙන් සෘජුව රු.මි. 1,200 ක් ද, අමාත්‍යාංශ ප්‍රතිපාදන ලෙස රු.මි. 1,353.6 ක් ද ඇතුළු ව රු.මි. 2,553.6 ක මුළු ප්‍රතිපාදන මෙම දෙපාර්තමේන්තුවට ලැබුණි. ජීවනෝපාය සංවර්ධන අංශයේ ක්‍රියාත්මක ව්‍යාපෘති අතර, කෘෂිකර්ම සංවර්ධන ව්‍යාපෘති, සත්ත්ව පාලන ව්‍යාපෘති, ධීවර සංවර්ධන ව්‍යාපෘති, ස්වයං රැකියා කර්මාන්ත සංවර්ධන වැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම තුළින් දිවිනැගුම (සමෘද්ධි) ප්‍රතිලාභි පවුල්වල හා අඩු අදායම්ලාභි පවුල්වල අදායම් මට්ටම ඉහල නැංවීමත්, එම පවුල්වල සෞඛ්‍ය හා පෝෂණ මට්ටම උසස් කිරිමත්, රැකියා වෙළඳපොලට උචිත ශ්‍රමිකයින් සැපයීම සඳහා වෘත්තිය පුහුණුව ලබාදීමත් මෙම අංශයේ ප්‍රධාන කාර්යයන් වේ.

2015 වර්ෂය තුළ, මෙම දෙපාර්තමේන්තුවේ සියලු සංවර්ධන අංශ මඟින්, රු.මි. 2,083.06 ක් වැය කරමින්, (එනම්, දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන රු.මි. 988.25 ක් සහ අමාත්‍යාංශ ප්‍රතිපාදන රු.මි. 1094.81 ක්) ඉලක්ක කළ මුළු ව්‍යාපෘති 110,674 කින්, ව්‍යාපෘති 85,455 නිම කරන ලදි. ඒ අනුව, 2015 වර්ෂය තුළදී ළඟාකර ගත් මූල්‍ය ප්‍රගතිය 82% ක් වන අතර, භෞතික ප්‍රගතිය 77% කි.

මෙම අංශය යටතේ, ඉහත දැක්වු උප අංශ සහ දිස්ත්‍රික් වශයෙන් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති, ඒ සඳහා වැයකල මුදල්, ව්‍යාපෘති හා ප්‍රතිලාභීන් පිළිබද වැඩිදුර තොරතුරු අංක 09 පරිච්ඡේදය යටතේ දැක්වේ.

අනෙකුත් අංශවල කාර්යසාධනය

2015 වර්ෂය තුළදී අනෙකුත් සේවා හා සංවර්ධන අංශවල, කාර්යසාධනය පිලිබඳ දත්ත හා තොරතුරු පහත පරිදි මෙම වාර්තාව තුළ ඇතුලත් කර ඇත. එනම්, සහායක සේවා වශයෙන් 2015 වසර තුළදී පාලන, පුහුණු හා විමර්ශණ අංශ ළඟා කරගත් කාර්යසාධනය පිළිවෙලින් අංක 02, 03 හා 04 පරිච්ඡේද යටතේද, සමාජ සුභසාධන හා සමාජ ආරක්ෂණ අංශයට අදාලව ළඟා කරගත් කාර්යසාධනය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු පිළිවෙලින් අංක 05 හා 06 පරිච්ඡේද යටතේද, සමාජ සංවර්ධන අංශයේ කාර්යසාධනය පිළිබඳ තොරතුරු අංක 07 පරිච්ඡේදය යටතේද, අලෙවි අංශයේ කාර්යසාධනය අංක 10 පරිච්ඡේදය යටතේද දක්වා ඇත. ඊට අමතරව, තොරතුරු හා තාක්ෂණ අංශයේ කාර්යසාධනය අංක 11 පරිච්ඡේදය යටතේද, මාධ්‍ය අංශයේ කාර්යසාධනය අංක 12 පරිච්ඡේදය යටතේද, ගිණුම් වාර්තා සම්බන්ධ විස්තර අංක 14 පරිච්ඡේදය යටතේද දක්වා ඇත.

මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධානම වැඩසටහනක් වන දිවිනැගුම (සමෘද්ධි) සහනාධාර වැඩසටහනේ 2015 වර්ෂයට අදාළ සාරාංශ ගත ප්‍රගතිය පහත පරිදිවේ. එනම්, සහනාධාරලාභී 1,453,078 දෙනෙකුට ලබාදුන් මුළු සහනාධාර වටිනාකම රු.මි. 40,210 ක් වන අතර, එම මුදල වැය කරනු ලැබුවේ, මෙම වසරේ දෙපාර්තමේන්තුවට වෙන්කරනු ලැබූ රු.මි. 41,760 ක මුළු ප්‍රතිපාදන මුදලිනි.

මීට අමතරව, සමාජ ආරක්ෂණ වැඩසටහන යටතේ 2015 වර්ෂය තුලදී , සමාජ ආරක්ෂණ අරමුදලින් රු.මි.638 ක් වැය කොට, ප්‍රතිලාභීන් 275,024 දෙනෙකුට ඔවුන්ගේ දෛනික ජීවිතයේ උපතේ සිට මරණය දක්වා වූ වැදගත් සිදුවීම්වලට අදාළව සහන ලබාදීමට හැකිවිය.

ඉහතින් දැක්වූ සංවර්ධන ව්‍යාපෘති ප්‍රතිපාදනවලට අමතරව, 2015 වසරේ කාර්යමණ්ඩල පුහුණු හා ධාරිතා සංවර්ධන කටයුතු සඳහා මහා භාණ්ඩාගාරයෙන් රු.මි. 8 ක් ලැබුණු අතර, ඉන් රු.මි. 6.31 වැය කොට, කාර්යමණ්ඩල සාමාජිකයින් 9,400 දෙනෙකුට පුහුණු අවස්ථා / ප්‍රතිලාභ ලබා දෙන ලදී. ඒ අනුව, ඊට අදාලව ළඟා කරගත් මූල්‍ය ප්‍රගතිය 79% කි. මෙම අංශය මඟින් ව්‍යාපෘති 67ක් ක්‍රියාත්මක කිරීමට ඉලක්ක කරගෙන තිබූ අතර, නිම කල ව්‍යාපෘති ගණන 58කි. ඒ අනුව ළඟා කරගෙන ඇති භෞතික ප්‍රගතිය 87%කි.

මීට අමතරව, 2015 වර්ෂයේදි, මුලින් සඳහන් කල රාජ්‍ය ආයතන 05 න් දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය කරන ලද නිලධාරීන් වෙනුවෙන් විශ්‍රාම වැටුප් ක්‍රියාවලිය හා අග්‍රහාර රක්ෂණ පහසුකම ක්‍රියාත්මක කිරිම වෙනුවෙන් අදාල ලිපිගොනු සකස් කිරිමේ කටයුතුද, දෙපාර්තමේන්තුව සඳහා බඳවා ගැනිමේ පටිපාටිය හා ආයතනික පාරිපාලන ව්‍යුහය සකස් කිරිමේ කටයුතු, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව, රාජ්‍ය සේවා කොමිසම් සභාව හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වැනි ආයතන සමඟ සම්බන්ධීකරණයෙන් අඛණ්ඩව ඉටුකරන ලදී.

ඉහත දැක්වූ පසුබිම තුළ, දෙපාර්තමේන්තුව සංවිධානමය හා පරිපාලනමය වශයෙන් ස්ථාවර කිරීමට අදාලව විවිධ ප්‍රායෝගික අපහසුතා සහ ගැටලුවලට මුහුණ දෙමින්, රු.මි. 2,083.06 ක් ප්‍රතිලාභීන්ගේ හා අඩු ආදායම්ලාභීන්ගේ ජීවන මට්ටම උසස්කර ලීමට වැයකොට, සංවර්ධන ව්‍යාපෘති 85,455 දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට හැකිවීම, දෙපාර්තමේන්තුව ළඟා කරගත් ජයග්‍රහණයකි. ඒ ඔස්සේ දිවිනැගුම පනතේ 04 වගන්තියේ සඳහන් පරමාර්ථ යම්තාක් දුරකට ළඟාකර ගැනීමට හැකි වූ බවද සඳහන් කරමි. එමෙන්ම, අප රටේ දිවිනැගුම (සමෘද්ධි) සහනාධාරලාභි හා අඩු ආදායම්ලාභි ජනතාව සවිබල ගන්වමින්, ඔවුන්ගේ ජීවනෝපාය හා ආර්ථික සංවර්ධන කටයුතු වේගවත් කරමින්, ඔවුන් දිළිඳු බවින් මුදවාලීමටත්, ඔවුන් රටේ

ප්‍රධාන ආර්ථික ධාරාවේ සක්‍රීය හා ස්ථාවර කොටස්කරුවන් බවට පත්කරලීමේත්, උදාර අරමුණ ළඟාකර ගැනීම සඳහා මෙම දෙපාර්තමේන්තුවට 2015 වසරේ ක්‍රියාත්මක වන ලදී. එම අරමුණු යථාර්තවාදීව, මුළුමනින්ම ළඟා කර ගැනීමට මෙම දෙපාර්තමේන්තුව ඉදිරියටත් දැඩි කැපවීමකින් ක්‍රියාකරන බව සතුටින් සඳහන් කරමි. ඉදිරි වර්ෂවලදී එම අරමුණු ළඟා කරගැනීම සඳහා අභිප්‍රේරණය වූ සහ කැපවූ මානව සම්පතක් නිර්මාණය කරලීමේ අරමුණද ඇතිව ඉදිරි සැලසුම් සකස්කොට ක්‍රියාත්මක කරන බවද සඳහන් කරනු කැමැත්තෙමි.

චන්ද්‍රා වික්‍රමසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව

02. පාලන අංශයේ කාර්යසාධනය

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ පාලන අංශය - ආයතනික, පුහුණු හා විමර්ශනවලට අදාල කටයුතු සිදු කරනු ලබයි. පරිපාලනයේ දී මුහුණ දෙනු ලබන එදිනෙදා කටයුතු සහ ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීමද මෙම අංශය යටතේ ඉටු කෙරෙන ප්‍රධාන රාජකාරී වේ.

2.1.1. ප්‍රධාන අරමුණු

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීමේ සිට අමාත්‍යාංශය සමඟ පැවැත්වෙන විශේෂ සාකච්ඡා හා සම්බන්ධීකරණ වැඩ පිළිවෙල පහතින් දැක්වේ.

- ❖ බඳවා ගැනීම් හා උසස්වීම් පටිපාටිය ක්‍රියාත්මක කිරීම.
- ❖ කාර්ය මණ්ඩලයේ යහපැවැත්ම, විනය පවත්වාගෙන යාම, දෛනික රාජකාරී කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.
- ❖ ආයතනයේ යහපැවැත්ම තහවුරු කිරීම.
- ❖ කාර්යාල පිරි සැකැස්ම සකස් කිරීම හා කාර්යාල සංවිධාන සටහන සකස් කිරීම.

2.1.2. දෛනික රාජකාරී

- ❖ දෛනික තැපැල පිළිබඳ කටයුතු කිරීම.
- ❖ අංශවල හා අංශගත සම්බන්ධීකරණය පවත්වාගෙන යාම.
- ❖ මහජන ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීම.
- ❖ සේවක මණ්ඩල ඉල්ලීම් පිළිබඳ කටයුතු කිරීම.
- ❖ කාර්ය මණ්ඩල පෞද්ගලික ලිපි ගොනු නඩත්තුව, පවත්වාගෙන යාම, යාවත්කාලීන කිරීම.
- ❖ ප්‍රවාහන ඒකකය කළමනාකරණය කිරීම.
- ❖ සේවක වැටුප්, දීමනා හා ගමන් වියදම් හා සියලුම ගෙවීම් සම්බන්ධ බිල්පත් ගෙවීම් කිරීමට අදාල කටයුතු.
- ❖ නිලධාරින් අනුයුක්ත කිරීම සම්බන්ධ සංඛ්‍යා ලේඛණ වාර්තා නඩත්තු කිරීම.
- ❖ අන්තර් දිස්ත්‍රික් ස්ථාන මාරු රාජකාරි කටයුතු.

2.1.3. විශේෂ පැවරුම්

- ❖ පාලන අංශයට අදාල පාර්ලිමේන්තු ප්‍රශ්නවලට අදාල පිළිතුරු ලබාදීම හා අමාත්‍යාංශය අතර සම්බන්ධීකරණය.
- ❖ මහජන පෙත්සම් කාරක සභා රාජකාරි කටයුතු.
- ❖ පාලන අංශයට අදාල විගණන විමසුම සඳහා පිළිතුරු සැකසීම හා සම්බන්ධීකරණය.
- ❖ පාර්ලිමේන්තු උපදේශක කාරක සභා රැස්වීමේවලින් පැන නගින කරුණු පිළිබඳව කටයුතු කිරීම හා ඒ පිළිබඳව අංශ ප්‍රධානීන් දැනුවත් කිරීම.
- ❖ කාර්යක්ෂමතා කඩඉම් විභාග සහ අනිකුත් උසස්වීම් විභාග පැවැත්වීම / සන්නිවේදන කාර්ය සපුරාලීම.
- ❖ පවතින පුරප්පාඩු පිළිබඳ සලකා බලා නව නිලධාරින් බඳවා ගැනීම.

2.1.4. කාර්ය මණ්ඩලය

ක්ෂේත්‍ර රාජකාරී කටයුතුවල නියුතු දිවිනැගුම සංවර්ධන නිලධාරින් ඇතුළු දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලය 24,001 කි.

වගුව - 01 යෝජිත කාර්ය මණ්ඩලය හා පුරප්පාඩු (සාරාංශය)

තනතුර	අනුමත සංඛ්‍යාව	දැනට සිටින ගණන	පුරප්පාඩු
පාලන හා සංවර්ධන අංශයේ කාර්ය මණ්ඩලය			
අධ්‍යක්ෂ ජනරාල්	1	1	0
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	7	1	6
අධ්‍යක්ෂ	19	8	11
දිස්ත්‍රික් දිවි නැගුම අධ්‍යක්ෂ	25	25	0
නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ	21	12	9
දිස්ත්‍රික් දිවි නැගුම නියෝජ්‍ය අධ්‍යක්ෂ	50	14	36
කොට්ඨාශ දිවි නැගුම සහකාර අධ්‍යක්ෂ	160	0	160
ප්‍රදේශීය දිවි නැගුම සහකාර අධ්‍යක්ෂ	332	0	332
පරිපාලන නිලධාරි	7	2	5
ජ්‍යෙෂ්ඨ දිවි නැගුම කළමනාකරු	205	0	205
දිවි නැගුම කළමනාකරු	2557	2399	158
දිවි නැගුම සංවර්ධන නිලධාරි	27437	20707	6730
කළමනාකාර සහකාර	477	371	106
අනු එකතුව	**31298**	**23540**	**7758**
තනතුර	**අනුමත සංඛ්‍යාව**	**දැනට සිටින ගණන**	**පුරප්පාඩු**

මූල්‍ය අංශයේ කාර්ය මණ්ඩලය			
ප්‍රධාන ගණකාධිකාරි	7	1	6
ප්‍රධාන අභ්‍යන්තර විගණක	1	1	0
ගණකාධිකාරි	27	19	8
අභ්‍යන්තර විගණක	8	4	4
මූල්‍ය සහකාර	7	1	6
ජ්‍යෙෂ්ඨ අභ්‍යන්තර විගණන නිලධාරි	25	0	25
අභ්‍යන්තර විගණන නිලධාරි	78	77	1
අභ්‍යන්තර විගණන සහකාර	128	120	8
අනු එකතුව	**281**	**223**	**58**
තාක්ෂණ අංශයේ කාර්ය මණ්ඩලය			
ඉංජිනේරු	6	2	4
පද්ධති විශ්ලේෂක	1	1	0
භාෂා පරිවර්තක	7	3	4
නීති නිලධාරි	1	1	0
පුහුණු හා පර්යේෂණ නිලධාරි	35	10	25
මාධ්‍ය නිලධාරි	2	2	0
තාක්ෂණ නිලධාරි	6	6	0
තොරතුරු තාක්ෂණ සහකාර	365	0	365
අනු එකතුව	**423**	**25**	**398**
අනෙකුත් කාර්ය මණ්ඩලය			
රියදුරු	297	133	164
කාර්යාල කාර්ය සහායක	441	67	374
අරක්කැමි	8	1	7
කම්කරු	16	12	4
අනු එකතුව	**762**	**213**	**549**
මුළු එකතුව	**32764**	**24001**	**8763**

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

2.1.5 දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරින්ගේ නාම ලේඛණය -2015

1. අධ්‍යක්ෂ ජනරාල්

1. ආර්.ඒ.ඒ.කේ. රණවක මහතා
   (2014.04.03 සිට 2015.01.28 දක්වා)
2. එච්. සුමනපාල මහතා
   (2015.02.25 සිට 2015.04.29 දක්වා)
3. ධම්මික ගුණවර්ධන මහතා
   (2015.04.30 සිට 2015.12.03 දක්වා)
4. චන්ද්‍රා වික්‍රමසිංහ මහත්මිය
   (2015.12.04 සිට ....)

2. අතිරේක අධ්‍යක්ෂ ජනරාල්

ආර්.එච්.ඩබ්.ඒ.කුමාරසිරි මහතා

3. ප්‍රධාන ගණකාධිකාරි

එස්.එම්.එස්.ජී. රත්නායක මහතා

4. අධ්‍යක්ෂ තනතුරු

1. සී.ඩී. කළුආරච්චි මහතා - අධ්‍යක්ෂ (පාලන)
2. සුනන්දා පියසීලී මිය - අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)
3. ජේ.එම්.එස්. බණ්ඩාර මහතා - අධ්‍යක්ෂ (ජීවනෝපාය සංවර්ධන)
4. අනුර එස් වීරරත්න මහතා - අධ්‍යක්ෂ (ප්‍රජා මූල සංවිධාන)
5. රාජිනී අතපත්තු මිය (2015.09.15 දක්වා) - අධ්‍යක්ෂ (සමාජ සංවර්ධන)
6. අයි.ඩී.නදීකා සංජීවනි මිය (2015.09.16 සිට) - වැ.බ.අධ්‍යක්ෂ (සමාජ සංවර්ධන)
7. ජේ.කේ. පද්මසිරි මහතා - අධ්‍යක්ෂ (සැලසුම් හා මෙහෙයුම්)
8. කාන්ති දිසානායක මිය - අධ්‍යක්ෂ (අලෙවි සංවර්ධන)

5. ගණකාධිකාරි තනතුරු

1. පී.ඒ.එස්.ජේ. කුමාර මහතා (මුදල් හා ගෙවීම්)
2. කේ.කේ.එල්. චන්ද්‍රතිලක මහතා (වත්කම්)

6. ප්‍රධාන අභ්‍යන්තර විගණක

1. එම්.කේ.ටී ද කොස්තා මහතා (2014.05.23 සිට 2015.08.15 දක්වා)
2. ඒ.පී. කොඩිකාර මිය (2015.08.16 සිට 2015.12.31 දක්වා)

7. දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ තනතුරු

1.	එච්.ආර්. සිරිනාම මිය -	කොළඹ
2.	කේ. ඒ.එම් පෙරේරා මහතා -	ගම්පහ
3.	බී.ඒ.එස්. උදයංගනි මිය -	කළුතර
4.	ඩී.එස්. විතානගේ මිය -	ගාල්ල
5.	කේ.ඒ.එල්. සිරිල් මහතා -	මාතර
6.	එන්.ජී.ජේ.පී.රෝහිත මහතා -	හම්බන්තොට
7.	ඩබ්.එම්.ටී.යු. විජේරත්න මිය -	මහනුවර
8.	කේ.ඩී.වික්‍රමසූරිය මහතා -	මාතලේ
9.	එච්.එම්.එස්.කේ.කේ. හේරත් මිය -	නුවරඑළිය
10.	එච්.එම්.සි. සුසන්ත හේරත් මහතා -	රත්නපුර
11.	එම්.එස්.එම්.සෆ්රාස් මහතා -	කුරුණෑගල
12.	එස්.ඒ.නාලක ප්‍රියශාන්ත මහතා -	පුත්තලම
13.	එන්. ආර්. රාජශිල්ප මහතා -	පොළොන්නරුව
14.	එම්. චන්දිමා මිය -	අනුරාධපුරය
15.	ඩබ්.එම්.පී.විජය බණ්ඩාර මහතා -	බදුල්ල
16.	යූ.පී.සඳරුවන් අනුරුද්ධ මහතා -	අම්පාර
17.	පී.ගුණරත්නම් මහතා -	මඩකලපුව
18.	කේ.පී.ප්‍රේමදාස මහතා -	ත්‍රිකුණාමලය
19.	කේ. මහේෂ්වරන් මහතා -	යාපනය
20.	ඒ.තවබාලන් මිය -	කිලිනොච්චිය
21	කේ.සසිරදන් මහතා -	මන්නාරම
22	එස්. පත්මරංජන් මිය -	වව්නියාව
23	ජේ.කනේෂමූර්ති මිය -	මුලතිව්
24	සිතාරා ගමගේ මිය -	කෑගල්ල
25	නීල් ප්‍රනාන්දු මහතා -	මොණරාගල

8. නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරු

1.	මහේෂ් පෙරේරා මහතා -	නි.අධ්‍යක්ෂ (සැලසුම් හා මෙහෙයුම්)
2.	එස්. ලියනාරච්චි මහතා -	නි.අධ්‍යක්ෂ (පුහුණු හා පර්යේෂණ)
3.	එච්. කේ. රණවීර මහතා -	නි.අධ්‍යක්ෂ (ජීවනෝපාය සංවර්ධන)
4.	ආර්.එම්.එල්.ඩබ්.එල්. රත්නායක මිය -	නි.අධ්‍යක්ෂ
5.	බී. ජී.එල්.ආර්.එන්.එස්. බණ්ඩාර මහතා -	නි.අධ්‍යක්ෂ
6.	එස්.ආර්. විජේසේකර මහතා -	නි.අධ්‍යක්ෂ
7.	ටී. ඒ. රණසිංහ මහතා -	නි.අධ්‍යක්ෂ
8.	එස්. වන්නිගම මහතා -	නි.අධ්‍යක්ෂ
9.	කපිල මාසකෝරාළ මහතා -	නි.අධ්‍යක්ෂ
10.	එස්.ඩී.කල්‍යාණි මිය -	නි.අධ්‍යක්ෂ
11.	රංජිත් ද සිල්වා මහතා -	නි.අධ්‍යක්ෂ

9. නියෝජ්‍ය අභ්‍යන්තර විගණක තනතුරු

1. පී.ආර්.ඩී.එච්. අනුරවංශ මහතා

10. සහකාර අධ්‍යක්ෂ තනතුරු

1. ආනන්ද ගමගේ මහතා
2. එස්. පී. වනිගතුංග මහතා
3. අයි. ඩී.එන්. සංජීවනි මිය
4. අයි.සී.ජේ. ගුණරත්න මහතා
5. පී. එම්.ඩී.ඩබ්.ඩී. පල්ලාවල මහතා
6. පී.ඩී.ආර්.කේ. පෙරේරා මහතා
7. ඒ.එෆ්. ප්‍රනාන්දු මහතා

11. ඉංජිනේරු තනතුර

1. ඒ.එල්.එම්. මාහීර් මහතා

12. පරිපාලන නිලධාරි තනතුරු

1. පී. ජී. උපුල් ජයශාන්ත මහතා
2 බී.එල්.එස්. බොරළුගොඩ මිය

03. පුහුණු හා පර්යේෂණ අංශයේ කාර්යසාධනය

2015 වසරේ දෙපාර්තමේන්තු ව්‍යුහය තුළ විවිධ වෙනස්කම් සහ ආයතනික කටයුතුවල විවිධ සංශෝධන සිදුවිය. එවැනි තත්වයන්ද සලකා, අදාල පුහුණු වැඩසටහන් සැලසුම් කර පවත්වා ගෙන යන ලදී.

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවට අනුයුක්තව සේවය කරන විවිධ තරාතිරම්වල නිලධාරින්ගේ දැනුම ආකල්ප හා කුසලතාව ධනාත්මක ලෙස වර්ධනය කර, ඒ අනුව, වඩාත් කාර්යක්ෂම හා සඵලදායි සේවයක් ලබාදීම උදෙසා ජාතික මට්ටමින් අදාල පුහුණු වැඩසටහන් සැලසුම් කරන ලදී.

වගුව - 02 ජාතික මට්ටමින් පවත්වන ලද පුහුණු වැඩසටහන්

අ.අ	පුහුණු වැඩසටහන	වැඩසටහන් ගණන	පුහුණු කරන ලද නිලධාරීන් සංඛ්‍යාව
01	පාලන හා විනය කටයතු පිළිබඳ පුහුණුව	01	100
02	කාර්යාල ක්‍රම හා ආයතන කටයතු පිළිබඳ පුහුණු වැඩසටහන	01	100
03	විශ්‍රාම වැටුප් සැකසීම පිළිබඳ පුහුණු වැඩසටහන	01	83
04	රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම පිළිබඳ පුහුණු වැඩසටහන	01	02
05	මාණ්ඩලික නිලධාරින් සඳහා විනය කාර්ය පටිපාටිය පිළිබඳ පුහුණු වැඩසටහන	01	50
06	පරිපාලන හා විනය කටයතු පිළිබඳ පුහුණුව (දෙමළ මාධ්‍ය)	01	20
07	ඉහළ ශ්‍රම ඵලදායිතාව සඳහා කාර්යාල කාර්ය පුහුණු කාර්යභාරය පුහුණු වැඩසටහන	01	09
08	රියදුරන් සඳහා වාහන වායු විමෝචන වැඩසටහන පිළිබඳ දැනුවත් කිරිමේ වැඩමුළුව	01	06
10	නිලධාරීන්ගේ අභිමතය පරිදි තෝරාගත් පාඨමාලා සඳහා ගාස්තු ගෙවීම (පශ්චාත් උපාධි පාඨමාලා / ග්‍රාමීය සංවර්ධන පාඨමාලා)		73
එකතුව		**08**	**443**

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

ඒ අනුව, මෙතෙක් අධිකාරිය යන මානසිකත්වයෙන් සිටි නිලධාරින් දෙපාර්තමේන්තුගතවීමෙන් පසු දෙපාර්තමේන්තු ගත ක්‍රමවේදය අනුව පුහුණු කිරීමට, පාලන හා විනය කටයුතු පිළිබඳ පුහුණුව ලබා දුන් අතර, රාජ්‍ය සේවයේ නීති රෙගුලාසි සම්බන්ධව දැනුවත්වීම මඟින් විනයගරුක කාර්යමණ්ඩලයක් බිහිකිරීම හා සේවා සුරක්ෂිතතාවය තහවුරු කිරීම එමඟින් අපේක්ෂා කෙරිණි.

තවද, විධිමත් පරිදි කාර්යාල ක්‍රම හා ආයතන කටයුතු පිළිබඳ පුහුණුව ලබාදීම තුළින් මනා වැඩ පරිසරයක් නිර්මාණය කර, විධිමත් හා ඒකීය රාමුවක් යටතේ ආයතන සංග්‍රහයට හා මූල්‍ය සංග්‍රහයට අනුකූලව රාජකාරි කිරීමට නිලධාරීන් දැනුවත් කිරීම පුහුණු කිරීම තුලින් අපේක්ෂා කෙරිණි.

ඉතා විශාල සේවක සංඛ්‍යාවකගේ විශ්‍රාම ගොණු සකස් කිරීම තුළ ඇතිවන වැරදි අවම කර ගැනීම සඳහා විශ්‍රාම ගොණුවක් සකස් කර ගැනීමේ මූලික පියවරේ සිට අවසානය දක්වාම විධිමත් පුහුණුවක් ලබා දෙන ලදී. ඒ තුළින් අපේක්ෂා කරන ලද්දේ, මේ වන විටත් තම මනාපය පරිදි දෙපාර්තමේන්තුවට බැඳීමට තෝරාගත් ක්‍රමවේදය තුළ ගොණුවල සිදුවන වැරදි අවම කරගැනීම හා ඒ තුළින් කඩිනම් සහ තෘප්තිදායක සේවාවක් නිලධාරීන්ට ලබාදීමයි.

ගිණුම් කටයුතු පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීම තුළින් මූල්‍ය කළමණාකරණය පවත්වා ගැනීම සම්බන්ධව නිලධාරීන්ගේ දැනුම වර්ධනය කිරීම අරමුණු කරගත් අතර, එය ද ජාතික මට්ටමින් පවත්වන ලද පුහුණු වැඩසටහනකි.

කාර්යාල කාර්ය සහායක පුහුණු වැඩසටහන සංවිධානය කිරීම තුළින්, කණ්ඩායම් හැඟීමෙන් යුතුව වැඩ කිරීමටත්, ඒ මඟින් මනා කාර්යක්ෂම සේවාවක් ලබාදීමත් අරමුණ කරගත් අතර, ඒ තුළින් ඉහල ඵලදායිතාවයක් අපේක්ෂා කෙරිණි.

මාණ්ඩලික නිලධාරීන් සඳහා වූ පුහුණුවේදී නව්‍යකරණයට අනුව සේවා සැපයිය යුතු ආකාරය ප්‍රමුඛ අරමුණ කරගෙන ඔවුන් සඳහා කාර්ය පටිපාටිය පිළිබඳ පුහුණු වැඩ සටහන පවත්වන ලදී. මානව සම්පත මනා ලෙස කළමණාකරණය කරගෙන යහපත් වැඩ පරිසරයක් තුළ සේවා සැපයීමද එමඟින් අපේක්ෂා කරන ලදී.

එසේම වාහන නඩත්තු කිරීම වඩා කාර්යක්ෂම කිරීමට හා ඒ තුළින් ඵලදායී සේවයක් ලබා ගැනීම අරමුණ කරගෙන, ආයතනයේ රියදුරන් සඳහා වායු විමෝචනය පිළිබඳව දැනුවත් කරන ලදී. එම පුහුණු වැඩමුළුව මඟින් වැඩි අවධානයක් යොමු නොකරන කණ්ඩායමක් සඳහාද අවධානය යොමු කරන ලද අතර, ඒ සම්බන්ධව ඔවුන්ගේ ප්‍රශංසාව පළ විය.

මෙම ජාතික මට්ටමේ පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව සතුව පහත සඳහන් පුහුණු මධ්‍යස්ථාන තිබේ.

1. නිල්ලඹ පුහුණු මධ්‍යස්ථානය
2. සමනලවැව පුහුණු මධ්‍යස්ථානය
3. මාතර පුහුණු මධ්‍යස්ථානය

ඉහත මධ්‍යස්ථාන තුළදී, 2015 වසර තුළ, පහත සඳහන් පුහුණු වැඩසටහන් පවත්වන ලදී.

වගුව - 03 පුහුණු මධ්‍යස්ථානවල පවත්වන ලද පුහුණු වැඩසටහන් - 2015

අ.අ	පුහුණු වැඩසටහන	වැඩසටහන් ගණන	පැවැත්වූ ස්ථානය	සහභාගී වූ සංඛ්‍යාව
01	අභ්‍යන්තර විගණන සහකාර නිලධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන	01	සමනලවැව පුහුණු මධ්‍යස්ථානය	40
02	1. කාර්යාල ක්‍රම සහ කාර්යාල කළමනාකරණ පුහුණුව 2. රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පුහුණුව	02	මාතර පුහුණු මධ්‍යස්ථානය	100
03	අභ්‍යන්තර විගණන අංශයේ නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩමුළුව සහ ප්‍රගති සමාලෝචන රැස්වීම	01	සමනලවැව පුහුණු මධ්‍යස්ථානය	180
අ.අ	පුහුණු වැඩසටහන	වැඩසටහන් ගණන	පැවැත්වූ ස්ථානය	සහභාගී වූ සංඛ්‍යාව
04	මහනුවර දිස්ත්‍රික් දිවිනැගුම කාර්යමණ්ඩලය සඳහා කාර්යාල ක්‍රම හා ආයතන කටයුතු පිළිබඳ නේවාසික පුහුණුව (කණ්ඩායම් 02 ක්)	02	නිල්ලඹ පුහුණු මධ්‍යස්ථානය	114
එකතුව		**06**		**434**

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

මාතර පුහුණු මධ්‍යස්ථානයේ නේවාසික පහසුකම් නොමැති අතර, නිල්ලඹ සහ සමනලවැව, නේවාසික පහසුනම් සහිත පුහුණු මධ්‍යස්ථානවීම විශේෂත්වයකි. රාජ්‍ය නිලධාරීන්, අධික රාජකාරි බහුලත්වයෙන් මිදී, නිහඬ හා සුවදායි පරිසරයක් තුළ පුහුණු වැඩසටහන් සඳහා යොමු කිරීමෙන් වඩා සඵලදායි පුහුණුවක් ලබාදීම උක්ත පුහුණු සැසි මඟින් අපේක්ෂා කරන ලදී.

ශ්‍රී ලංකාව බහු වාර්ගික රටක් බැවින්, දෙමළ මාධ්‍යයෙන් සේවය කරන නිලධාරීන් සඳහා ඔවුන්ගේ මව් භාෂාවෙන් පුහුණු වැඩසටහනක් සංවිධානය කල අතර, එමඟින්, ඔවුන්ගෙන්ද වඩා යහපත් සේවාවක් අපේක්ෂා කෙරේ.

මීට අමතරව, දිස්ත්‍රික් මට්ටමින් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර, සමස්ත පුහුණු වැඩසටහන් තුලින් අපේක්ෂා කරන ලද්දේ, කාර්ය මණ්ඩලයේ දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කිරීමටයි.

පහත සඳහන් පුහුණු වැඩසටහන් පසුගිය වසරේ ඒ ඒ දිස්ත්‍රික්කවල පවත්වන ලදී.

වගුව - 04 දිස්ත්‍රික් මට්ටමින් පවත්වන ලද පුහුණු වැඩසටහන් - 2015

අ.අ	දිස්ත්‍රික්කය	පුහුණු වැඩසටහන	වැඩසටහන් ගණන	සහභාගී වූ සංඛ්‍යාව
01	කොළඹ	අභ්‍යන්තර කාර්යමණ්ඩල නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන	13	863
02	කිලිනොච්චිය	අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලය සඳහා විෂයානුබද්ධ පුහුණුව ලබාදීම 1 ආයතනික ක්‍රම පිළිබඳ පුහුණුව (දින 02) 2 කළමණාකරුවන් සඳහා ආකල්ප සංවර්ධන පුහුණුව	02	62 75
03	කිලිනොච්චිය	දිස්ත්‍රික් අභ්‍යන්තර කාර්ය මණ්ඩලය සඳහා විෂයානුබද්ධ පුහුණුව ලබා දීම 1. විනය කාර්ය කළමනාකරණය - නිලධාරීන් 40 2. රාජ්‍ය ගිණුම් පුහුණුව - නිලධාරීන් 40 3. රාජ්‍ය ගිණුම් කළමනාකරණය සහ ගිණුම් ක්‍රම පිළිබඳ පුහුණුව සමාජ සංවර්ධන පුහුණු වැඩසටහන - නිලධාරීන් 40	03	120
04	ගම්පහ	අභ්‍යන්තර කාර්ය මණ්ඩලය සඳහා 1. ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි නියමයන් පිළිබඳ පුහුණුව (දින 02)	03	318
අ.අ	දිස්ත්‍රික්කය	පුහුණු වැඩසටහන	වැඩසටහන් ගණන	සහභාගී වූ සංඛ්‍යාව
05	ගාල්ල	අභ්‍යන්තර කාර්ය මණ්ඩලය 1. කාර්යාල ක්‍රම හා ආයතන කටයුතු 2. මත් ද්‍රව්‍ය නිවාරණ, සතුටු පවුල, ආහාර සුරක්ෂිතතාවය	02	200
06	රත්නපුර	දිවිනැගුම කාර්යමණ්ඩලය සඳහා ගිණුම් ක්‍රියාවලිය පිළිබඳ පුහුණු වැඩසටහන	01	40
07	කුරුණෑගල	අභ්‍යන්තර කාර්ය මණ්ඩලය සඳහා 1. ආයතන, විනය හා කාර්යාල කටයුතු පිළිබඳ එක් දින පුහුණුව **(වැඩමුළු 05)** **2.** ආයතන හා විනය පිළිබඳ එක් දින වැඩමුළුව 3. ගිණුම් (සිගාස්) පිළිබඳ එක් දින පුහුණුව 4. විශ්‍රාම වැටුප් සැකසීම පිළිබඳ එක් දින පුහුණුව	08	475
08	කෑගල්ල	අභ්‍යන්තර කාර්ය මණ්ඩලය සඳහා 1.විනය කාර්යය කළමනාකරණ පුහුණුව 2. භාණ්ඩ සමීක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන 3. රාජ්‍ය ගිණුම් කළමනාකරණය සහ ගිණුම් ක්‍රම පිළිබඳ පුහුණුව	03	180
09	මහනුවර	දිස්ත්‍රික්කයේ දොළුව ප්‍රා.ලේ.කාර්යාලයේ දි.සං.නිලධාරීන් පුහුණුව	01	55
10	මහනුවර	අභ්‍යන්තර කාර්ය මණ්ඩලය සඳහා 1.දෙපාර්තමේන්තුගත නිලධාරීන්ට හිමි විශ්‍රාම වැටුප් ගෙවීමට අදාල මූලික කරුණු පිළිබඳ දැනුවත් කිරීම. 2. දෙපාර්තමේන්තුගත නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොණු	02	127

		නිවැරදි ලෙස සැකසීම පිළිබඳ දැනුවත් කිරීම		
11	බදුල්ල	අභ්‍යන්තර කාර්ය මණ්ඩලය සඳහා 1. දිවිනැගුම කලාප කළමනාකරුවන් සඳහා කාර්යාල ක්‍රම හා ආයතනික කටයුතු පුහුණුව වැඩමුළුව (දින 01) 2. දිවිනැගුම ප්‍රජා මූල බැංකු කාර්යමණ්ඩලය සඳහා ආකල්ප සංවර්ධනය සහ ආයතන ඵලදායීතාවය පිළිබඳ පුහුණු පාඨමාලාව (දින 03) 3.දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විශ්‍රාම වැටුප් ක්‍රමයේ ලියාපදිංචි කිරීම හා පුද්ගලික ලිපිගොණු නඩත්තු කිරීම පිළිබඳ පුහුණු පාඨමාලාව -	03	468
12	බදුල්ල	දිස්ත්‍රික් දිවිනැගුම කළමනාකරුවන් සඳහා ආපදා කළමනාකරණ පුහුණු වැඩසටහන	01	100
13	හම්බන්තොට	අභ්‍යන්තර කාර්ය මණ්ඩලය සඳහා (ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශය, ආයතන සංග්‍රහයේ විධිවිධාන, කාර්යාල කළමනාකරණය සහ ලිපිගොනු කරණය, මුදල් රෙගුලාසි පිළිබඳ දැනුවත් කිරීම)	04	225
14	අම්පාර	මහඔය ප්‍රා.ලේ.කාර්යාලයේ දිවිනැගුම කාර්යමණ්ඩලය සඳහා ධාරිතා පුහුණු වැඩසටහන	01	34
15	අම්පාර	දෙහිඅත්තකණ්ඩිය ප්‍රා.ලේ.කාර්යාලයේ ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන	01	100
අ.අ	**දිස්ත්‍රික්කය**	**පුහුණු වැඩසටහන**	**වැඩසටහන් ගණන**	**සහභාගී වූ සංඛ්‍යාව**
16	අනුරාධපුර	අභ්‍යන්තර කාර්ය මණ්ඩලය සඳහා පුහුණුව ලබා දීම 1. කාර්යාල ක්‍රම හා ආයතන කටයුතු පිළිබඳ පුහුණුව (තෙදින) - වැඩසටහන් 2 - නිලධාරීන් 140 2. නව ගිණුම් ක්‍රම පිළිබඳ එක් දින පුහුණුව - වැඩසටහන් 2 - නිලධාරීන් 140	04	280
17	පොලොන්නරුව	අභ්‍යන්තර කාර්ය මණ්ඩලය සඳහා විෂයානුබද්ධ පුහුණුව ලබාදීම 1. ආයතන අංශයේ නිලධාරීන් සඳහා ආයතනික කටයුතු පිළිබඳ පුහුණු වැඩසටහන 2. ව්‍යාපෘති වාර්තා සකස් කිරීම පිළිබඳව මූලික පුහුණු වැඩසටහන 3. ව්‍යාජ මුදල් පිළිබඳ දැනුවත් කිරීම හා අන්තර්ජාල පහසුකම්, විද්‍යුත් තැපැල පිළිබඳව නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන	03	189
එකතුව			**55**	**3911**

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව සතු සුවිශේෂී වත්කම වන්නේ, විවිධ හැකියාවන්ගෙන් යුත් මානව සම්පතක් පැවතීමයි. එම මානව සම්පත මනා ලෙස කළමණාකරණය කරගෙන, ඔවුන් දැනුමෙන් හා කුසලතාවයෙන් පිරි යහපත් ආකල්ප සහිත සේවක මඩුල්ලක් බවට පත් කිරිමෙන්, ඉලක්ක කරා ඔවුන් සාර්ථක ලෙස මෙහෙයවමින් පුහුණු අංශය ඉදිරියටත් කටයුතු කරන බව සටහන් කරන්නේ සතුටිනි. ඉදිරි වර්ෂවලදී, මෙම මධ්‍යස්ථාන, ජාත්‍යන්තර මට්ටමේ පුහුණු වැඩමුළු වුවද පැවැත්විය හැකි මට්ටමට දියුණු කිරීමේ ඉලක්කය සපුරා ගැනීම අප හමුවේ ඇති තවත් අභියෝගයකි.

04. විමර්ශන අංශයේ කාර්යසාධනය

නීතිගරුක හා විනයගරුක කාර්ය මණ්ඩලයක් බිහිකිරීම තුළින් කාර්යක්ෂම හා සඵලදායී සේවාවක් ඉටුකරමින් වංචා, දූෂණ අක්‍රමිකතා වලින් තොර ආදර්ශමත් දෙපාර්තමේන්තුවක් නිර්මාණය කිරීම සඳහා ආයතනයතුළ සේවය කරන සියළුම නිලධාරීන් විසින් සිදුකරන සේවා පැහැර හැරීම්, අක්‍රමිකතා සහසාපරාධී ක්‍රියාවලට අදාළව ලැබෙන පැමිණිලි සම්බන්ධයෙන් විනය පියවර ගැනීම.

උක්ත අරමුණ ඉටු කර ගැනීම සඳහා,

01. මූලික විමර්ශන සිදුකිරීම.

02. චෝදනා පත්‍ර නිකුත් කිරීම හෝ නිදහසට කරුණු විමසීම.

03. විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීම.

04. විනය නියෝග නිකුත් කිරීම.

05. අභියාචනා සම්බන්ධ අවශ්‍ය කටයුතු කිරීම.

යන රාජකාරි මූලික වශයෙන් 2015 වර්ෂයේදීද ඉටු කරන ලදී. ඊට අදාල ප්‍රගතිය පහත දක්වා ඇත.

1. 2015 වර්ෂයට අදාලව විධිමත් විනය පරීක්ෂණ වාර්තා - 14
2. 2015 වර්ෂයට අදාලව විධිමත් විනය පරීක්ෂණයට අදාල නියෝග - 17
3. 2015 වර්ෂයට අදාලව මූලික විමර්ශන / අභ්‍යන්තර විගණන වාර්තා - 32
4. 2015 වර්ෂයට අදාලව නිකුත් කල චෝදනා පත්‍ර - 03
5. 2015 වර්ෂයට අදාලව වැඩ තහනම් කිරීම් - 01
6. 2015 වර්ෂයට අදාලව විනය පරීක්ෂණයට යටත්ව නැවත සේවයේ පිහිටුවීම් - 12
7. 2015 වර්ෂයට අදාලව තනතුර අතහැර ගිය නිලධාරීන් හා වෙනත් කරුණු සම්බන්ධයෙන් අභියාචනා මණ්ඩල නිර්දේශ අනුව පහත පරිදි තීරණ ලබා දීම - 81
   - දඩුවම් සහිතව නැවත සේවය ලබාදීම - 22
   - දඩුවම් ලිහිල් කිරීම - -
   - ප්‍රතික්ෂේප කිරීම - 59
   - විනය නියෝගවලට එරෙහිව රා.සේ.කො.සභාව වෙත යවන ලද අභියාචනා - 02

විශේෂ කරුණු :-

2015 පෙබරවාරි මස දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය බොරැල්ලේ සිට සෙත්සිරිපාය පරිශ්‍රයට ගෙන ඒමෙන් පසුව, විමර්ශන අංශය සඳහා කාර්යාල පරිශ්‍රයක් හඳුනා ගැනිමට කාලයක් ගතවූ බැවින්, එතෙක්, මෙම අංශයේ ලිපිගොනු බොරැල්ල කාර්යාලයේ පැවතීමත්, අංශයේ අධීක්ෂණ කටයුතු සිදුකළ නිලධාරිණිය ස්ථාන මාරුවී යාමත්, විමර්ශන අංශය සඳහා පූර්ණ කාලීනව අධීක්ෂණ කටයුතු කිරිමට මාණ්ඩලික නිලධාරීයෙකු නොසිටිමත් යන කරුණු හේතුවෙන්, 2015 වසරතුල විමර්ශන අංශයේ කාර්ය සාධනය අපේක්ෂිත මට්ටමට වඩා අඩුවී ඇත.

වගුව - 2015.12.31 දිනට සමස්ථ වැඩසටහන්වල ප්‍රගතිය

අනු අංකය	වැඩසටහන	වෙන්කල මුදල (රු.මි) 2015	අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව	මූල්‍ය ප්‍රගතිය		භෞතික ප්‍රගතිය	
				වියදම (රු.මි)	ප්‍රතිශතය (%)	නිමි ව්‍යාපෘති සංඛ්‍යාව	ප්‍රතිශතය (%)
දෙපාර්තමේන්තු ප්‍රතිපාදන							
01	ජීවනෝපාය සංවර්ධන වැඩසටහන	1,015	49,585	847	83	43,923	88
02	සමාජ සංවර්ධන වැඩසටහන	60	15,448	57	96	10,532	68
03	අලෙවි ප්‍රවර්ධන වැඩ සටහන	50	1,864	25	50	846	45
04	ප්‍රජා මූල සංවර්ධන වැඩසටහන	17	653	3	22	125	19
05	තොරතුරු තාක්‍ෂණ වැඩසටහන	30	03	30	100	03	100
06	මාධ්‍ය වැඩසටහන	4	03	-	-		
07	සමාජ සුභ සාධන වැඩසටහන	24	01	24	100	01	100
	උප එකතුව	**1,200.00**	**67,557**	**988**	**82**	**55,430**	**82**
අමාත්‍යාංශ ප්‍රතිපාදන							
08	ජීවනෝපාය සංවර්ධන වැඩසටහන	688.80	30,211	576	83	21,044	69
09	ජීවනෝපාය චක්‍රීය ණය වැඩසටහන	477.00	10,402	471	98	8,353	80
10	දිරිය පියස නිවාස වැඩසටහන	187.80	2,504	47	25	628	25
	උප එකතුව	**1,353**	**43,117**	**1,094**	**80**	**30,025**	**69**
	මුළු එකතුව	**2,553**	**110,674**	**2,083**	**81**	**85,455**	**77**
	වෙනත් වැඩසටහන්						
11	පුහුණු හා ධාරිතා වැඩසටහන	8	67	6.31	78	58	86
12	සමෘද්ධි සහනාධාර වැඩසටහන	41,760	01	40,209	96	01	100
13	ප්‍රජාමූල බැංකු වැඩසටහන (ක්ෂුද්‍ර මූල්‍ය ණය වැඩසටහන - 1998 – 2015)	-	-	153,990 (රු.ද.ල.) (ණය වටිනාකම)	-	6,851,459 (ණය සංඛ්‍යාව)	-
14	සමාජ ආරක්ෂණ වැඩසටහන	-	-	638 (රු.ද.ල.)	-	275,024 (ප්‍රතිලාභින් සංඛ්‍යාව)	-

05. සමාජ සුභසාධන අංශයේ කාර්යසාධනය

අඩු ආදායම්ලාභී පවුල්වල ආර්ථික මට්ටම, දරිද්‍රතා මට්ටමින් පහත නොවැටෙන පරිදි ස්ථාවරව තබා ගනිමින්, ඔවුන් සමාජ හා ආර්ථිකමය වශයෙන් සවිබල ගැන්වීමට සහයවීම.

දිවිනැගුම (සමෘද්ධි) වැඩසටහන

1995 වර්ෂයේ දී සමෘද්ධි සහනාධාර වැඩසටහන ආරම්භ වීමට පෙර ක්‍රියාත්මක වූ බොහෝ සහනාධාර වැඩසටහන්වල මූලික පරමාර්ථය වූයේ, සමාජ සුභසාධනය පමණි. එහෙත්, දිවිනැගුම (සමෘද්ධි) සහනාධාර වැඩසටහන ත්‍රිවිධ සංවර්ධන ප්‍රවේශයක් ඔස්සේ දිළිඳුකම පිටුදැකීම පරමාර්ථකොට ගෙන සමස්ත දිවයිනම ආවරණය වන පරිදි ක්‍රියාත්මක විය.



දිවිනැගුම (සමෘද්ධි) සහනාධාර වැඩසටහනේ වැදගත්ම ලක්ෂණය නම්, එය රටේ සමස්ත සංවර්ධනය අරමුණු කොටගෙන සංවර්ධන දිශානතිව ක්‍රියාත්මක වීමයි. ඒ අනුව, සමාජයේ අඩු ආදායම් ලබන පවුල්වල අවම ජීවන මට්ටම පවත්වා ගැනීම සඳහා, යම් මූල්‍යාධාරයක් සපයන අතර, ඔවුන්ගේ පවුල්වල ආදායම් තත්ත්වය වර්ධනය කර ගනිමින් රටේ සමස්ත ආර්ථික ක්‍රියාවලියට ඵලදායී ලෙස සම්බන්ධ කර ගැනීම හා පෙළඹවීමේ ක්‍රමෝපායක් ලෙසද මෙය හැඳින්විය හැකිය.

1995 සිට සමෘද්ධි සහනාධාර, දීමනාපත්‍ර ලෙස නිකුත් කිරීම සිදු කළද, 2012 අයවැය යෝජනා අනුව, එතෙක් ලබාදුන් සමෘද්ධි සහනාධාරය සමෘද්ධි බැංකු සංගම් මඟින් ප්‍රතිලාභියාට මුදල් ලෙස ගෙවීම ආරම්භ කරන ලදී. සමෘද්ධි ප්‍රතිලාභීන්, ඉතිරි කිරීමට හා එතුළින් ඉදිරි ආයෝජන කටයුතු උදෙසා පෙළඹවීම මෙහි අරමුණ විය.

2015 වර්ෂයේ සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව 1,453,078 ක් වූ අතර, ඒ සඳහා රු.බි. 40.2 ක මුදලක් වියදම් කර ඇත.

වගුව - 05 පසුගිය වසර 05 තුළ සමෘද්ධි සහනාධාර ප්‍රතිලාභීන් සංඛ්‍යාව (2011-2015)

වර්ෂය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
2011	1,541,318
2012	1,516,543
2013	1,477,173
2014	1,479,811
2015	1,453,078

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

සටහන : ඉහත වර්ෂවලට අදාල වියදම් විස්තරය ඊළඟ පිටුවේ දැක්වේ.

ප්‍රස්ථාරය - 01

පසුගිය වසර 05 තුළ සමෘද්ධි සහනාධාර ප්‍රතිලාභීන් සංඛ්‍යාව (2011-2015)



මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

වගුව - 06 පසුගිය වසර 05 තුළ සමෘද්ධි සහනාධාර වැඩසටහනේ වියදම (2011-2015)

වර්ෂය	වියදම රු.
2011	9,043,442,154.63
2012	10,553,188,655.62
2013	15,255,979,958.73
2014	15,041,799,341.62
2015	40,209,736,640.00

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

ප්‍රස්ථාරය 02

පසුගිය වසර 05 තුළ සමෘද්ධි සහනාධාර වැඩසටහනේ වියදම (2011-2015)



මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

වගුව - 07 2015 වර්ෂයේ සහනාධාර වැඩසටහනට අදාළව දීමනාව බෙදී ගිය ආකාරය

පවුලේ සාමාජික සංඛ්‍යාව	සහනාධාර වටිනාකම (රු)	අනිවාර්ය ඉතිරි කිරීම් (රු)	සමාජ ආරක්ෂණය (රු)	නිවාස ලොතරැයිය (රු)	ප්‍රතිලාභියාට හිමි වන මුදල (රු)
04 හෝ 04 ට වැඩි	3500/-	300/-	45/-	10/-	3145/-
03 දක්වා	2500/-	200/-	45/-	10/-	2245/-
03 ට අඩු	1500/-	100/-	45/-	10/-	1345/-
සවිබල ගැන්වූ පවුල්	420/-	365/-	45/-	10/-	-

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

5.1 අනිවාර්ය ඉතිරි කිරීම් :-

සමෘද්ධි ප්‍රතිලාභීන් ඉතිරි කිරීම් සඳහා හුරු කිරීමේ අරමුණින් සෑම ප්‍රතිලාභියෙකුම අනිවාර්ය ඉතිරි කිරීම් සඳහා දායක කරවනු ලබන අතර, යම් ආයෝජන අවශ්‍යතාවයකදී, හදිසි රෝහල් ගතවීමකදී, උසස් අධ්‍යාපන අවශ්‍යතාවයකදී අනිවාර්ය ඉතිරි කිරීම් දායක මුදල් ඒ සඳහා ලබා ගත හැකිය.

5.2 සමාජ ආරක්ෂණය:-

සමෘද්ධි ප්‍රතිලාභි පවුලක සිදුවන මරණයකදී, විවාහයකදී, රෝහල් ගතවීමකදී, දරු උපතකදී, සහ ප්‍රතිලාභී පවුල්වල දරුවන් අ.පො.ස. (උසස් පෙළ) හදාරන විටකදී මාස 24ක් සඳහා ශිෂ්‍යත්ව ලබාදෙමින්, පවුල ආර්ථික වශයෙන් පහත් මට්ටමකට ඇද වැටීම වලක්වාලීමේ අරමුණින් සිදු කෙරෙන ආරක්ෂණ වැඩසටහන් සඳහා, සෑම ප්‍රතිලාභියෙකුම දායක කරගනු ලැබේ.

5.3 නිවාස ලොතරැයිය:-

ප්‍රතිලාභී පවුල්වල නිවාස අවශ්‍යතා සපුරාලීමේ අරමුණින් සෑම ප්‍රතිලාභියෙකුගේම දායක මුදලින් ගොඩනංවනු ලබන නිවාස අරමුදලකි. සෑම මාසයකදීම ප්‍රතිලාභින් අතරින් ජයග්‍රාහකයින් 100 දෙනෙකු ලොතරැයි ක්‍රමය යටතේ තෝරා නිවසක් ඉදිරිකර ගැනීම සඳහා එක් අයෙකුට රු.150,000/- බැගින් ගෙවනු ලැබේ.

5.4 සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා වන සංගණනය

සමෘද්ධි සහනාධාරය සැබවින්ම ලැබිය යුතු ප්‍රතිලාභින් හඳුනාගැනිම සඳහා දිවයින පුරා සංගණනයක් සිදු කිරිමට 2015 අවසන් කාර්තුව මුලදී තීරණය කරන ලද අතර, ඊට අදාලව ලක්ෂ 25 ක සංගණන පත්‍රිකා මුද්‍රණය කීරීම සඳහා රු.මි. 24 ක් වැය කරන ලදි. තවද, සමික්ෂණ පත්‍රිකා 1,455,078 ක් වසර අවසාන වන විට බෙදා හරින ලදි.

5.5 ප්‍රතිලාභියාට හිමි වන මුදල:-

සමෘද්ධි බැංකු හරහා ප්‍රතිලාභියාට හිමි වන මුදලින් ආහාර හෝ වෙනත් අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා තමාට අවශ්‍ය ඕනෑම ස්ථානයකින් භාණ්ඩ හා සේවා ලබා ගැනීමේ අවකාශ සලසා ඇත. එම සහනාධාර මුදල් ප්‍රධාන කාර්යාලයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබාදීමටත්, අනතුරුව අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට නිකුත් කිරීමට සහ ඒ හරහා සමෘද්ධි බැංකුවට බැර කර එමගින් ප්‍රතිලාභී ගිණුමට බැර කිරීමත් ලෙස සිදුකල ක්‍රියාවලියට දීර්ඝ කාලයක් ගතවේ. එබැවින්, 2015 වසරේ සිට ප්‍රතිලාභියා අයත්වන බැංකු කලාපයේ සමෘද්ධි බැංකුවට, ප්‍රධාන කාර්යාලයේ සිට සෘජුවම මුදල් බැර කිරීම මගින් එම මුදල් ප්‍රතිලාභියාගේ ගිණුමට බැර කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. මෙමඟින්, ඉතා කෙටි කාලයකින් ප්‍රතිලාභියාට හිමි මුදල් ලබාගැනීමට අවස්ථාව උදා වී තිබේ.

වගුව - 08 2015 වර්ෂයේ සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව දිස්ත්‍රික්ක අනුව

දිස්ත්‍රික්කය	රු.420/-	රු. 1500/-	රු.2500/-	රු.3500/-	මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව
කොළඹ	1,268	21,945	9,339	17,012	49,564
ගම්පහ	7,349	41,593	22,260	45,417	116,619
කළුතර	6,063	23,711	10,995	21,804	62,573
මහනුවර	7,409	30,972	15,071	33,807	87,259
මාතලේ	3,087	15,803	7,862	14,965	41,717
නුවරඑළිය	8,065	12,419	6,031	13,126	39,641
ගාල්ල	7,893	20,246	11,806	31,254	71,199
මාතර	4,527	23,227	11,137	26,399	65,290
හම්බන්තොට	6,397	14,660	9,772	23,952	54,781
යාපනය	0	13,418	9,205	31,283	53,906
මන්නාරම	0	3,020	2,307	7,839	13,166
වවුනියාව	2,759	2,822	1,599	4,829	12,009
මුලතිව්	44	1,926	2,614	6,530	11,114
කිළිනොච්චිය	0	2,716	2,050	6,968	11,734
මඩකලපුව	16,502	19,764	10,269	32,677	79,212
අම්පාර	13,960	20,742	10,404	29,336	74,442
ත්‍රිකුණාමලය	7,330	10,218	5,899	15,602	39,049
කුරුණෑගල	8,555	51,155	27,581	58,440	145,731
පුත්තලම	1,559	22,123	9,446	20,959	54,087
අනුරාධපුරය	5,245	23,020	11,507	22,050	61,822
පොළොන්නරුව	4,304	7,691	5,781	11,241	29,017
බදුල්ල	6,087	18,608	9,699	22,126	56,520
මොණරාගල	7,306	12,656	8,045	18,677	46,684
රත්නපුරය	11,504	25,974	20,698	51,572	109,748
කෑගල්ල	8,382	19,214	11,869	26,729	66,194
එකතුව	**145,595**	459,643	253,246	594,594	1,453,078

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

- 2015 වර්ෂයේ ජනවාරි මස සිට දෙසැම්බර් දක්වා සමෘද්ධි සහනාධාර සඳහා ප්‍රතිපාදන දිස්ත්‍රික් මට්ටමින් වෙන් කර ඇති ආකාරය පහත සඳහන් වේ.

දිස්ත්‍රික් අනුව සමෘද්ධි සහනාධාර ප්‍රතිපාදන බෙදියාම - 2015 වර්ෂය													
දිස්ත්‍රික්කය	ජනවාරි	පෙබරවාරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජුනි	ජුලි	අගොස්තු	සැප්තැම්බර්	ඔක්තෝබර්	නොවැම්බර්	දෙසැම්බර්	මුළු ප්‍රතිපාදනය /අග්‍රමය (රු)
කොළඹ	97,171,780	97,171,780	97,171,780	119,457,680	119,457,680	117,153,380	117,292,820	117,111,740	116,934,660	116,727,740	116,548,980	116,339,560	1,348,539,580
ගම්පහ	118,007,060	118,007,060	118,007,060	285,178,380	285,178,380	283,424,460	283,153,820	282,156,020	281,824,800	281,239,420	280,748,000	280,085,580	2,897,010,040
කළුතර	231,079,200	231,079,200	231,079,200	144,658,120	144,658,120	144,276,520	144,040,000	143,834,400	143,582,980	143,353,140	142,969,020	141,914,460	1,986,524,360
මහනුවර	140,939,580	140,939,580	140,939,580	211,633,220	211,633,220	211,050,600	210,352,840	210,062,620	208,803,740	208,427,480	206,614,880	205,571,780	2,306,969,120
මාතලේ	145,204,000	145,204,000	145,204,000	99,193,360	99,193,360	99,163,020	98,793,420	98,543,320	98,209,360	97,820,640	97,394,700	97,033,540	1,320,956,720
නුවරඑළිය	231,027,640	231,357,360	231,357,360	83,386,620	83,386,620	83,275,380	83,217,380	83,156,780	83,087,020	83,057,520	83,033,460	83,034,300	1,442,377,440
ගාල්ල	294,200,580	294,200,580	294,200,580	176,766,820	176,766,820	175,403,960	175,218,660	174,964,640	174,575,400	173,983,440	173,360,740	172,588,060	2,456,230,280
මාතර	105,445,940	105,445,940	105,445,940	163,206,660	163,206,660	162,526,820	162,154,360	161,576,760	161,094,700	160,576,220	159,563,580	156,980,840	1,767,224,420
හම්බන් තොට	131,868,760	131,868,760	131,868,760	133,759,300	133,759,300	133,711,980	133,613,320	133,492,740	133,332,260	132,493,380	133,112,920	132,938,740	1,595,820,220
යාපනය	172,264,560	172,264,560	172,264,560	152,633,500	152,633,500	152,633,500	152,633,500	152,633,500	152,633,500	152,633,500	152,633,500	152,630,000	1,890,491,680
මන්නාරම	81,127,020	81,127,020	79,835,720	37,839,000	37,839,000	37,874,000	37,918,000	37,894,000	37,894,000	37,793,000	37,776,000	37,734,000	582,650,760
වව්නියාව	81,028,520	81,028,520	81,028,520	26,254,280	26,254,280	26,272,280	26,289,280	26,281,280	26,286,280	26,284,780	26,288,780	26,290,780	479,587,580
මුලතිව්	108,788,200	108,788,200	108,788,200	32,192,480	32,192,480	32,214,980	32,134,480	32,134,480	32,134,480	32,160,480	32,183,480	32,297,480	616,009,420
කිලිනොච් චිය	109,844,080	109,844,080	109,844,080	33,518,500	33,518,500	33,518,500	33,535,500	33,564,500	33,564,500	33,566,500	33,564,500	33,587,000	631,470,240

දිස්ත්‍රික්කය	ජනවාරි	පෙබරාවරි	මාර්තු	අප්‍රේල්	මැයි	ජුනි	ජුලි	අගොස්තු	සැප්තැම්බර්	ඔක්තෝබර්	නොවැම්බර්	දෙසැම්බර්	මුළු ප්‍රතිපාදනය /අගුමය (රු)
අම්පාර	89,722,300	89,722,300	89,722,300	167,475,040	167,475,040	166,885,560	167,105,860	166,564,540	166,536,220	166,355,260	166,026,500	165,662,200	1,769,253,120
ත්‍රිකුණාමල ය	115,746,100	115,746,100	115,746,100	87,689,560	87,689,560	87,699,060	87,781,480	87,787,800	87,785,080	87,791,780	87,769,660	87,760,100	1,136,992,380
කුරුණෑගල	55,921,640	55,921,640	55,921,640	361,475,500	361,475,500	361,063,200	359,751,200	358,793,000	357,567,360	357,019,860	355,267,660	353,818,100	3,393,996,300
පුත්තලම	71,159,460	71,857,460	71,857,460	134,020,860	134,020,860	134,049,120	133,918,700	132,635,180	131,969,980	131,590,780	131,403,180	130,810,780	1,409,293,820
අනුරාධපුර	149,273,840	149,220,260	149,220,260	143,966,740	143,966,740	143,685,800	143,905,600	143,758,380	143,495,980	143,679,420	142,825,860	142,675,400	1,739,674,280
පොළොන් නරුව	125,680,000	125,680,000	125,680,000	68,258,240	68,258,240	68,288,740	67,934,960	67,677,400	67,601,880	67,465,620	67,220,560	67,140,180	986,885,820
බදුල්ල	31,247,000	31,247,000	31,247,000	133,063,900	133,063,900	133,067,740	133,071,000	132,809,620	132,687,220	132,507,580	132,312,080	132,157,040	1,288,481,080
මොණරාග ල	21,640,780	21,640,780	21,640,780	109,469,840	109,469,840	108,263,640	108,190,700	108,116,220	108,095,600	107,935,520	107,628,320	107,534,520	1,039,626,540
රත්නපුරය	26,692,480	26,692,480	26,692,480	279,670,940	279,670,940	279,694,400	279,272,380	278,789,740	277,783,220	277,246,140	276,814,080	276,039,680	2,585,058,960
කෑගල්ල	27,557,000	27,557,000	27,557,000	159,614,260	159,614,260	159,165,600	158,605,620	157,801,060	157,749,920	157,358,400	156,090,040	155,565,440	1,504,235,600
එකතුව	**2,908,077,880**	**2,909,052,020**	**2,907,760,720**	**3,523,298,740**	**3,523,298,740**	**3,512,040,280**	**3,507,456,080**	**3,499,594,380**	**3,492,320,660**	**3,486,034,880**	**3,475,993,860**	**3,464,808,400**	**40,209,736,640**

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

06. සමාජ ආරක්ෂණ අංශයේ කාර්යසාධනය

දිවිනැගුම (සමෘද්ධි) ප්‍රතිලාභින් සවිබල ගන්වන තෙක්, ඔවුන්ගේ පවුල්වල මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා සමාජ ආරක්ෂණ අරමුදල ඔස්සේ, ඔවුන්ගේ උපතේ සිට මරණය දක්වා වන වැදගත් හා අත්‍යාවශ්‍ය සිදුවීම් වලට විවිධ මූල්‍ය සහන ලබා දෙමින්, සුමට ජීවිතයක් ගත කිරීමට ඔවුන්ට අවස්ථාව සැලසීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරයයි.

දිවිනැගුම සමාජ ආරක්ෂණ අරමුදල 1997 ජනවාරි 01 දින පිහිටුවා ඇත.

අරමුදලේ දායක වූවන් :- සමෘද්ධි සහනාධාර ලබන සියලුම පවුල්.

අරමුදලේ දායක මුදල් :- සමෘද්ධිලාභීන්ට ලබා දෙන සහනාධාර දීමනාවෙන් අවකරණය කරනු ලැබූ මුදලකි.(මසකට එක් ප්‍රතිලාභියෙකුගෙන් රු. 45/= ක් අවකරණය කරනු ලැබේ).

අරමුදලින් ඉටු කරන මූලික කාර්යයන් :-

- සහනාධාරලාභී පවුල්වල ආර්ථික සාමාජීය තත්වය පහත වැටෙන අවස්ථා වන මරණය හා රෝගීවීම් අවස්ථාවලදී දැරීමට වන වියදම් අවමකර ගැනීමට මූල්‍යාධාර ලබාදීම.
- පවුලේ අත්‍යාවශ්‍යම සාමාජික අවශ්‍යතා වන දරු උපත් හා විවාහ වීම් සඳහා වන වියදම් අවම කර ගැනීම සඳහා මූල්‍යාධාර ලබා දීම.
- සමෘද්ධිලාභී පවුලේ තෘතීක අධ්‍යාපනයේ නියැලි දරුවන්ට සිප්දොර ශිෂ්‍යත්ව වැඩසටහන තුලින් ශිෂ්‍යාධාර මුදල් ලබාදී එම දරුවන්ගේ අධ්‍යාපනයට අත්වැලක් වීම.

ලබා දෙන ප්‍රතිලාභ වටිනාකම්

(I) දරු උපතකට රු. 5,000/= ද,

(II) විවාහයක් සඳහා රු. 5,000/= ද,

(III) රෝහල්ගතවීම් රු. 6,000/= ද, (දිනකට රු 200/-බැගින් වර්ෂයකදී දින 30කට පමණි.)

(IV) මරණයක් සඳහ රු. 10,000/= ද,

(V) සිප්දොර ශිෂ්‍යත්ව මාසික දීමනාව එක් අයෙකුට රු. 1000/= කි.

1. අ.පො.ස (උ.පෙ) අධ්‍යයන කාලය වසර දෙක සඳහා රු. 24,000/=, ශිෂ්‍යාධාරය ලබාදේ. (වසරකට දිස්ත්‍රික් 25 න් තෝරා ගන්නා මුළු ශිෂ්‍යත්ව ලාභීන් සංඛ්‍යාව 10,000කි)

වගුව - 10 දිවිනැගුම සමාජ ආරක්ෂණ අරමුදල

2015.01.01. දින සිට 2015.12.31 දක්වා ගෙවීම් දිස්ත්‍රික් සාරාංශය

සංකේත අංකය	දිස්ත්‍රික් ලේකම් කාර්යාලය	උපත්		විවාහ		රෝග		මරණ		ශිෂ්‍යත්ව		ගමන් වියදම්		වෙනත් වියදම්		විගණන වියදම්		එකතුව	
		ප්‍රමාණය	මුදල රු.	ප්‍රමාණය	මුදල රු.	ප්‍රමාණය	මුදල රු.	ප්‍රමාණය	මුදල රු.	ප්‍රමාණය	මුදල රු.	ප්‍රමාණය	මුදල රු.	ප්‍රමාණය	මුදල රු.	ප්‍රමාණය	මුදල රු.	ප්‍රමාණය	මුදල රු.
1	කොළඹ	51	255,000	401	2,005,000.00	328	996,000	654	6,540,000	5845	5845000	46	40236	0	276,632.23	0		7325	15,957,868
2	ගම්පහ	255	1,275,000	1493	7,465,000.00	1525	4,513,000	1650	16,500,000	11199	11,199,000	82	77,597	0	916,976.67	0		16204	41,946,573
3	කළුතර	145	725,000	982	4,910,000.00	865	2,328,600	1293	12,930,000	8514	8,514,000	2	1,986	0	587,995.79	0	205,365	11801	30,202,946
4	මහනුවර	227	1,135,000	791	3,955,000.00	1100	3,067,400	963	9,630,000	11785	11,785,000	26	19,694	5	442,480.79	0		14897	30,034,574
5	මාතලේ	132	660,000	454	2,270,000.00	517	1,429,800	502	5,020,000	7440	7,440,000	0		0	150,486.17	0	20,208	9045	16,990,494
6	නුවරඑළිය	201	1,005,000	482	2,410,000.00	610	1,684,400	775	7,750,000	5885	5,885,000	55	58,470	0	326,011.11	0		8008	19,118,881
7	ගාල්ල	157	785,000	1187	5,935,000.00	918	2,582,600	1358	13,580,000	11013	11,013,000	82	80,570	0	797,720.43	0		14715	34,773,890
8	මාතර	353	1,765,000	1261	6,305,000.00	1243	3,491,800	1161	11,610,000	8995	8,995,000	66	65,359	4	508,780.77	0		13083	32,740,939
9	හම්බන්තොට	341	1,705,000	1137	5,685,000.00	901	2,536,800	798	7,980,000	6112	6,112,000	65	71,470	0	183,934.47	0	33,109	9354	24,307,313
10	යාපනය	310	1,550,000	792	3,960,000.00	813	2,176,800	656	6,560,000	9549	9,549,000	0	0	0	335,458.22	0		12120	24,131,258
11	මන්නාරම	162	810,000	337	1,685,000.00	314	836,000	141	1,410,000	7041	7,041,000	0	0	0		0		7995	11,782,000
12	වව්නියාව	71	355,000	158	790,000.00	163	486,000	116	1,160,000	2082	2,082,000	0	0	0	147,763.17	0		2590	5,020,763
13	මුලතිව්	163	815,000	118	590,000.00	159	546,800	76	760,000	451	451,000	0	0	0		0		967	3,162,800
14	කිලිනොච්චි	58	290,000	131	655,000.00	115	334,800	80	800,000	167	167,000	0	0	0		0		551	2,246,800
15	මඩකලපුව	414	2,070,000	1934	9,670,000.00	1695	4,144,400	799	7,990,000	11066	11,066,000	38	38,000.	0		0		15946	34,978,400
16	අම්පාර	643	3,215,000	2503	12,515,000.00	2669	6,112,800	977	9,770,000	9035	9,035,000	15	14,879	0	671,809.17	0		15842	41,334,488
17	ත්‍රිකුණාමලය	187	935,000	825	4,125,000.00	453	1,263,000	408	4,080,000	6935	6,935,000	18	15,131	0	228,176.84	0		8826	17,581,307
18	කුරුණෑගල	603	3,015,000	1965	9,825,000.00	2318	6,765,400	2108	21,080,000	15731	15,731,000	9	6,423	0	1,030,580	0		22734	57,453,403
19	පුත්තලම	371	1,855,000	860	4,300,000.00	527	1,598,400	719	7,190,000	8945	8,945,000	72	45,440	0	471,531.70	0	317,550.	11494	24,722,922

20	අනුරාධපුරය	353	1,765,000	749	3,745,000	796	2,235,400	664	6,640,000	8376	8,376,000	60	57,565	0	330,626	0		10998	23,149,591
21	පොළොන්නරුව	184	920,000	428	2,140,000	330	1,030,600	342	3,420,000	4474	4,474,000	41	40,400	0	181,349	0		5799	12,206,349
22	බදුල්ල	288	1,440,000	1178	5,890,000	1510	3,931,400	925	9,250,000	9302	9,302,000	90	89,269	26	547,753	0		13319	30,450,422
23	මොණරාගල	269	1,345,000	920	4,600,000	812	2,240,600	595	5,950,000	8579	8,579,000	36	31,783	0	264,640	0		11211	23,011,023
24	රත්නපුර	544	2,720,000	2299	11,495,000	1682	5,044,600	1981	19,810,000	11320	11,320,000	8	5,468	0	616,851	0		17834	51,011,919
25	රත්නපුර	132	660,000	867	4,335,000	1185	3,438,600	1172	11,720,000	8988	8,988,000	22	26,026	0	665,978	0		12366	29,833,604
	එකතුව	6614	33,070,000	24252	121,260,000	23548	64,816,000	20913	209,130,000	198829	198,829,000	833	785,767	35	9,683,537	0	209,130,000	275024	638,150,536

07. සමාජ සංවර්ධන අංශයේ කාර්ය සාධනය

සමාජ සංවර්ධනය යනු සමාජයේ සියලුම අංශවල සමස්ත සංවර්ධනයයි. ඒ අනුව දිළිඳු හා අඩු අදායම්ලාභී පවුල්වල සියළු මූලික අවශ්‍යතා සපුරාලමින් සමස්ත සමාජය තුළ අධ්‍යාත්මික සංවර්ධනයෙන් පිරිපුන් පරිසරයක් ඇති කිරිම මෙහි මූලික අරමුණ වේ.

පසුබිම

"සමාජ සංවර්ධනයෙන් තොර ආර්ථික සංවර්ධනයක් ඇති කළ නොහැක" යන තේමාව පදනම් කර ගනිමින් 2015 වර්ෂය තුළ දී සමාජ සංවර්ධනය උදෙසා මෙම අංශය මඟින් ක්‍රියාත්මක කළ වැඩසටහන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

- සියලු අවාසි සහගත සමාජ කොටස්වල සාමාජීය වටිනාකම ඉස්මතු කිරිමට කටයුතු යෙදීම.
- දිළිඳු බවට හේතු වන සාමාජීය සාධකයන් හඳුනාගෙන පිළියම් යෙදීම.
- අඩු ආදායම්ලාභීන්ගේ හා එම පවුල්වල දරුවන්ගේ සාමාජීය හා සංස්කෘතික අගයන් වැඩි කිරිම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.
- ආධ්‍යාත්මික හා සදාචාර වර්ධනයෙන් පිරිපුන් පවුලක් ඇති කිරිම.
- සමාජ සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන සියලු වැඩසටහන් වල ආදර්ශයක් ලෙස දිස්ත්‍රික්කයට එක ගමක් තෝරා ගෙන එය සංවර්ධනය කිරිමට අවශ්‍ය කටයුතු කිරිම.

වර්තමාන කාර්ය භාරය

ඉහත අරමුණු ඉටු කර ගැනීම සඳහා 2015 වසරේ දී සමාජ සංවර්ධන අංශය වෙත රු.මි. 50 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබී ඇත. එම මුදල් යොදවාගෙන දිවිනැගුම ජාතික සංවර්ධන වැඩසටහනට සමගාමීව ආධ්‍යාත්මික හා සමාජ සංවර්ධන වැඩසටහන දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කිරිම සමාජ සංවර්ධන අංශයේ කාර්යභාරය විය. මීට අමතරව, නිවාස සංවර්ධන හා සමෘද්ධි අමාත්‍යාංශය මඟින් රු.මි. 200 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබුණු අතර, එයින් රු.මි. 187.8 නිවාස ඉදිකිරිමට හා ඉතිරි රු.මි. 12.2 උළු ලබාදීම සඳහා යෙදවා ඇත. ඊට අමතරව, සමාජ සංවර්ධන පදනමෙහි අරමුදල් යොදා ගනිමින් ද මෙම වසරේ සමාජ සංවර්ධන වැඩසටහනේ ඉලක්ක සපුරා ගෙන ඇත.

මේ අනුව පහත සඳහන් පරිදි ප්‍රධාන අංශ 5 ක් යටතේ යෝජිත වැඩසටහන් ක්‍රියාත්මක විය.

01. ආධ්‍යත්මික හා සමාජ සංවර්ධන වැඩසටහන්

I. ආධ්‍යාත්මික සංවර්ධනය
II. මත් හා දුම්වැටි නිවාරණය
III. සතුටු පවුල වැඩසටහන
IV. ළමා ආරක්ෂණ හා ළමා සමාජ වැඩසටහන

02. දිරිය පියස නිවාස වැඩසටහන

03. ආදර්ශ ගම්මාන වැඩසටහන

04. ජාත්‍යන්තර දින සැමරීමේ වැඩසටහන

05. විශේෂ වැඩසටහන්

මෙම එක් එක් වැඩ සටහන යටතේ, 2015 වර්ෂය තුලදී ක්‍රියාත්මක කල ව්‍යාපෘති හා ක්‍රියාකරකම් පහත දක්වා ඇත.

7.1. ආධ්‍යාත්මික හා සමාජ සංවර්ධන වැඩසටහන

I.i ආධ්‍යාත්මික සංවර්ධනය

- ආගමික ස්ථාන වටා ප්‍රජාව රැස් කිරිම තුළින් ඔවුන් ප්‍රතිපත්ති පූජාවන් සඳහා යොමු කිරිම හා ආගමික ශ්‍රද්ධාව හා ප්‍රඥාව වර්ධනය කිරිම.
- ආගමික ස්ථානවල, පොදු ස්ථානවල හා ගෘහ ආශ්‍රිතව ශ්‍රමදාන, ඔසු උයන්, පරිසර හිතකාමී ගෙවතු ඇති කිරීම, පොදු දේපල සුරැකීමට හා දේශීයත්වයට හුරු කිරිම.
- දහම් පාසල් අධ්‍යාපනය වෙත, දරුවන් යොමු කිරීම හා සෑම ආගමික ස්ථානයකම දහම් පාසල් සංවර්ධනය කිරිම.
- ගම්මාන මට්ටමින් ළමා, තරුණ, වැඩිහිටි ප්‍රජාවගේ ආකල්ප සංවර්ධනය හා සෞන්දර්යයත්මක රසාස්වාදය දියුණු කිරිම.
  - ආධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් - 9200
  - මේ සඳහා වැය වූ මුදල රු.මි.ලියන - 0.16

7.1.1 මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන

අඩු ආදායම්ලාභීන්ගේ ආර්ථික සංවර්ධනයට ප්‍රබල ප්‍රතිරෝධකයක්ව පවතින මත් හා දුම්වැටි භාවිතයෙන් සිදු වන ආර්ථික හා සාමාජීය විනාශය පිළිබඳව දැනුවත් කරමින් විෂ මතට එරෙහිව ස්වේච්ඡා සංවිධාන, ආගමික සිද්ධස්ථාන, පාසැල් හා වෙනත් ප්‍රජා සංවිධාන සමඟ ඒකාබද්ධවී ඒවා කේන්ද්‍ර ස්ථාන කර ගනිමින් වසම්, ප්‍රාදේශීය, දිස්ත්‍රික් මට්ටිමන් වැඩසටහන් ක්‍රියාත්මක කිරිම.

- මත්ද්‍රව්‍ය හා දුම්වැටි පිළිබඳ පවතින දත්ත ඒකරාශී කිරිම හා නව සමීක්ෂණ මඟින් තොරතුරු සොයා බැලීම.
- ළමා තරුණ හා වැඩිහිටි ප්‍රජාව මත් උවදුර සම්බන්ධයෙන් විධිමත්ව දැනුවත් කිරිම හා මත්ද්‍රව්‍ය කෙරෙහි ඇති සමාජ ආකල්ප පිළිබඳ දැනුවත් කිරිමත් ඒවා කෙරෙහි ආකර්ශණය අඩු කිරීමේ ක්‍රියාකාරකම් පාසල් මට්ටමින් හා වෙනත් ප්‍රජා සංවිධාන මඟින් හෝ ආගමික ස්ථාන ආශ්‍රයෙන් ලබාදීම

- ළමා තරුණ හා වැඩිහිටි කණ්ඩායම් ඵලදායී මත්ද්‍රව්‍ය නිවාරණ ක්‍රියාකාරකම් සඳහා යොමු කරමින් ඔවුන්ගේ නායකත්වය තුළින් මත්නිවාරණ කමිටු පිහිටුවීම හා ක්‍රියාත්මක කරවීම.
- ප්‍රජාව තුළ මධ්‍යසාර භාවිත කරන්නන්ගේ අසාධාරණ හැසිරීම් හඳුනා ගැනිම හා එයට එරෙහි නැගී සිටීම සඳහා ප්‍රජාව දැනුවත් කිරීම.
- ළමුන් ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක වන ප්‍රචාරණය හා අනෙකුත් බලපෑම්වලට විරුද්ධව ක්‍රියා කරන දෙමාපිය කණ්ඩායම් හා බලපෑම් කණ්ඩායම් ඇති කිරීම.
- දුම්කොළ හා මධ්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරිම හා එම පනත ක්‍රියාත්මක කරවීමට ජනතාව බලගැන්වීම.
- එම පනත පිළිබඳ වෙළඳසැල් හිමියන් දැනුවත් කිරිම හා එම පනත ක්‍රියාත්මක කරවීමට ජනතාව බලගැන්වීම
- එම පනත පිළිබඳ වෙළඳසැල් හිමියන් දැනුවත්කර දුම්වැටි භාවිතය ප්‍රචාරණය අධෛර්යමත් කරන වෙළඳසැල් ඇති කිරිම.
  - ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සංඛ්‍යාව - 70
  - ඒ සඳහා වැය වුණු මුළු මුදල රුපියල් මිලයන - 1.3

7.1.2 සතුටු පවුල වැඩසටහන

සමාජ බැම්මේ ශක්තිය තම පවුලයි. සමාජය වඩාත් සොඳුරු තැනක් කළ හැක්කේ පවුලේ එකිනෙකා අතර සම්බන්ධතා වඩා සමීප හා මිත්‍රශීලි සහ ආකල්ප කැටි වූ ඒවා බවට පත් කිරීමෙනි.

- ගෘහ ඒකකය තුළ නිවැරදි සන්නිවේදනය දියුණු කිරිම, එකිනෙකාට ගෞරව කිරිම, පිළිගැනීම, අන් අයට සවන් දීම, ආදරය, සෙනෙහස හා සුහදතාවය වර්ධනය කර ගැනිමට මඟ පෙන්වීම.
- මනා ගෘහ කළමනාකරණය ඇති කර ගනිමින් පවුල් ඒකකය තුළ පෝෂණය, රැකවරණය හා නිදහස වර්ධනය කර ගනිමින් රසායනික පොහොර භාවිතයෙන් තොර ගෙවතු වගාව තුළින් ස්වයං පෝෂිත පවුලක් ගොඩනැඟිමට ගෘහ ඒකක යොමු කිරිම.
- නිවැරදි සෞන්දර්යාත්මක රසවින්දන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරිම හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අවබෝධය වර්ධනය කිරිමට කටයුතු කිරිම.
- ගෘහස්ථ හිංසනය අවම කිරිම සඳහා අවශ්‍ය මාර්ගෝපදේශකත්වය ලබාදීම.
  - ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සංඛ්‍යාව - 65
  - ඒ සඳහා වැය වු මුදල රුපියල් මිලියන - 1.0

7.1.3 ළමා ආරක්ෂණය හා ළමා සමාජ වැඩසටහන

අනාගත හිමිකරුවන් ලෙස සැලකෙන්නේ රටේ දරුවන්ය. එම උරුමය බාර ගැනීමටත්, ඔවුන්ගේ ලෝකය ඔප්නැංවීමටත්, කුසලතාවයන් වර්ධනය කරමින් නැණ නුවනින් හා ධෛර්යය සම්පන්න දරුවන් හදාවඩා ගත යුතුය. එසේ බලගැන්වුනු දරුවා මනා පෞරුෂයකින් හෙබි අභියෝග බාර ගත හැකි අභිමානවත් පුරවැසියෙකු ලෙස හෙට දින ලොවට ප්‍රවිශ්ඨ කරවීම මෙම වැඩසටහනේ මූලික අරමුණයි. දිවිනැගුම කැකුළු ළමා සමාජය නමින් වසමකට එක් ක්‍රියාකාරි ළමා සමාජයක් මේ වන විට පිහිටුවා ඇති අතර නැවත ප්‍රතිසංවිධාන කටයුතු කිරිම මේ වසරේ දී සිදු කරන ලදී.

මේ යටතේ ක්‍රියාත්මක කල ක්‍රියාකාරකම් පහත දැක්වේ.

- මත් උවදුරට ගොදුරුවන ඉලක්කගත කණ්ඩායම ලෙස ළමයින් එයින් මුදවාගැනීම ළමා සමාජ වැඩසටහනේ එක් අරමුණක් වේ.
- සෑම ගමකම සක්‍රීය ළමා සමාජයක් පිහිටුවීම. (නිපුන ළමා ලොවක් අත්පොතට අනුව)
- ළමා ආරක්ෂාව හා රැකවරණය පිළිබඳ මෙන්ම ළමා යුතුකම් හා අයිතිවාසිකම් පිළිබඳව දෙමාපියන් හා දරුවන් දැනුවත් කිරිම.
- ළමා හිංසනය අවම කිරිම හා ළමා ආරක්ෂාව වැඩිදියුණු කිරිම.
- සෑම ගමකම ජීවත්වන දරුවන් සඳහා සංස්කෘතික හා සෞන්දර්යාත්මක අගයන් වැඩිදියුණු කිරිම, දැනුම වැඩිදියුණු කිරිම, රස වින්දන වැඩසටහන් ආදිය ක්‍රියාත්මක කිරීම. ඒ තුළින් සංවේදී දරුවන් බිහි කිරිම.
- වසම් මට්ටමින් සිටින දරුවන්ගෙන් ළමා සමාජවලට අවම වශයෙන් 60% ක් හෝ සහභාගිත්වයක් කරා යොමු කිරිම (වයස අවුරුදු 5 – 18 අතර)
- පාසල් යන වයසේ සිටින එහෙත් පාසල් නොයන ළමුන් පාසල් ගත කිරිමට පෙළඹවීම.

දීප ව්‍යාප්තව ක්‍රියාත්මක වන මෙම ළමා සමාජ දරු දැරියන්ගේ සංස්කෘතික හා සාහිත්‍ය හැකියාවන්, ඔප්නැංවීම හා එම හැකියාවන් ජාතික තලයට ගෙන ඒම උදෙසා ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා ජාතික මට්ටමේ ඇගයීම් සඳහා තරඟාවලියක් පවත්වන ලදි. 2014 වසරේ දිස්ත්‍රික් මට්ටම දක්වා තේරීපත් වූ දරුවන් සඳහා ජාතික මට්ටමේ තරඟාවලිය 2015 ජුලි මස 12 දින මාලබේ රාහුල බාලිකා විද්‍යාලයේදී සිංහල මාධ්‍ය ළමා සමාජ දරුවන්, තරඟ ඉසව් 12 කට, වයස් කාණ්ඩ 03 ඔස්සේ තරඟවලට සහභාගි කරවන ලදි. තවද, මෙය දෙමළ මාධ්‍ය දරුදැරියන් සඳහා ද ඒ අයුරින්ම 2015 ජුලි මස 26 දින මාලබේ රාහුල බාලිකා විද්‍යාලයේ දී පවත්වන ලදි.

- ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සංඛ්‍යාව - 10
- වැය වූ මුදල රුපියල් මිලියන - 3.3

ඉහත ක්‍රියාකාරකම් සනාථ කෙරෙන ඡායාරූප කිහිපයක් පහත දැක්වේ.

7.1.4 දිරිය පියස නිවාස වැඩසටහන

අඩු ආදායම්ලාභී, නිවසක් අහිමි සෑම පවුලක් උදෙසාම නිවසක් ලබාදීම අරමුණු කරගනිමින් දිවිනැගුම වැඩසටහන තුළ ඉතා ආකර්ශණීය වැඩසටහනක් ලෙස දිරිය පියස නිවාස වැඩසටහන ක්‍රියාත්මක වේ. ඉඩමක් හිමි එහෙත් නිවසක් තනා ගැනීමට නොහැකි වී ඇති පවුල්වලට මෙම හිමිකම් ලබා දෙන ලදි. මෙහි දී විශේෂයෙන් පවුලේ සාමාජිකයන් වැඩි, එසේම පාසල් යන වයසේ ගැහැණු දරුවන් සිටින වයස්ගත දෙමාපියන් රැක බලාගන්නා පවුල් සඳහා ද ආබාධිත දෙමාපියන්, සහෝදරයන් ඇති පවුල්, ප්‍රධාන උපයන්නා මියගිය හෝ ආබාධිත වැඩිහිටි දරුවන් ඇති පවුල්, දෙමාපියන් අහිමි, භාරකරුවන් ලෙස ආච්චි හෝ සීයා ලඟ යැපෙන පාසැල් යන දරුවන් ඇති පවුල් සඳහා සහ අඩක් නිම කර වසර ගණනාවක් පසු වීත් ගොඩ නඟා ගත නොහැකි නිවාස කෙරේ වැඩි අවධානයක් යොමු කර ඇත.

මෙම වර්ෂය තුළ දී නිවාස හා සමෘද්ධි සංවර්ධන අමාත්‍යාංශය මඟින් මැතිවරණ කොට්ඨාසයකට නිවාස 15 බැගින් කොට්ඨාස 160 සඳහා නිවාස 2400ක් ඉදිකිරිම ඉලක්ක ගත කර, එක් නිවසකට රුපියල් 75,000/- ක් වන සේ රුපියල් මිලියන 187.8 ක මුදල් ප්‍රතිපාදන ලබා දෙන ලදි. ඒ යටතේ නිවාස 2504 නිවාස ඉදි කරන ලදී.

ඊට අමතරව, දිස්ත්‍රික් ලේකම් කාර්යාල මගින් නිර්දේශ කරන, අඩුආදායම්ලාභීන් විසින් ඉදිරිපත් කරන ඉල්ලීම් සඳහා ද පුවත්පත් දැන්වීම් මගින් හඳුනා ගන්නා ප්‍රතිලාභීන් සඳහාද අදාල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නිරීක්ෂණයෙන් අනතුරුව ලබා දෙන නිර්දේශයන් සඳහාද විශේෂ දිරිය පියස යටතේ මේ වසර තුළ නිවාස 511 ක් ඉදිකිරිමට හැකි වී ඇත.

ඉහත ප්‍රතිලාභය සහිතව හා ප්‍රතිලාභීදායකත්වය හා බාහිර ස්වේච්ඡා පාර්ශවයන්ගේ මැදිහත්වීමෙන් ඉදි කරන ලද නිවසක වටිනාකම රුපියල් 400,000/- හෝ 500,000/- ත් අතර වේ.

- ඉදි කළ නිවාස ප්‍රමාණය - 3015 කි.
- වැය කළ මුදල රුපියල් මිලියන - 225.9 කි.

බදුල්ල දිස්ත්‍රික්කයේ
හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ
කිතුල්ගහ අරාව වසමේ
කේ.ඇම්.සුබරත්න මැණිකේගේ නිවසේ පෙර සහ පසු තත්වය

7.2. ආදර්ශ ගම්මාන වැඩසටහන

පුද්ගල සංවර්ධනය යනු ආර්ථික, කායික, මානසික, සාමාජීය ආධ්‍යාත්මික හා පාරිසරික සංවර්ධනය යන සියළු අංශයන්ගෙන් පරිපූර්ණ සංවර්ධනයක් වෙත පුද්ගලයා මෙහෙයවීමයි. පුද්ගලයන්ගේ පවුල්වල කණ්ඩායම්වල සහ ප්‍රජාවගේ ආදායම් උත්පාදනය සඳහා සැලැසුම් කර ව්‍යාපෘති සඳහා පහසුකම් සලසමින් රැකියා අවස්ථා වැඩි කරමින් ආර්ථික සංවර්ධනය ක්‍රියාවලිය ප්‍රවර්ධනය කළ යුතු වේ. ජීවනෝපාය සංවර්ධනය කර ගත් ප්‍රජාවගේ ශුභ සිද්ධිය සඳහා හිතකර වන යුක්ති ගරුක සාමාජීය පරිසරයක් ඇති සමාජ සංවර්ධන වැඩ සටහන් යටතේ ක්‍රියාත්මක වන සියළු වැඩසටහන්වල ආදර්ශයක් ලෙස ගමක් සංවර්ධනය කිරිම මෙම ආදර්ශ ගම්මාන වැඩසටහනින් අපේක්ෂා කෙරේ. ඒ සඳහා අවශ්‍ය සාමාජීය පසුබිම ගොඩනගමින් සහභාගීත්ව ගැමි විමසුමකින් පවුල් රාශීයක් ඒකරාශී කර ගත් ගමක් නිර්මාණය කිරිම ආදර්ශ ගම්මානය පිහිටුවීමේ මූලික පියවර වේ.

2015 වර්ෂයේ මුලික වශයෙන් දිස්ත්‍රික්කයේ එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකින් සාමාජීය හා භෞතික වශයෙන් වැඩි අභියෝගවලට ලක් වු ගමක් ආදර්ශ ගම්මාන වැඩසටහන සඳහා තෝරා ගෙන ඇත. එය සාමාජීය හා භෞතික වශයෙන් සංවර්ධනය කරමින් දිස්ත්‍රික්කයේ ප්‍රධාන ආදර්ශනය ලෙස නිර්මාණය කෙරේ. ඉලක්ක ගත සංවර්ධන තත්ත්වයන් ගෙන් පරිපූර්ණ කළ ආදර්ශ ගම්මානයක් ලෙස එය සැකසිය යුතු බැවින්, 2016 හා 2017 වසරවලදී එය පූර්ණ වශයෙන් නිම කිරිමට අපේක්ෂිතය.

2015 වසරේ දී සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම එක් ආදර්ශ ගම්මානය බැවින් ගම්මාන 332 තෝරා ගෙන ඇත. ඉන් පසු 2016 වසර තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් එම ආදර්ශ ගම්මානවල මුලික කාර්යයන් ආරම්භ කිරිමට නියමිතය. මෙහි දී ජාතික මෙහෙයුම් කමිටුව, දිස්ත්‍රික් මෙහෙයුම් කමිටුව, ප්‍රාදේශීය මෙහෙයුම් කමිටුව මඟින් ආදර්ශ ගම්මානයේ මුලික කටයුතු ක්‍රියාත්මක කිරිම පිළිබඳ අධීක්ෂණය හා පසුවිපරම් සිදු කෙරේ.

මෙහි දී ආයතන, ආයතන ප්‍රධානීන්, ස්වේච්ජා සංවිධාන සහ සියළු වගකිව යුතු නිලධාරින් ගෙන් සැදුම්ලත් ඒකාබද්ධ වැඩ පිළිවෙලකට ප්‍රවිශ්ය වෙමින් සාමාජීය හා භෞතික අභියෝග සඳහා විසඳුම් සෙවීමට, සමාජ සංවර්ධන , ජීවනෝපාය, ප්‍රජාමුල, ක්ෂුද්‍ර මුල්‍ය හා අලෙවි යන අංශවල ඒකාබද්ධ දායකත්වය මෙහි ක්‍රියාත්මක ක්‍රමවේදය වේ.

- ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සංඛ්‍යාව - 300
- වැය වු මුදල රුපියල් මිලියන - 2.25

7.3 ජාත්‍යන්තර දින සැමරීමේ වැඩසටහන්

7.3.1 ජාත්‍යන්තර කාන්තා දිනය (මාර්තු 08)

ආධ්‍යාත්මික ගුණ වගාවෙන් සපිරි සමෘද්ධිමත් හා ගුණ ගරුක සමාජයක් ගොඩනැගීම සඳහා යහපත් පවුල් පරිසරයක් නිර්මාණය කිරිමේ දී කාන්තාවන්ගේ කාර්යභාරය ඉතා විශාලය. එමෙන්ම, සමාජයේ යහපැවැත්ම සඳහා කාන්තා නායකත්වයේ ඇති වැදගත්කම යළි අවධාරණය කර ගැනීමේ කාලීන අවශ්‍යතාවයක් විය. එබැවින්, 2015 වර්ෂයේ දී ඔවුන්ගේ දායකත්වය සක්‍රීය කරමින් ඒ සඳහා දිවිනැගුම වැඩසටහන වටා ඒකරාශී වී ඇති අඩුආදායම්ලාභී කාන්තාවන්ගේ දායකත්වය ලබා ගැනීමත්, දැනට සවිබල ගැන්වී ඇති කාන්තාවන් ඇගයීමත් සිදු කරන ලදි.

මේ සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට සමාජ සංවර්ධන පදනමේ අරමුදලින් රුපියල් 10,000/- බැගින් ලබා දෙන ලදි.

- ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සංඛ්‍යාව - 290
- වැය වූ මුදල රුපියල් මිලියන - 61

7.3.2 ජාත්‍යන්තර දුම්වැටි විරෝධී දිනය - මැයි 31

අඩුආදායම්ලාභී ප්‍රජාවගේ එම තත්වයට බලපාන ප්‍රධාන හේතුව ඔවුනට ලැබෙන සම්පත්වල හිඟයම පමණක් නොව, ඉන් ඔබ්බට ගිය විවිධ සමාජ විරෝධී ක්‍රියාකාරම්වල යෙදෙමින්, පවතින සම්පත් ද විනාශ කිරීම බව පෙනී යන කරුණකි. මෙවැනි පිරිස් මත් ද්‍රව්‍ය හා දුම්වැටි භාවිතා කිරීම හේතුකොටගෙන ඔවුන්ගේ ආදායමෙන් සැලකියයුතු කොටසක් නිරපරාදේ විනාශ වේ.

ජාත්‍යන්තර දුම්වැටි විරෝධී දිනයේ අරමුණ වනුයේ, විනාශකාරි ප්‍රතිවිපාක සෞඛ්‍ය වෙතින් පමණක් නොව දුම්වැටි භාවිතය හා එයින් නිරාවරණය වන දුම්වලින් සිදුවන සමාජ හා පාරිසරික හානියටත් ආර්ථික පරිහානියටත් එරෙහිවීම හා වර්තමාන අනාගත පරම්පරාව ඒවායින් ආරක්ෂා කිරිමට දායකවීමත්ය.

එබැවින්, 1996 වර්ෂයේ සිට මේ දක්වා සෑම වර්ෂයකම මැයි 31 දුම්වැටි විරෝධී දිනය, තේමා කොට ගෙන සෑම වසරක් පාසාම කොඩි අලෙවි වැඩසටහන් ක්‍රියාත්මක වේ. මීට අමතරව, දුම්වැටියට වැයවන මුදල් රටේ සංවර්ධනයට යොමු කිරිම උදෙසා ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් විවිධ සුවිශේෂී වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

20 වන වරටත් 2015 වර්ෂයේ දුම්වැටි විරෝධී දිනය නිමිත්තෙන් "මතින් තොර විනය, ඕනෑමයි රටකට හැමදාම" යන්න තේමා කොටගෙන මුද්‍රණය කළ කොඩි, ස්ටිකර් දිවයින පුරා බෙදා හැරීමට කටයුතු කළ අතර, මේ වෙනුවෙන් ජාතික පදනමෙන් වැය වූ මුදල රුපියල් මිලියන 3.34 කි. අවුරුදු 20 පුරාවට ලබා ගත් ඉහළම ආදායම වාර්තා කරමින්, මෙවර කොඩි අලෙවි ආදායම ලෙස රුපියල් මිලියන 129.45 ක වාර්තා ගත ආදායමක් ලබා ගැනිමට සමත් විය.

මෙවර මුද්‍රණය කළ කොඩිය සහ ස්ටිකරය

1996 වර්ෂයේ සිට මෙම කොඩි වැඩසටහන ක්‍රියාත්මක වූ අතර වර්තමානය වන විට ඒ තුළින් ලැබූ ආදායම



මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

වගුව - 11 කොඩි අලෙවි ආදායම (2010 – 2015)

වර්ෂය	කොඩි ආදායම රු.මි.
2010	79.3
2011	86.3
2012	123.5
2013	124.7
2014	90.0
2015	129.45

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

7.3.3 සමාජ සංවර්ධන පදනම

ජාත්‍යන්තර දුම්වැටි විරෝධී දිනයේ දී උපයන ලද කොඩි ආදායම් තැන්පත් කරමින් සියළුම ප්‍රාදේශීය මට්ටම්වලින් ස්ථාපිත කර ඇති සමාජ සංවර්ධන පදනමේ අරමුදලක් ඇත. මෙම අරමුදලේ මුදල් භාවිතයෙන් එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සමාජ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ අනුව, 2015 වර්ෂයේ සමාජ සංවර්ධන පදනම් වලින් දිවයින පුරා ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් පහත දක්වා ඇත. ඒ අනුව, රුපියල් මිලියන 108 ක් ඉක්මවා මුදලක් යොදවා දීප ව්‍යාප්තව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

වගුව - 12 සමාජ සංවර්ධන පදනමේ අරමුදල් වලින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්වල ප්‍රගතිය

අනු අංකය	ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්	වැඩසටහන් සංඛ්‍යාව	මුදල රු.
01	මත්නිවාරණ වැඩසටහන	1953	6,175,652.00
02	ළමා ආරක්ෂණ හා සුභ සාධන	4868	12,253,525.00
03	සිසු දිරිය ශිෂ්‍යත්ව	7602	15,980,251.00
04	පාසල් නොයන දරුවන් පාසල් ගත කිරීම්	1219	1,788,5000.00
05	පාසල් යන දරුවන්ට පාසැල් උපකරණ ලබාදීම	3348	5,617,582.00
06	සතුටු පවුල වැඩසටහන	1138	1,042,000.00
07	ආදර්ශ ගම්මාන වැඩසටහන	179	583,000.00
08	ආබාධිත සුභ සාධන වැඩසටහන්	559	2,266,800.00
09	සංස්කෘතික හා ආධ්‍යාත්මික සංවර්ධන වැඩසහටන්	2196	6,682,160.00

අනු අංකය	ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්	වැඩසටහන් සංඛ්‍යාව	මුදල රු.
10	නිවාස අළුත් වැඩිය කිරීම්	795	14,367,583.00
11	නිවාස ඉදිකිරීම්	288	14,419,175.00
12	සනීපාරක්ෂක වැඩසටහන්	1929	12,597,360.00
13	ජාත්‍යන්තර දින සැමරීම්	2064	7,189,921.00
14	වෙනත් වැඩසටහන්	1148	6,141,353.00
මුළු එකතුව		29286	108,104,862.00

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

7.3.4 ජාත්‍යන්තර සාක්ෂරතා දිනය - සැප්තැම්බර් 08

අඩු ආදායම්ලාභී ප්‍රජාවගෙන් බහුතරය වතුකරයේ හා නාගරික පැල්පත් ප්‍රදේශවල ජීවිකාව ගෙවන්නේය. ඔවුන්ගේ පාසල් යායුතු වයසේ සිටින එහෙත්, පවුලේ අගහිඟකම් මත පාසල් නොයන දරුවන් බහුලය. අකුරු ලිවීමට කියවීමට නොහැකි වයස අවුරුදු 5 – 14 ළමුන් විධිමත් පාසල්වලට ඇතුළත් කිරිම, සාක්ෂරතා මට්ටම ඉහළ නැංවීම හා වෙනත් වෘත්තීන් සඳහා යොමු කිරිම මෙම වැඩසටහන යටතේ සිදු කර ඇත.

මෙවර 2015 වර්ෂයේ දී, දීප ව්‍යාප්තව ශිෂ්‍යත්ව වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. වසමකට එක් ශිෂ්‍යත්වය බැගින් ශිෂ්‍යත්ව 14,100 ඉලක්ක කොට ගනිමින් මේ වසරේ කැපකරු ක්‍රමය යටතේ වැඩි ශිෂ්‍යත්ව ප්‍රමාණයක් ලබාදීමට ආදර්ශයක් ලෙස දිස්ත්‍රික්ක 25 ආවරණය වන පරිද්දෙන් දරුවන් 100 දෙනෙකු කොළඹට කැඳවා කැපකරුවන් 100 දෙනෙකුගේ භාරකාරීත්වය හඳුන්වා දෙමින් ශිෂ්‍යත්ව ප්‍රධානෝත්සවයක් ජාත්‍යන්තර සාක්ෂරතා දිනයට සමගාමීව පවත්වන ලදී.

- පාසල් ගත කළ සංඛ්‍යාව - 1150
- ශිෂ්‍යත්ව සංඛ්‍යාව - 13554
- වැය වූ මුළු මුදල රුපියල් මිලියන - 0.29

7.4. විශේෂ වැඩසටහන්

7.4.1 පුහුණු

මෙම කාර්යයන් දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන වැඩසටහන් හා බද්ධව ක්‍රියාත්මක කරන ලදි. මේ යටතේ සමාජ සංවර්ධන වැඩසටහන, මත්ද්‍රව්‍ය නිවාරණය, සතුටු පවුල වැඩසටහන්, ළමා අපයෝජන වැලැක්වීම, සියදිවිහානි වැලැක්වීම, දිරිය පියස නිවාස වැඩසටහන, ආදර්ශ ගම්මාන , ජාත්‍යන්තර දින යන ප්‍රධාන විෂයයන් යටතේ මෙම පුහුණු කිරීම් සිදු කරන ලදි.

7.4.2 ප්‍රගති සමාලෝචනය

මෙය අදියර 2 කින් පවත්වනු ලැබේ.

- ❖ දිස්ත්‍රික් මට්ටමින්
- ❖ ජාතික මට්ටමින්

දිස්ත්‍රික් මට්ටමේ ප්‍රගති සමාලෝචනය

මෙය මාස 03 කට එකක් වනසේ දිස්ත්‍රික් ලේකම් , දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂ, දිස්ත්‍රික් විෂය කළමණාකරු, මුලස්ථාන කළමණාකරු, කළමණාකරු අධ්‍යක්ෂ, කලාප කළමණාකරුවන් හා සමාජ සංවර්ධන සහකාරවරුන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදි. මේ සඳහා ප්‍රතිපාදන සමාජ සංවර්ධන අංශයෙන් නිදහස් කරන ලදි. 2015 වර්ෂයේ වැඩසටහන් 70ක් පවත්වා ඇත.

ජාතික මට්ටමේ ප්‍රගති සමාලෝචනය

මෙය ද මාස 03ට වරක් වන සේ දිස්ත්‍රික් සමාජ සංවර්ධන කළමණාකරුවන්, කොළඹට කැඳවා ප්‍රගති සමාලෝචන වැඩසටහන් කරනු ලැබේ. 2015 වර්ෂයේ වැඩසටහන් 63 ක් පවත්වා ඇත.

- ➢ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් - 70
- ➢ වැය වු මුදල රුපියල් මිලියන - 0.32

08. ප්‍රජාමූල සංවිධාන අංශයේ කාර්යසාධනය

මානව හා භෞතික සම්පත් ශක්තිමත් කිරීමේ පුද්ගලයා, පවුල හා ප්‍රජාව තුල සමාජීය හා ආර්ථික තත්ත්වය නඟාසිටුවීමට දැනුම, ආකල්ප හා කුසලතාවයන් වර්ධනය කර ප්‍රජාමූල සංවිධාන ප්‍රාදේශිය සංවිධාන හා දිස්ත්‍රික් කමිටු හරහා ප්‍රජාව සවිබල ගැන්වීම.

ප්‍රජාව ආර්ථික සමාජිය හා අධ්‍යාත්මික වශයෙන් සවිබලගැන්වීම උදෙසා දිවිනැගුම සංවර්ධන වැඩපිළිවෙල යටතේ ප්‍රජාමූල සංවිධාන අංශය පිහිටුවීමට කටයුතු යොදා ඇත.

ඒ අනුව 2013 අංක 01 දරන දිවිනැගුම පනතේ විධිවිධාන තුලින් ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේලා දිළිඳුකම තුරන් කිරීමත්, සමාජ සාධාරණත්වය සහතික කිරීමත් ජාතික ප්‍රතිපත්තිය බලාත්මක කිරීම පිණිස පුද්ගලයා, පවුල, කණ්ඩායම් සහ ප්‍රජාව කේන්ද්‍ර කර ගනිමින් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත් අරමුණු කොට ඇත. සෑම සංවර්ධන වැඩසටහනක්ම ප්‍රජාව මූලික කරගතයුතු බව දිවිනැගුම පනතේ 09 වන වගන්තිය යටතේ පැහැදිලි කර ඇත. ඒ අනුව එක් එක් ග්‍රාම නිලධාරි කොට්ඨාශයක් සඳහා හෝ ග්‍රාම නිලධාරී කොට්ඨාශයක යම් කොටසක් සඳහා හෝ ග්‍රාම නිලධාරී කොට්ඨාශ කිහිපයක් සඳහා දිවිනැගුම ප්‍රජාමූල සංවිධාන පිහිටවනු ලැබිය යුතුය.

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ මෙම අංශයේ කාර්යභාරය දියත් කිරීම සඳහා ප්‍රජාව සම්බන්ධවන පහලම සංවිධානාත්මක ඒකකය ප්‍රජාමූල සංවිධානයයි. දිවිනැගුම ප්‍රජාමූල සංවිධානයක් යනු දිවිනැගුම පනතින් යෝජිත මෙහෙයුම් ක්‍රියාවලියේදී ප්‍රජාව සම්බන්ධවන ග්‍රාමීය මට්ටමේ සංවිධානයකි. මෙම ඒකකය පදනම් කොටගෙන දිවිනැගුම ප්‍රාදේශිය සංවිධාන , දිවිනැගුම දිස්ත්‍රික් කමිටු සහ දිවිනැගුම ජාතික සම්මේලනය යනාදී වශයෙන් සමස්ථ සංවිධාන ව්‍යුහය ගොඩනැගෙනු ඇත.

දිවිනැගුම පනතට අනුව දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ඉටුකළ යුතු සියලු සංවර්ධන කාර්යයන් ප්‍රජාව සම්බන්ධවන පහලම සංවිධානාත්මක ඒකකය වන ප්‍රජාමූල සංවිධාන මූලික කොට ගෙන ප්‍රජාවගේ පූර්ණ සහභාගිත්වයෙන් ඉටුකළ යුතු වේ. ප්‍රජාමූල සංවිධාන පිහිටුවීමත් ඒ සමගාමීව ප්‍රාදේශිය සංවිධාන හා දිස්ත්‍රික් කමිටුද පිහිටුවා පවත්වා ගෙන යා යුතුය.

මෙම සියලු සංවිධාන පිහිටුවා යාවත්කාලීන කිරීම , පවත්වාගෙන යාම හා කලමනාකරණය කිරීම මෙන්ම එම සංවිධාන වල සියලු කටයුතු අධීක්ෂණය කිරීම ප්‍රජාමූල සංවිධාන අංශය මගින් සිදුකරනු ඇත.

8.1 ප්‍රජාමූල සංවිධාන අංශයේ කාර්ය භාරය

දිවිනැගුම ප්‍රජාමූල සංවිධාන ශක්තිමත් කිරීම උදෙසා ප්‍රජාමූල සංවිධාන අංශය මගින් 2015 වර්ෂය තුලදී ප්‍රජාමූල සංවිධානය, ප්‍රාදේශිය සංවිධානය හා දිස්ත්‍රික් කමිටු සඳහා නීතිඥයෙකුගේ නීති උපදෙස් ලබා ගනිමින් ව්‍යවස්ථා තුනක් සහ නියෝග කෙටුම්පත් කිරීම සිදුකර ඇත.

දිවිනැගුම ප්‍රජාමූල සංවිධාන ගොඩනැංවීම සහ පවතින ප්‍රජාමූල සංවිධාන ශක්තිමත් කිරීම සඳහා පුහුණුකරුවන් කණ්ඩායමක් තෝරාගෙන ඔවුන් සඳහා පුහුණුව ලබාදීමෙන් අනතුරුව එම පුහුණුකරුවන් කණ්ඩායම හරහා දිස්ත්‍රික් හා ප්‍රාදේශිය වශයෙන් සිටින නිලධාරින් සහ ප්‍රජාව දැනුවත් කිරීමට කටයුතු කරන ලදි. පුහුණුකරුවන් කණ්ඩායම සඳහා එක් දිස්ත්‍රික්කයකින් දිවිනැගුම කලමණාකරුවන් 5 දෙනෙකු බැගින් වනසේ සිංහල හා ද්‍රවිඩ මාධ්‍ය නිලධාරින් දිස්ත්‍රික් මට්ටමින් තෝරාගෙන දින දෙකක පුහුණු වැඩසටහන් 3ක් සංවිධානය කර පවත්වන ලදී. සිංහල මාධ්‍යය වැඩසටහන් 2ක් හා ද්‍රවිඩ මාධ්‍යය 1 ක් වශයෙන් මෙම වැඩසටහන් තුන සාර්ථකව අවසන් කරන ලදි.

මෙමගින් පුහුණුවලත් නිලධාරින් මගින් දිස්ත්‍රික් සහ ප්‍රාදේශියව සිටින සියලු දිවිනැගුම කලමණාකරුවන්, සංවර්ධන නිලධාරින් හා ප්‍රජාව දැනුවත්කිරීමේ වැඩසටහන් 500ක් දීපව්‍යාප්තව සංවිධානය කර සියලුම දිස්ත්‍රික්ක වල පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට දිස්ත්‍රික් සඳහා ප්‍රතිපාදන නිදහස් කිරීමට කටයුතු කරන ලදි. මෙහි මූලික අරමුණ වූයේ අකාර්යක්ෂමව පවතින ප්‍රජාමූල සංවිධාන කාර්යක්ෂම කිරීමත් නව ප්‍රජාමූල සංවිධාන ශක්තිමත්ව ගොඩනැගීමත් ඒ මගින් ග්‍රාමීය මට්ටමින් ක්‍රියාත්මක වන සමාජ ආර්ථික සංවර්ධන කටයුතු ප්‍රජාමූල සංවිධාන මගින් ක්‍රියාත්මක කරමින් ප්‍රාදේශිය, දිස්ත්‍රික් සහ ජාතික මට්ටම දක්වා සාර්ථකව ක්‍රියාත්මක කිරීමත්ය.

මෙම වැඩසටහන්වල විස්තර පහත දක්වා ඇත.

වගුව - 13 ප්‍රජාමූල සංවිධානවැඩසටහන්වලප්‍රගතිය

අංකය	වැඩසටහන	වැඩසටහන් සංඛ්‍යාව	වියදම (රු.)
01.	ව්‍යවස්ථා කෙටුම්පත් කිරීමේ වැඩසටහන	06	18,476.50
	පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන සිංහල මාධ්‍යය - 89 ද්‍රවිඩ මාධ්‍යය - 50	03	533,652.50
03.	දිස්ත්‍රික් සහ ප්‍රාදේශිය මට්ටමේ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	116	3,203,878.00
එකතුව		**125**	**රු.3,756,007.00**

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

වගුව - 14 දිවිනැගුම ප්‍රජාමූල සංවිධාන - දිස්ත්‍රික් පුහුණු වැඩසටහන සඳහා ප්‍රතිපාදන වැය කිරීම - 2015

අ. අ.	දිස්ත්‍රික්කය	ප්‍රතිපාදන වෙන් කළ ප්‍රමාණය (රු)	ප්‍රතිපාදන වැය වූ ප්‍රමාණය (රු)
1	කොළඹ	606,100.00	-
2	කළුතර	797,500.00	-
3	ගම්පහ	1,180,300.00	65,100.00
4	ගාල්ල	988,900.00	-
5	මාතර	797,500.00	-
6	හම්බන්තොට	638,000.00	-
7	මහනුවර	1,276,000.00	-
8	මාතලේ	606,100.00	-
9	නුවරඑළිය	542,300.00	-
10	කුරුණෑගල	1,722,600.00	-
11	පුත්තලම	606,100.00	196,485.00
12	අනුරාධපුර	765,600.00	-
13	පොළොන්නරුව	319,000.00	-
14	බදුල්ල	701,800.00	-
15	මොණරාගල	414,700.00	-
16	රත්නපුර	765,600.00	-
17	කෑගල්ල	669,900.00	-
18	අම්පාර	638,000.00	-
19	ත්‍රිකුණාමලය	287,100.00	277,663.50
20	මඩකලපුව	446,600.00	379,193.00
21	වව්නියා	159,500.00	159,000.00
22	යාපනය	542,300.00	388,691.50
23	මන්නාරම	191,400.00	163,310.00
24	මුලතිව්	159,500.00	-
25	කිලිනොච්චිය	127,600.00	-
	මුළු එකතුව	**15,950,000.00**	**1,629,443.00**

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

09. ජීවනෝපාය සංවර්ධන අංශයේ කාර්යසාධනය

කෘෂිකර්ම, සත්ව පාලන, ධිවර සහ කර්මාන්ත යන ක්ෂේත්‍ර වල නිෂ්පාදිතය ඉහළ දැමීම සහ නව රැකියා උත්පාදනය තුලින්, දිවිනැගුම (සමෘද්ධි) ප්‍රතිලාභි හා අඩු අදායම්ලාභි ප්‍රජාවගේ ජීවන තත්වය ඉහල නැංවීම.

අඩු ආදායම්ලාභි පවුල්වල ආදායම් මට්ටම ඉහළ නැංවීම, සෞඛ්‍ය හා පෝෂණ මට්ටම උසස් කිරීම මෙන්ම රැකියා වෙළඳපලට උචිත පුහුණු ශ්‍රමිකයන් සැපයීම සඳහා වෘත්තීය පුහුණුව ලබා දීම අරමුණු කර ගනිමින් 2015 ජීවනෝපාය සංවර්ධන වැඩසටහන දියත් කරන ලදි.

2015 වර්ෂය දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවට තීරණාත්මක වර්ෂයක් වූ අතර, දෙපාර්තමේන්තු අණපනත්, චක්‍රලේඛ රෙගුලාසි වලට අනුකූලව ඊට හැඩගැසෙමින් සංවර්ධන කාර්යයන් ක්‍රියාත්මක කළ යුතු වීමත් වර්ෂය ආරම්භයේ සිටම ජනාධිපතිවරණයක් හා අනතුරුව මහා මැතිවරණයක් පැවැතීමත් නිසා රාජ්‍ය ප්‍රතිපත්තීන් වල සිදුවූ යම් යම් වෙනස්වීම්ද සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක විමේදි බලපාන ලදි.

ඒ අනුව දිවිනැගුම සංවර්ධන දෙපාර්තමෙන්තුව විසින් ජීවනෝපාය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා රු.මි. 1015 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් මෙම අංශය වෙත ලබා දුන් අතර, නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය (2015 සැප්තැම්බර් මාසයෙන් පසුව සමාජ සවිබල ගැන්විම හා සුභසාධන අමාත්‍යාංශය) විසින් දුප්පත්කම දුරලීමේ වැඩසටහන සඳහා හා ජීවනෝපාය චක්‍රීය ණය වැඩසටහන සඳහා ලබා දුන් රු.මි. 1165.8 ක්ද ඇතුළුව ලැබුණු මුළු ප්‍රතිපාදන ප්‍රමාණය පහත පරිදි රු.මි. 2180.8 ක් විය.

1.	ජීවනෝපාය සංවර්ධන වැඩසටහන	රු.මි.	1015.00
2.	දුප්පත්කම දුරලීමේ වැඩසටහන	රු.මි.	688.80
3.	ජීවනෝපාය චක්‍රිය ණය වැඩසටහන	රු.මි.	477.00
	මුළු ප්‍රතිපාදන ප්‍රමාණය	**රු.මි.**	**2180.80**

කෙසේවුවද, මෙම සියළු ප්‍රතිපාදන ව්‍යාපෘති ගැන්වීමේදී යහපාලන සමාජයක් යන නව රජයේ දැක්ම තේමාව කර ගනිමින්

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව විසින්ද ඒ ඒ දිස්ත්‍රික්කයන්හි දරිද්‍රතා දර්ශකයත්, සමෘද්ධි ප්‍රතිලාභී සංඛ්‍යාවත් පාදක කර ගනිමින් පහත පරිදි ප්‍රතිලාභින් 149,036 දෙනෙකුගේ ජීවනෝපාය වර්ධනය සඳහා ව්‍යාපෘති සහන ලබා දීමට කටයුතු කරනු ලැබිණි.

වගුව - 15 2015 ක්‍රියාත්මක වැඩසටහන යටතේ සමස්ත ප්‍රගතිය

අ.අ.	වැඩසටහන/වැය ශිර්ෂය	වෙන්කළ ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි.)	නිමි ව්‍යාපෘති ගණන	වැයකළ මුදල (රු.මි.)	චක්‍රිය ණය අරමුදලේ /ප්‍රතිලාභි දායකත්වය (රු.මි.)	ප්‍රතිලාභින් සංඛ්‍යාව
01	ජීවනෝපාය සංවර්ධන වැඩසටහන	1015.00	43,924	846.49	507.04	119,076
02	දුප්පත්කම දුරලීමේ වැඩසටහන (අමාත්‍යාංශ ප්‍රතිපාදන)	688.80	21,296	571.00	137.78	21,299
03	ජීවනෝපාය චක්‍රිය ණය වැඩසටහන (අමාත්‍යාංශ ප්‍රතිපාදන)	477.00	8661	473.22	-	8,661
	එකතුව	2180.8	73,881	1890.71	644.82	149,036

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

ප්‍රස්ථාරය - 04

2015 ක්‍රියාත්මක වැඩසටහන යටතේ සමස්ත ප්‍රගතිය



මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

ඉහත සඳහන් ප්‍රතිපාදන උපයෝගි කර ගෙන පහත සඳහන් අංශයන් යටතේ ජීවනෝපාය සංවර්ධනයට අදාල ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරන ලදි.

1. කෘෂිකර්ම සංවර්ධන
2. සත්ත්ව පාලන සංවර්ධන
3. ධීවර සංවර්ධන
4. සුළු පරිමාන ව්‍යවසාය සංවර්ධන
5. අලෙවි සංවර්ධන
6. රැකියා ඉලක්ක කරගත් වෘත්තීය පුහුණුව

මෙම ජීවනෝපාය වැඩසටහන යටතේ උක්ත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිමේදි ආර්ථික දායකත්වයක් ලබා දීය නොහැකි දිගු කාලීන රෝග වලින් පෙලෙන අඩු ආදායම්ලාභින්ගේ සිට සතුටුදායක ආදායම් මට්ටමක සිටින අඩු ආදායම්ලාභින් දක්වා වු පුළුල් වපසරියක් වෙත අවධානය යොමු කරන ලදි.

ඒ අනුව 86.73% ක සමස්ථ මූල්‍ය ප්‍රගතියක් අත්කර ගනිමින් ප්‍රතිලාභීන් ව්‍යාපෘති ගන්වන ලද ආකාරය පහත දැක්වේ.

වගුව - 16 ව්‍යාපෘති නිර්ණායකයන්ට අනුව ජීවනෝපාය වැඩසටහනේ විහිදීම

නිර්ණායකයන්		ලබා දුන් ව්‍යාපෘති සංඛ්‍යාව	වැය කළ මුදල (රු.)	ප්‍රතිලාභී සංඛ්‍යාව
A ආබාධිත, වැන්දඹු, වයස්තගත මෙන්ම වකුගඩු, පිළිකා වැනි දිගුකාලීන රෝගවලින් පෙලෙන හා දිවිනැගුම්ලාභීන් සඳහා	අදාල ව්‍යාපෘති වියදමෙන් 90% ක ප්‍රදානයක් ලබා දීම හා එයට 10% ක දායකත්වයක් ප්‍රතිලාභියා දැරීම	28,922	844.74	104,179
B ආර්ථික හා සමාජීය වශයෙන් අවාසි සහගත තත්ත්වයට පත්ව ඇති අඩු ආදායම්ලාභීන් හා එම අඩුආදායම්ලාභීන්ගේ තරුණ දූදරුවන් දෙස්විදෙස් රැකියා ඉල්ලුමට සුදුසු පරිදි සවිබල ගැන්වීම සඳහා	අදාල ව්‍යාපෘති වියදමෙන් 40% ක ප්‍රදානයක් ලබා දීම හා 10% ක ප්‍රජාදායකත්වයක් සහිතව හෝ චක්‍රීය අරමුදලින් 60% ක ණයක් ලබාදීම	36,209	570.57	36,107
නිර්ණායකයන්	**ලබා දුන් ව්‍යාපෘති සංඛ්‍යාව**	**වැය කළ මුදල (රු.)**	**ප්‍රතිලාභී සංඛ්‍යාව**	
C ගෙවීමට හැකියාවක් ඇති අඩු ආදායම්ලාභීන් සඳහා	අදාල ව්‍යාපෘති වියදමෙන් 50% ක් චක්‍රීය අරමුදලින් දැරීම හා ඉතිරි 50% ප්‍රතිලාභියා විසින් දැරීම හෝ එම 50% සඳහා ප්‍රතිපාදන ලබා දී මුළු මුදලම අයකිරීම	89	2.18	89
D **දිවිනැගුම සහනාධාරලාභීන් හා අඩු ආදායම්ලාභීන් සඳහා**	100% ක ණය මුදලක් ලබා දී සහන කාලයකින් පසුව 5% වාර්ෂික පොළියක් සහිතව නැවත අයකිරීම	8,661	473.22	8,661
එකතුව		**73,881**	**1890.71**	**149,036**

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

වෙන්වූ භාණ්ඩාගාර ප්‍රතිපාදන යොදා ගනිමින් උපරිම ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් ඉලක්ක කර ගනිමින් මෙම වැඩසටහන සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා දිවිනැගුම බැංකු සංගම් මට්ටමින්ගොඩනැගී ඇති ජීවනෝපාය චක්‍රිය අරමුදල් ණය මඟින් ලබා දුන් ශක්තිමත් පිටුවහල මෙහිලා විශේෂයෙන් සඳහන් කල යුතුය.

9.1 දිවිනැගුම ජීවනෝපාය සංවර්ධන වැඩසටහන

දිවිනැගුම සංවර්ධන වැඩසටහන් සඳහා දෙපාර්තමේන්තුව වෙත ලැබුණු රු.මි. 1200.00 න් රු.මි. 1015.00 ක්ම ජීවනෝපාය සංවර්ධන අංශයට වෙන්වූ අතර පහත පරිදි ඒ ඒ වැඩසටහන් යටතේ ජීවනෝපාය ව්‍යාපාතීන් හා ජීවනෝපාය සංවර්ධනයට ඉවහල් වන්නාවූ ව්‍යාපාතීන් ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබිණි.

වගුව - 17 ජීවනෝපාය සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය

වැඩසටහන	*වෙන් කළ ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි.)*	*නිමකළ ව්‍යාපෘති සංඛ්‍යාව*	*වැයකළ මුදල (රු.මි.)*	*ප්‍රතිලාභී / චක්‍රිය අරමුදලේ දායකත්වය*	*ප්‍රතිලාභී පවුල් සංඛ්‍යාව*
1.1 ජීවනෝපාය සංවර්ධනය	706.59	35,481	601.03	482.52	35,379
1.2 විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම	173.94	2,230	132.19	13.22	77,484
1.3 2014 අතැති බිල්පත් පියවීම	134.47	6,213	113.27	11.30	6,213
එකතුව	**1015.00**	**43,924**	**846.49**	**507.04**	**119,076**

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

9.2 ජීවනෝපාය සංවර්ධන වැඩසටහන

ඉහත සටහනේ සඳහන් ජීවනෝපාය සංවර්ධන වැඩසටහන සඳහා වෙන් කරන ලද රු.මි. 706.59 ක මුදල ඒ ඒ දිස්ත්‍රික්කයන්හි දරිද්‍රතාවයෙන් පෙළෙන ජන සංඛ්‍යාව හා දිවිනැගුම සහනාධාරලාභීන් සංඛ්‍යාව පදනම් කරගෙන දිස්ත්‍රික්ක වෙත වෙන් කරන ලද අතර, දිස්ත්‍රික්කයන් වෙතින් ඉදිරිපත් වන ව්‍යාපෘති යෝජනාවන්ට අනුව මුදල් අග්‍රිම ලබා දෙන ලදි.

මේ අනුව එක් ව්‍යාපෘතියක් සඳහා ව්‍යාපෘති ඇස්තමේන්තු මුදලින් රු. 75,000/- ක උපරිමයක් දක්වා වූ මුදලක් ලබා දීමේ හැකියාව පැවති අතර, එහිදි පහත පරිදි ව්‍යාපෘති නිර්ණායකයන්ට අනුව ප්‍රතිලාභී දායකත්වයද ජීවනෝපාය චක්‍රිය අරමුදල් හරහා ණයද ලබා ගනිමින් සංවර්ධන යෝජනා ක්‍රියාත්මක කිරිමට කටයුතු කරනු ලැබිණි.

ඒ අනුව ඒ ඒ දිස්ත්‍රික්කයන්ගේ දරිද්‍රතා දර්ශකයත් දිළිඳු ජන සංඛ්‍යාවත් ගැලපීමේදී පිළිවෙළින් කුරුණෑගල, රත්නපුර, මඩකලපුව හා ගාල්ල යන දිස්ත්‍රික්ක වෙත වැඩි ප්‍රතිලාභ අත්කර දීමට හැකියාව ලැබුණු බව ඇමුණුම් අංක 01 හි දත්තයන් පෙන්වා දෙනු ලබයි. එමෙන්ම පහත පරිද්දෙන් ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ ඒ ඒ අංශයන් ඔස්සේ නිම කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව, වැයකළ මුදල හා ප්‍රතිලාභීන් සංඛ්‍යාව පෙන්වා දිය හැකිය.

වගුව - 18 නිර්ණායකයන්ට අනුව ව්‍යාපෘති විහිදීම වගුව 18

ව්‍යාපෘති වර්ගය	*90% ක ප්‍රදානයක් ලබාදුන් ව්‍යාපෘති* - **A**		*40% ප්‍රදානයක්, 10% ප්‍රතිලාභි දායකත්වය හා 50% චක්‍රීය අරමුදලින්* - **B**		*ආපසු අයකිරීම යටතේ 50% ක ප්‍රතිපාදන ලබා දීම හා ඉතිරි ප්‍රතිපාදන ප්‍රතිලාභියා දැරීම* - **C**	
	නිමකළ ව්‍යාපෘති සංඛ්‍යාව	වැයකළ මුදල (රු.මි.)	නිමකළ ව්‍යාපෘති සංඛ්‍යාව	වැයකළ මුදල (රු.මි.)	නිමකළ ව්‍යාපෘති සංඛ්‍යාව	වැයකළ මුදල (රු.මි.)
කෘෂිකර්ම සංවර්ධන ව්‍යාපෘති	1,533	30.85	8,691	94.47	29	0.49
සත්ත්ව පාලන ව්‍යාපාති	773	24.86	2,587	49.56	3	0.09
ව්‍යාපෘති වර්ගය	*90% ක ප්‍රදානයක් ලබාදුන් ව්‍යාපෘති* - **A**	*40% ප්‍රදානයක්, 10% ප්‍රතිලාභි දායකත්වය හා 50% චක්‍රීය අරමුදලින්* - **B**	*ආපසු අයකිරීම යටතේ 50% ක ප්‍රතිපාදන ලබා දීම හා ඉතිරි ප්‍රතිපාදන ප්‍රතිලාභියා දැරීම* - **C**			
	නිමකළ ව්‍යාපෘති සංඛ්‍යාව	වැයකළ මුදල (රු.මි.)	නිමකළ ව්‍යාපෘති සංඛ්‍යාව	වැයකළ මුදල (රු.මි.)	නිමකළ ව්‍යාපෘති සංඛ්‍යාව	වැයකළ මුදල (රු.මි.)
ධීවර සංවර්ධන ව්‍යාපෘති	106	3.75	576	11.02	3	0.08
සුළු පරිමාණ ව්‍යවසායකත්ව සංවර්ධන ව්‍යාපාති	2,563	70.21	14,788	251.72	40	1.15
අලෙවි සංවර්ධන ව්‍යාපාති	381	10.47	3,111	45.18	14	0.37
රැකියා ඉලක්කගත වෘත්තීය පුහුණු ව්‍යාපෘති	40	1.59	243	5.26		
එකතුව	**5,396**	**141.73**	**29,996**	**457.2**	**89**	**2.18**

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

ප්‍රස්ථාරය - 05

නිර්ණායකයන්ට අනුව ව්‍යාපෘති විහිදීම



මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

ව්‍යාපෘති සඳහා ප්‍රතිලාභි දායකත්වයද තහවුරුවීම මඟින් සාර්ථක හා විභවතාවයෙන් ඉහළ ව්‍යාපෘති සඳහා ප්‍රතිලාභ සැලසුණු බව මේ අනුව පෙන්වා දිය හැකිය.

විශේෂ ව්‍යාපෘති සංවර්ධන වැඩසටහන

ස්වභාවික උපද්‍රව හෝ කාලීන අවශ්‍යතාවයන් වෙනුවෙන් සිදුකළ යුතු සංවර්ධන කාර්යයන් සඳහා යම් ප්‍රතිපාදන ප්‍රමාණයක් වාර්ෂිකව දිවිනැගුම දෙපාර්තමේන්තුව විසින් වෙන් කරනු ලබන අතර, 2015 වර්ෂයේද රු.මි. 173.93 මේ වෙනුවෙන් වෙන් කරන ලදී.

විශේෂයෙන් මෙහිදි සඳහන් කළයුතු වන්නේ දිවිනැගුමලාභින් හෝ අඩුආදායම්ලාභින්ගේ ජීවන තත්ත්වය තවදුරටත් වර්ධනය කර ගැනීමට හෝ ස්වභාවික උපද්‍රව හේතුවෙන් සිදුවන ජීවනෝපායන්ගේ කඩා වැටීමේ අවධානම අවම කිරිම මෙහි මූලික අරමුණ වන බවයි.

ඒ අනුව 2014 වර්ෂය පුරා රටට ඇද හැලුණු ධාරාණිපාත වර්ෂාවෙන් විනාශවූ පොලොන්නරුව හා හම්බන්තොට දිස්ත්‍රික්ක වල කුඩා වැව් ප්‍රතිසංස්කරණය කිරීමේ රාජ්‍ය වැඩ පිළිවෙලට සමගාමීව ඒවා ප්‍රතිසංස්කරණය කිරීමත් පාණිය ජල සම්පාදනයත් හම්බන්තොට,යාපනය, මහනුවර හා

මාතලේ දිස්ත්‍රික්කයන්හි අවාරයේ ගම්මිරිස්, අර්තාපල්, ලොකු ළූණු හා කෙසෙල් වගා කිරීමත් මෙහිදි විශේෂයෙන් සදහන් කළයුතුය.

වගුව - 19 විශේෂ ව්‍යාපෘති සංවර්ධන වැඩසටහනේ ප්‍රගතිය

ව්‍යාපෘතිය	වෙන් කළ මුදල (රු.මි.)	නිමි ව්‍යාපෘති ගණන	වැයකළ මුදල (රු.මි.)	ප්‍රතිලාභින් සංඛ්‍යාව
ගංවතුරෙන් හානියට පත් සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය	120.30	829	79.72	75,118
පාණිය ජල සම්පාදනය	40.86	141	40.85	1,110
අඩුආදායම්ලාභින්ට ඉඩම් ලබාදීමේද ව්‍යාපෘතියේ ඉඩම් මැනිම හා ශුද්ධ කිරිම	4.09	616	3.64	616
ගම්මිරිස් වගාව	0.29	312	0.20	312
අර්තාපල් වගාව	4.50	150	4.50	150
ලොකු ළූණු වගාව	2.73	101	2.71	97
කෙසෙල් වගාව	0.89	81	0.57	81
එකතුව	173.66	2,230	132.19	77,484

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

2014 අතැති බිල්පත් පියවීම

2014 ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කළ වැඩසටහන් සදහා 2014.12.31 දින වන විට ගෙවීම් කිරීමට නොහැකි වු ප්‍රතිලාභිදායකත්වය ඇතුලත්ව ඇති ව්‍යාපෘති වෙනුවෙන් පහත පරිදි ගෙවීම් කරන ලදි.

වගුව - 20 2014 අවිච්ඡද වැඩසටහන්වල ප්‍රගතිය

ව්‍යාපෘති වර්ගය	ගෙවීම් කළ ව්‍යාපෘති සංඛ්‍යාව	වැයකළ මුදල (රු.මි.)	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
කෘෂි සංවර්ධන	2,066	23.65	2,066
පශු සම්පත් සංවර්ධන	628	14.76	628
ධීවර සංවර්ධන	86	2.09	86
ව්‍යාවසාය සංවර්ධන	3,433	72.87	3,433
එකතුව	**6,213**	**113.37**	**6,213**

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

9.3 දුප්පත්කම දුරලීමේ වැඩසටහන

දිවිනැගුම දෙපාර්තමේන්තුව වෙත නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය (2015 සැප්තැම්බර් මාසයෙන් පසුව සමාජ සවිබල ගැන්විම හා සුභසාධන අමාත්‍යාංශය) විසින් ආර්ථික දායකත්වයක් ලබා දිය නොහැකි දිගු කාලීන රෝග වලින් පෙලෙන අඩු ආදායම්ලාභින්ගේ සිට සතුටුදායක ආදායම් මට්ටමක සිටින අඩු ආදායම්ලාභින් වෙනුවෙන් තවදුරටත් ජීවනෝපාය සංවර්ධන වැඩසටහන පුළුල් කිරිම සඳහා රු.මි. 688.8 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වර්ෂයේ 3 වන කාර්තුවේ මුල් මාසය වන විට ලබා දෙන ලදි.

ඒ අනුව රු.මි. 28 බැගින් වු ප්‍රතිපාදනයක් සෑම දිස්ත්‍රික්කයක් සඳහාම ලබා දුන් අතර, ව්‍යාපෘති අවශ්‍යතාවයෙන් 10% ත් මුදලින් හෝ ශ්‍රමයෙන් තමාම දරමින් ඉතිරි 90% ක මුදල ප්‍රදානයක් වශයෙන් ලබා දීම දිගුකාලීන රෝගීන්ට මෙන්ම වයස්ගත, අබාධිත, වැන්දඹු හා සමාජීය වශයෙන් අවාසි සහගත තත්ත්වයට පත්ව ඇති ප්‍රතිලාභීන්ට ආර්ථික අගාධයෙන් එගොඩ වීමට ලැබුණු මනා පිටුවහලතක් විය.
මේ අනුව එම වැඩසටහනේ ප්‍රගතිය පහත පරිදි පෙන්වා දීය හැකිය.

වගුව - 21 දුප්පත්කම දුරලීමේ වැඩසටහනේ ප්‍රගතිය

අනු අංකය	ව්‍යාපෘති වර්ගය	ව්‍යාපෘති සංඛ්‍යාව	දෙපාර්තමේන්තු දායකත්ව (රු.මි.)	ප්‍රතිලාභී දායකත්වය (රු.මි.)	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
1	කෘෂි සංවර්ධන	5,264	111.11	22.59	5,264
2	පශු සම්පත් සංවර්ධන	3,715	118.39	24.44	3,715
3	ධීවර සංවර්ධන	556	18.83	3.80	556
4	ව්‍යාවසාය සංවර්ධන	9,481	267.65	71.63	9,481
5	අලෙවි සංවර්ධන	2,225	52.99	13.35	2,225
6	වෘත්තීය පුහුණු	55	2.04	1.96	58
	එකතුව	21,296	571.01	137.77	21,299

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

ප්‍රස්ථාරය- 06

ව්‍යාපෘතිලාභීන්ගේ පැතිරිම



මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

9.4 ජීවනෝපාය චක්‍රිය ණය වැඩසටහන

මෙම වැඩසටහන සඳහාද දිවිනැගුම දෙපාර්තමේන්තුව වෙත නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය (2015 සැප්තැම්බර් මාසයෙන් පසුව සමාජ සවිබල ගැන්වීම හා සුභසාධන අමාත්‍යාංශය) විසින් සතුටුදායක ආදායම් මට්ටමක සිටින අඩු ආදායම්ලාභින් වෙනුවෙන් රු.මි. 477.0 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් වර්ෂයේ 3 වන කාර්තුවේ මැද වන විට ලබා දෙන ලදි.

මෙමඟින් ගෘහස්ථ මට්ටමින් ස්වයං රැකියා උත්පාදනයත්, පවත්නා ව්‍යවසායකයකත්වයන් සංවර්ධනය කිරීමත් මූලික අරමුණු කර ගනිමින් වැඩසටහන ක්‍රියාත්මක වූ අතර, අගය එකතු කල කෘෂි, ධිවර හා සත්ත්ව නිෂ්පාදන ප්‍රවර්ධනයත් දෙස් විදෙස් සංචාරකයන් ඉලක්ක කර ගත් නිෂ්පාදන ප්‍රවර්ධනයත් කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලදි. මෙහිදි රුපියල් 100,000/- ණයක් සහන කාල සීමාවක් සහිතව 5% ක වාර්ෂික පොළි ප්‍රතිශතයක් සමඟින් නැවත අයකර ජිවනෝපාය චක්‍රිය අරමුදලට බැර කිරිම සිදු කෙරේ.

එමෙන්ම කොළඹ, ගම්පහ, කළුතර, ගාල්ල, පුත්තලම හා රත්නපුර යන දිස්ත්‍රික්කයන්හි මෙම වැඩසටහන ක්‍රියාත්මක නොවුනු අතර, අනෙක් සියළුම දිස්ත්‍රික්ක වල මෙය ක්‍රියාත්මක විය. ඒ අනුව පහත පරිදි චක්රීය ණය දිවිනැගුම බැංකු සංගම් හරහා ලබා දෙන ලදි.

වගුව - 22 ජීවනෝපායචක්‍රියණයවැඩසටහනේ ප්‍රගතිය

අනු අංකය	ව්‍යාපෘති වර්ගය	ව්‍යාපෘති ණය සංඛ්‍යාව	දෙපාර්තමේන්තු දායකත්ව (රු.මි.)	ප්‍රතිලාභින් සංඛ්‍යාව
1	කෘෂි සංවර්ධන	1,686	81.53	1,686
2	පශු සම්පත් සංවර්ධන	1,571	72.19	1,571
3	ධීවර සංවර්ධන	602	32.41	602
4	ව්‍යාවසාය සංවර්ධන	3,950	235.84	3,950
5	අලෙවි සංවර්ධන	852	51.25	852
	එකතුව	**8,661**	**473.22**	**8,661**

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

ජීවනෝපාය ණයලාභින් කවර ආකාරයෙන් විහිදි ගොස් ඇත්ද යන්න පහත ප්‍රස්ථාරය මඟින් පෙන්වා දිය හැකිය.

ප්‍රස්ථාරය- 07
ජීවනෝපාය ණයලාභීන් විහිදී ගොස්ඇතිආකාරය



මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

7.5 සමස්ත ප්‍රගතිය

ඒ අනුව එක් ව්‍යාපෘති අංශයක් යටතේ නිම කරන ලද ව්‍යාපෘති සංඛ්‍යාව හා නිමි වටිනාකම් හා ප්‍රතිලාභින් සංඛ්‍යාව පිළිබඳව පහත පරිදි පෙන්වා දිය හැකිය

වගුව - 23 ව්‍යාපෘති *වර්ගයනිම* කරන ලද ව්‍යාපෘතිවල සමස්ත ප්‍රගතිය

ව්‍යාපෘති වර්ගය	නිමි ව්‍යාපෘති සංඛ්‍යාව	වැයකළ මුදල (රු.මි.)	ප්‍රතිලාභි දායකත්වය (රු.)	වක්‍රීය අරමුදලේ දායකත්වය (රු.)	ප්‍රතිලාභි පවුල් ගණන
කෘෂිකර්ම ව්‍යාපෘති	21,499	474.30	14.43	72.17	96,651
සත්ත්ව පාලන ව්‍යාපෘති	9,277	279.71	7.84	39.19	9,278
ධීවර ව්‍යාපෘති	1,929	68.17	1.71	8.56	1,929
සුළු පරිමාන ව්‍යවසාය	34,255	899.41	33.08	165.41	34,254
අලෙවි සංවර්ධන	6,583	160.23	6.66	33.32	6,583
වෘත්තීය පුහුණු ව්‍යාපෘති	338	8.89	0.75	3.75	341
එකතුව	73,881	1890.71	64.47	322.4	149,036

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

ප්‍රස්ථාරය- 08

ව්‍යාපෘති වර්ගයනිම කරන ලද ව්‍යාපෘතිවල සමස්ත ප්‍රගතිය



මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

ජීවනෝපාය නව සංවර්ධන වැඩසටහන්වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය
(2015.12.31 දිනට)

අනු අංකය	දිස්ත්‍රික්කය	වෙන් කරන ලද ප්‍රති.ප්‍රමාණය (රු.මි.)	භෞතික හා මූල්‍ය ප්‍රගතිය											
			කෘෂිකර්ම		සත්ත්ව පාලන		ධීවර		ව්‍යවසාය සංවර්ධන		රැකියා ඉලක්ක කර ගත් වෘත්තීය පුහුණුව		සමස්ත	
			නිමි ව්‍යාපෘති සංඛ්‍යාව	*වියදම (රු.මි.)*	*නිමි ව්‍යාපෘති සංඛ්‍යාව*	*වියදම (රු.මි.)*	*නිමි ව්‍යාපෘති සංඛ්‍යාව*	*වියදම (රු.මි.)*	*නිමි ව්‍යාපෘති සංඛ්‍යාව*	*වියදම (රු.මි.)*	*නිමි ව්‍යාපෘති සංඛ්‍යාව*	*වියදම (රු.මි.)*	*නිමි ව්‍යාපෘති සංඛ්‍යාව*	*වියදම (රු.මි.)*
1	කොළඹ	19.27	63	0.42	27	0.28	2	0.09	982	13.44			1,074	14.23
2	ගම්පහ	37.25	134	1.97	36	0.58	22	0.63	1836	28.40	8	0.19	2,036	31.77
3	කළුතර	23.69	125	3.23	14	0.76	9	0.28	1033	18.79			1,181	23.06
4	ගාල්ල	45.80	354	3.97	24	0.52	26	0.45	2006	35.66	65	1.68	2,475	42.28
5	මාතර	30.64	485	4.44	45	0.60	71	1.03	1193	12.16	16	0.11	1,810	18.34
6	හම්බන්තොට	140.14	1978	90.49	9	0.10	12	0.10	803	10.79	9	0.20	2,811	101.68
7	මහනුවර	43.14	260	2.32	286	5.29			934	13.75			1,480	21.36
8	මාතලේ	26.29	574	8.21	62	1.43			749	14.14	37	0.30	1,422	24.08
9	නුවරඑළිය	22.01	197	2.93	221	6.95			301	9.28	37	1.11	756	20.27
10	කුරුණෑගල	60.30	1528	13.77	286	3.37			2468	38.92	7	0.18	4,289	56.24
11	පුත්තලම	25.46	276	4.40	205	3.58	79	1.74	740	13.19			1,300	22.91
12	බදුල්ල	41.64	837	17.37	265	5.44			426	10.42			1,528	33.23
13	මොනරාගල	37.84	1134	12.40	88	1.77	5	0.08	1060	22.43			2,287	36.68

අනු අංකය	දිස්ත්‍රික්කය	වෙන් කරන ලද ප්‍රති.ප්‍රමාණය (රු.මි.)	භෞතික හා මූල්‍ය ප්‍රගතිය											
			කෘෂිකර්ම		සත්ත්ව පාලන		ධීවර		ව්‍යවසාය සංවර්ධන		රැකියා ඉලක්ක කර ගත් වෘත්තීය පුහුණුව		සමස්ත	
			නිමි ව්‍යාපෘති සංඛ්‍යාව	වියදම (රු.මි.)	නිමි ව්‍යාපෘති සංඛ්‍යාව	වියදම (රු.මි.)	නිමි ව්‍යාපෘති සංඛ්‍යාව	වියදම (රු.මි.)	නිමි ව්‍යාපෘති සංඛ්‍යාව	වියදම (රු.මි.)	නිමි ව්‍යාපෘති සංඛ්‍යාව	වියදම (රු.මි.)	නිමි ව්‍යාපෘති සංඛ්‍යාව	වියදම (රු.මි.)
14	කෑගල්ල	30.14	606	6.00	35	0.23			1145	14.21			1,786	20.44
15	රත්නපුර	56.39	1008	10.44	75	1.02			1724	39.39	3	0.12	2,810	50.97
16	අනුරාධපුරය	31.69	1013	9.55	172	3.41	17	0.29	530	8.38	1	0.02	1,733	21.65
17	පොලොන්නරුව	58.79	632	38.88	185	3.65	78	0.76	250	5.74			1,145	49.03
18	අම්පාර	25.27	205	2.51	188	2.90	52	1.22	667	13.83	57	1.14	1,169	21.60
19	ත්‍රිකුණාමලය	18.17	142	2.84	177	5.03	28	0.91	306	9.15			653	17.93
20	මඩකලපුව	46.84	172	5.31	88	3.00	59	1.93	1149	34.31	43	1.82	1,511	46.37
21	වව්නියාව	4.17	116	1.40	93	1.81	1	0.01	49	0.91			259	4.13
22	යාපනය	29.85	454	10.61	317	8.92	182	4.42	311	5.90			1,264	29.85
23	මන්නාරම	8.48	50	1.88	114	4.90	1	0.03	41	1.58			206	8.39
24	මුලතිව්	10.27	85	1.87	204	6.22	17	0.49	53	1.58			359	10.16
25	කිලිනොච්චිය	6.63	54	0.78	147	2.65	24	0.39	141	2.74			366	6.56
එකතුව		**880.16**	**12,482**	**257.99**	**3,363**	**74.41**	**685**	**14.85**	**20,897**	**379.09**	**283**	**6.87**	**37,710**	**733.21**

10. අලෙවි සංවර්ධන අංශයේ කාර්යසාධනය

අලෙවි සංවර්ධන වැඩසටහන

නිෂ්පාදකයාට සාධාරණ මිලක්, පාරිභෝගිකයාට සහන මිලක් හා ස්වයං රැකියා අවස්ථා වැඩිදියුණු කිරීම මුලික තේමාව කරගත් අලෙවි සංවර්ධන අංශයේ ප්‍රධාන අරමුණ ***" නව නිපයුම් සඳහා වෙළෙඳපොල අවස්ථා පුළුල් කිරීම වේ "*** .

දැක්ම :- " ජනහිතකාමී ව්‍යාපාරික ප්‍රජාවක් "

මෙහෙවර :- "නිෂ්පාදකයාට සාධාරණ මිලක්, පාරිභෝගිකයාට සහන මිලක් හා ස්වයං රැකියා අවස්ථා වැඩි දියුණු කිරීම "

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීමෙන් පසුව 2015 වර්ෂයේ අලෙවි සංවර්ධන අංශය මගින් අඩු ආදායම්ලාභින්ගේ නිෂ්පාදන සඳහා අලෙවි අවස්ථා පුළුල් කිරීමේ හා වර්ධනය කිරීමේ අරමුණ ඇතිව ප්‍රධාන වැඩසටහන් 02ක් යටතේ අලෙවි සංවර්ධන අංශයේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

01. අලෙවි සංවර්ධන වැඩසටහන
02. නිවාස සංවර්ධන ලොතරැයි වැඩසටහන

කෘෂි කාර්මික, පශු සම්පත් හා ධීවර ,කර්මාන්ත හා සේවා යන නිෂ්පාදන සඳහා අලෙවි අවස්ථා වැඩි දියුණු කරමින් නිෂ්පාදකයාට ස්ථාවර වෙළඳපොලක් සහ සාධාරණ මිලක් තහවුරු කරමින් පාරිභෝගිකයාට සාධාරණ මිලකට ගුණාත්මක බැවින් යුක්ත භාණ්ඩ පහසුවෙන් මිලදී ගැනීමට අවස්ථාව උදාකර දීම මෙහි ප්‍රධාන පරමාර්ථය වේ.

අලෙවි සංවර්ධන අංශයේ වැඩසටහන් සැලසුම් කිරීමේදී භාණ්ඩයක් හෝ සේවාවක් නිෂ්පාදනය කිරිමට සැලසුම් කරන අවස්ථාවේ සිට එය අවසානයේ පාරිභෝගිකයාගේ අතට පත්වන තෙක් මෙන්ම ඉන් පසුවත් අලෙවියෙන් පසු සේවාව දක්වා වු සමස්ථ ක්‍රියාවලිය අලෙවිකරණය ලෙස සලකා ඇත.

(අ) 2015 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

- ජංගම අලෙවි රථ හා ජංගම අලෙවි කුටි සංවර්ධන වැඩසටහන
- ගෘහස්ථ ගබඩා සංවර්ධනය කිරීමේ වැඩසටහන
- ව්‍යාපාර සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම ව්‍යවසායක දැණුම වර්ධනය කිරීමේ පුහුණු වැඩසටහන
- අලෙවි ප්‍රදර්ශන වැඩසටහන
- සතිපොල වෙත නිෂ්පාදකයින් යොමු කිරීමේ වැඩසටහන
- දිවිනැගුම ව්‍යාපාරික සංගම් පිහිටුවීමේ වැඩසටහන

10.1 ජංගම අලෙවි රථ හා ජංගම අලෙවි කුටි සංවර්ධන වැඩසටහන

ජංගම අලෙවි රථ හා ජංගම අලෙවි කුටි සංවර්ධන වැඩසටහන මගින් අලෙවිකරණ පහසුකම් වැඩි දියුණු කිරීමේ අරමුණ ඇතිව මෙම වැඩසටහන ක්‍රියාත්මක කර ඇත. ඍජු වශයෙන්ම තම නිෂ්පාදන අතරමැදි ග්‍රහණයෙන් තොරව පාරිභෝගිකයා වෙත ගොස් අලෙවි කර වැඩි ආදායමක් ඉපයීමට මෙමගින් හැකියාව ලැබේ. ජංගම රථයක් හෝ ජංගම අලෙවි කුටියක් සකස්කර ගැනීම සඳහා තම දායකත්වයට අමතරව දිවිනැගුම අලෙවි සංවර්ධන අංශය මගින් රු.20,000.00 ක

උපරිමයකට යටත්ව මුදල් ප්‍රතිපාදන ලබාදෙන ලදී. 2015 වසරේ ව්‍යවසායකයින් 232 ක් සඳහා රු.මිලියන 4.568 ක් මේ සඳහා වැය කර ඇත.

රත්නපුර දිස්ත්‍රික් ප්‍රදර්ශනය

වගුව - 24 ජංගම අලෙවි රථ හා ජංගම අලෙවි කුටි සංවර්ධන වැඩසටහන (දිස්ත්‍රික් මට්ටමින්)

දිස්ත්‍රික්කය	ව්‍යවසායකයින් සංඛ්‍යාව	වැය කළ මුදල රු.
මාතර	18	336,500
පොලොන්නරුව	9	180,000
මොනරාගල	2	40,000
ගම්පහ	8	160,000
රත්නපුර	8	180,000
වව්නියාව	10	200,000
මහනුවර	11	240,000
නුවරඑළිය	18	360,000
බදුල්ල	5	100,000
කුරුණෑගල	64	1,258,500
පුත්තලම	17	340,000
ගාල්ල	4	60,000
අනුරාධපුර	1	20,000
අම්පාර	1	20,000
ත්‍රිකුණාමලය	9	180,000
මඩකලපුව	7	140,000
දිස්ත්‍රික්කය	ව්‍යවසායකයින් සංඛ්‍යාව	වැය කළ මුදල රු.
කිළිනොච්චිය	7	140,000
යාපනය	15	300,000
කෑගල්ල	4	80,000
මුලතිව්	10	180,000
මන්නාරම	4	53,352
එකතුව	**232**	**4568352**

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

10.2 ගෘහස්ථ ගබඩා සංවර්ධනය කිරීමේ වැඩසටහන

කුඩා හා මධ්‍ය පරිමාණ නිෂ්පාදකයින් වර්තමානයේ මුහුණ දී ඇති ප්‍රධාන ගැටලුවක් වී ඇත්තේ තම නිෂ්පාදන නිසි පරිදි ගබඩා කර තබා ගැනීමට හැකියාවක් හා පහසුකමක් නොමැති වීමයි. නිෂ්පාදකයින්ට ගෘහාස්ශ්‍රිතව කුඩා පරිමාණයෙන් ගබඩාවක් සකස් කරගැනීම සඳහා නිෂ්පාදකයින් පෙළඹවීමටත් තම නිෂ්පාදන සඳහා වෙළඳපල මිල ඉහල කාලසිමාවේදී අලෙවි කර ගැනිමට අවස්ථාව ලබාදීමටත් මෙහිදී අපේක්ෂා කරන ලදි. එක් ගබඩාවක් සකස් කර ගැනීම සඳහා රු.20,000.00 ක උපරිමයකට යටත්ව භාණ්ඩාගාර සෘජු ප්‍රතිපාදන ලබා දෙන ලදී. මෙම වසරේ ගබඩා 24 ක් ඉදිකළ අතර ඒ සඳහා රු.460,000.00 ක මුදලක් වැය කරන ලදී.

10.3 ව්‍යාපාර සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යවසායික දැනුම වර්ධනය කිරීමේ පුහුණු වැඩසටහන

සාර්ථක ව්‍යාපාරික ප්‍රජාවක් බිහිකිරීම සඳහා ව්‍යවසායකයින්ගේ ව්‍යාපාරික ඥානය හා අලෙවිකරණ දැනුම මෙන්ම කුසලතාවය වර්ධනය කිරීම සඳහා එක් දින පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. දැනටමත් යම්කිසි නිෂ්පාදනයක නිරතවන ව්‍යවසායකයින් හඳුනාගෙන එම අයගේ නිෂ්පාදන වැඩි දියුණු කර ගැනීමටත් අලෙවි අවස්ථා පුළුල් කර ගැනීමට සෘජුවම අවශ්‍ය වන දැනුම ලබාදීමත් මෙහිදී සිදුවිය.

පුහුණු අන්තර්ගතය:

- නිෂ්පාදන ප්‍රමිතිකරණය
- ගණුදෙනු සටහන් කිරීම
- වෙළඳපොළ තහවුරු කර ගැනීම හා නව වෙළඳපොල අවස්ථා සොයා යෑම

ඉහත මාතෘකා ඔස්සේ එක් දින පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මේ සඳහා ශ්‍රී ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා වානිජ මණ්ඩලය, කුඩා ව්‍යාපාර සංවර්ධන දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ඒ ඒ විෂය පිළිබඳ ප්‍රවීණ උපදේශකවරුන්ගේ සහය හා සම්පත්දායකත්වය ලබා ගන්නා ලදී. 2015 වසර තුළ ක්‍රියාත්මක කළ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව 263 ක් වන අතර, පුහුණුව ලැබූ ව්‍යාපාරිකයින් සංඛ්‍යාව 13,335 ක් වේ. වැය වූ මුදල රු.මිලියන 3.84 කි.

වගුව - 25 ව්‍යාපාර සැලසුම් කිරීම ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යවසායික දැනුම වර්ධනය කිරීමේ පුහුණු වැඩසටහන (දිස්ත්‍රික් මට්ටමින්)

දිස්ත්‍රික්කය	පුහුණුව ලබාගත් ව්‍යවසායක සංඛ්‍යාව	වැය කළ මුදල රු.
මාතර	801	234,983.00
පොලොන්නරුව	354	101,130.00
මොනරාගල	409	134,527.00
කොළඹ	600	165,000.00
ගම්පහ	605	179,162.00
රත්නපුර	805	246,655.00
වව්නියාව	213	60,000.00
මහනුවර	491	137,591.00
නුවරඑළිය	189	73,515.00
බදුල්ල	340	105,000.00
කුරුණෑගල	1548	438,475.00
පුත්තලම	782	232,163.00
ගාල්ල	920	257,910.00
මාතලේ	491	121,400.00

අනුරාධපුර	300	86,460.00
අම්පාර	504	131,900.00
ත්‍රිකුණාමලය	350	103,935.00
මඩකලපුව	583	164,937.00
කිලිනොච්චිය	238	57,380.00
යාපනය	750	225,000.00
කෑගල්ල	235	70,400.00
මුලතිව්	300	89,990.00
මන්නාරම	250	75,000.00
කලුතර	788	194,060.00
හම්බන්තොට	489	151,579.00
එකතුව	**13,335**	**3,838,152.00**

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

10.4. අලෙවි ප්‍රදර්ශන වැඩසටහන

"දා බිඳු මිතු 2015" තේමා පාඨය කරගනිමින් ප්‍රාදේශීය හා දිස්ත්‍රික් අලෙවි ප්‍රදර්ශන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. 2015 වසර තුල කෘෂිකර්ම සත්ව පාලන , ධීවර , කර්මාන්තය හා සේවා යන අංශවල නිෂ්පාදකයින් ඒකරාශී කරගනිමින් ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් වසරේ හොඳම ව්‍යවසායකයා තෝරා ඇගයීම් කිරීම මෙහිදි සිදුකරන ලදී. දිවිනැගුම ව්‍යාපාරික ප්‍රජාවගේ ඒකරාශීවීමත් අන්‍යොන්‍ය වශයෙන් තම නිෂ්පාදන සඳහා අලෙවි පහසුකම් හුවමාරු කර ගැනීමත් ජාතික මට්ටමට නිෂ්පාදකයින් හඳුන්වාදීමත් මෙහිදී සිදු විය.

කුරුණෑගල දිස්ත්‍රික් ප්‍රදර්ශනය

වගුව - 26 අලෙවි ප්‍රදර්ශන (දිස්ත්‍රික් මට්ටමින්)

දිස්ත්‍රික්කය	සහභාගී වූ වෙළඳුන් සංඛ්‍යාව	වැය කළ මුදල රු.
මාතර	1162	952806.00
පොලොන්නරුව	847	237,566.00
මොනරාගල	538	283,111.00
කොළඹ	570	885,415.00
ගම්පහ	550	950,000.00
රත්නපුර	910	1,145,200.00
වව්නියාව	235	335,000.00
මහනුවර	2212	948,361.00
නුවරඑළිය	264	384,031.00
බදුල්ල	1221	533,637.00
කුරුණෑගල	3148	1,185,481.00
පුත්තලම	1104	752,745.00
ගාල්ල	884	607,970.00
මාතලේ	843	560,799.00
අනුරාධපුර	1532	1,066,409.00
අම්පාර	1074	829,085.00
ත්‍රිකුණාමලය	589	446,654.00
මඩකලපුව	944	724,572.00
කිළිනොච්චිය	294	276,918.00
යාපනය	1068	898316.00
කෑගල්ල	530	606,484.00
මුලතිව්	275	419,969.00
මන්නාරම	230	348,662.00
කලුතර	468	877,250.00
හම්බන්තොට	422	249,655.00
එකතුව	**21914**	**16506096.00**

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

10.5. දිවිනැගුම නිෂ්පාදකයින් සති පොලට යොමු කිරීම හා ව්‍යාපාරික සංගම් පිහිටුවීම

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් දිවිනැගුම ව්‍යවසායකයින් ඒකරාශී කරමින් ව්‍යාපාරික සංගම් පිහිටුවන ලද අතර, කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාවසායකයින්ගේ ශක්තිය ජාතික මට්ටම දක්වා වර්ධනය කර ගැනීමට සැලසුම් කර ඇත. කුඩා ප්‍රමාණයෙන් නිෂ්පාදන සිදුකර ප්‍රාදේශීය සතිපොලහි තම නිෂ්පාදනයට ඉහළ ඉල්ලුමක් ඇතිකර ගැනීමට ප්‍රාදේශීය සභාවේ සහාය හා සේවය මෙමගින් නිෂ්පාදකයින්ට ලබාගැනීමට හැකියාව ලැබිණි. 2015 වසරේ සතිපොලට යොමුකර නිෂ්පාදන සඳහා අලෙවි අවස්ථා වැඩිකරගත් ප්‍රතිලාභින් සංඛ්‍යාව 2,755 ක් වේ. පිහිටුවන ලද ව්‍යාපාරික සංගම් සංඛ්‍යාව 331 කි.

රත්නපුර දිස්ත්‍රික් ප්‍රදර්ශනය

හොඳම ව්‍යවසායකයා ලෙස සම්මාන ලබමින්

රත්නපුර දිස්ත්‍රික් හොඳම ව්‍යවසායකයා

10.6 නිවාස සංවර්ධන ලොතරැයි වැඩසටහන - 2015

සෑම අඩු ආදායම්ලාභී පවුලක් සඳහාම ස්ථිර නිවසක හිමිකම ලබාදීමේ අරමුණ මත 2013 අංක 01 දරණ දිවිනැගුම පනතේ 45 වන වගන්තිය ප්‍රකාරව දිවිනැගුම නිවාස ලොතරැයි භාරකාර අරමුදල ආරම්භ කොට ක්‍රියාත්මක කරන ලදී. සෑම දිවිනැගුම ප්‍රතිලාභියකුම මාසිකව රු.10 මුදලක් ගෙවීමෙන් අරමුදලට දායකත්වය ලබාදෙන අතර, සෑම මාසයකම රු.මිලියන 14 කට ආසන්න මුදලක් නිවාස සංවර්ධන ලොතරැයි අරමුදලට බැර වේ. එහි වාර්ෂික දායකත්වය රු.මිලියන 168 ක් පමණ වේ.

ලොතරැයි භාරකාර අරමුදලේ පරිපාලන ව්‍යුහය

කැබිනට් පත්‍රිකාවෙන් අනුමත කරන ලද නිලබලයෙන් පත් වන සමාජිකයින් 07 ගෙන් සමන්විත භාරකාර මණ්ඩලයක් මගින් නිවාස ලොතරැයි අරමුදලේ පරිපාලන කටයුතු සිදුකරන අතර, නිල මණ්ඩලය පහත පරිදි වේ.

01. විෂයභාර අමාත්‍යාංශ ලේකම්වරයා (සභාපති)
02. දිවිනැගුම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්
03. දිවිනැගුම දෙපාර්තමේන්තුවේ සමාජ සුභසාධන අංශයේ අධ්‍යක්ෂ
04. මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයෙක්
05. සමෘද්ධි අමාත්‍යාංශයේ නියෝජිතයෙක්
06. සමෘද්ධි කළමනාකරුවන්ගේ වෘත්තිය සංගමයේ සභාපති
07. සමෘද්ධි සංවර්ධන නිලධාරි සංගමයේ සභාපති

දිනුම් ඇදීම

සහනාධාර හිමිකම ඇති සියළුම ප්‍රතිලාභීන්ගේ තොරතුරු ඇතුළත් කරගනිමින් පරිගණක දත්ත පද්ධතියක් සකස් කර සෑම ප්‍රතිලාභියකු සඳහාම ලොතරැයි අංකයක් ලබාදීම මගින් දිනුම් ඇදීම සිදු කරනු ලැබේ. 2012 හා 2013 වර්ෂවලට අදාල දිණුම්වාර 24 ක් 2015 වසර තුළ සිදුකරන ලද අතර, ජයග්‍රාහකයින් 2,400 ක් එහිදී තෝරාගන්නා ලදී. එම ජයග්‍රාහකයින් සඳහා ලබාදීමට වෙන් වූ මුදල රු.මිලියන 360 ක් වන අතර, පහත සඳහන් පරිදි එකී ත්‍යාග මුදල් දිස්ත්‍රික් මට්ටමින් ජයග්‍රාහකයින් වෙත ලබා දී ඇත.

සෙත්සිරිපාය අදියර ii - නාගරික සංවර්ධන අධිකාරියේ ශ්‍රවනාගාරයේදි 16 වන දිනුම් වාරය

වගුව - 27 නිවාස ලොතරැයි ජයග්‍රාහකයින් සඳහා ත්‍යාග මුදල් නිදහස් කිරීම - 2012

අනුඅංකය	දිස්ත්‍රික්කය	මුළු දිනුම් සංඛ්‍යාව	මුදල් නිදහස් කරනසංඛ්‍යාව	නිදහස් කරන ලද මුදල
1	කොළඹ	36	34	5,100,000.00
2	ගම්පහ	96	86	12,900,000.00
3	කළුතර	48	44	6,600,000.00
4	ගාල්ල	60	59	8,850,000.00
5	මාතර	60	56	8,400,000.00
6	හම්බන්තොට	48	47	7,050,000.00
7	මහනුවර	72	69	10,350,000.00
8	මාතලේ	36	32	4,800,000.00
9	නුවරඑළිය	36	33	4,950,000.00
10	කුරුණෑගල	120	112	16,800,000.00
11	පුත්තලම	48	44	6,600,000.00
12	රත්නපුර	93	87	13,050,000.00
13	කෑගල්ල	60	57	8,550,000.00
14	අනුරාධපුර	48	46	6,900,000.00
15	පොළොන්නරුව	24	21	3,150,000.00
16	බදුල්ල	48	47	7,050,000.00
17	මොණරාගල	36	34	5,100,000.00
18	අම්පාර	60	59	8,850,000.00
19	ත්‍රිකුණාමලය	36	36	5,400,000.00
20	මඩකලපුව	69	68	10,200,000.00
21	වව්නියාව	12	12	1,800,000.00
22	යාපනය	45	44	6,600,000.00
23	කිලිනොච්චිය	3	3	450,000.00
24	මන්නාරම	3	3	450,000.00
25	මුලතිව්	3	3	450,000.00
එකතුව		**1,200**	**1,136**	**170,400,000.00**

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

වගුව - 28 නිවාස ලොතරැයි ජයග්‍රාහකයින් සඳහා ත්‍යාග මුදල් නිදහස් කිරීම - 2013

අනුඅංකය	දිස්ත්‍රික්කය	මුළු දිනුම් සංඛ්‍යාව	මුදල් නිදහස් කරනසංඛ්‍යාව	නිදහස් කරන ලද මුදල
1	කොළඹ	36	30	4,500,000.00
2	ගම්පහ	96	91	13,650,000.00
3	කළුතර	48	44	6,600,000.00
4	ගාල්ල	60	53	7,950,000.00
5	මාතර	60	57	8,550,000.00
6	හම්බන්තොට	48	46	6,900,000.00
7	මහනුවර	72	69	10,350,000.00
8	මාතලේ	36	29	4,350,000.00
9	නුවරඑළිය	36	35	5,250,000.00
10	කුරුණෑගල	120	114	17,100,000.00
11	පුත්තලම	48	39	5,850,000.00
12	රත්නපුර	84	75	11,250,000.00
13	කෑගල්ල	60	54	8.100,000.00
14	අනුරාධපුර	48	45	6,750,000.00
15	පොළොන්නරුව	24	22	3,300,000.00
16	බදුල්ල	48	39	5.850,000.00
17	මොණරාගල	36	34	5.100,000.00
18	අම්පාර	60	58	8,700,000.00
19	ත්‍රිකුණාමලය	36	35	5,250,000.00
20	මඩකලපුව	60	60	9,000,000.00
21	වව්නියාව	12	12	1,800,000.00
22	යාපනය	36	36	5,400,000.00
23	කිලිනොච්චිය	12	12	1,800,000.00
24	මන්නාරම	12	12	1,800,000.00
25	මුලතිව්	12	12	1,800,000.00
එකතුව		**1,200**	**1,113**	**166,950,000.00**

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

11. තොරතුරු තාක්ෂණ අංශයේ කාර්යසාධනය

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ රාජකාරිවලදී තොරතුරු තාක්ෂණය බහුලව යොදා ගනිමින්, කාර්යක්ෂමතාවය හා සඵලදායීතාව වැඩි කරමින්, ජනතාවට වඩාත් කඩිනම් හා ගුණාත්මක සේවාවක් ලබාදීමට සහාය වීම මෙම අංශයේ ප්‍රධන කාර්යභාරයයි.

මෙම අංශය මගින් 2015 වර්ෂය තුලදී ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් හා ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත දක්වා ඇත

11.1. ඉ - දිවිනැගුම වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

මේ යටතේ, මානව සම්පත්කළමණාකරන මොඩියුලය තුළින් සියලු නිලධාරින්ගේ තොරතුරු යාවත්කාලීන කිරීම. එනම්, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරින් 23,800 කගේ පමණ තොරතුරු මානව සම්පත් කළමණාකරන මොඩියුලයතුළ කලමණාකරණය කිරීම. (Human Resource Management)

11.2. ප්‍රතිලාභී කලමණාකරන මොඩියුලය තුළින් ග්‍රාම නිලධාරි වසම්වල තොරතුරු හා සහනාධාරලාභී තොරතුරු යාවත්කාලීන කිරීම (Customer Relationship Management)

11.3. දිවිනැගුම ප්‍රජාමූල බැංකු පරිගණකගත කිරීමේ වැඩසටහන යටතේ නියමු ව්‍යාපෘතියට අයත් බැංකු 8 සමඟ මෘදුකාංගය නිපදවා අවසන් කර ඇත. එම පරිගණක මෘදුකාංගය ICTA ආයතනය සමඟ එක්ව අන්තර්ජාලය ඔස්සේ අනෙකුත් බැංකු සමඟ සම්බන්ධ කිරීම. මේතුළින් දිවිනැගුම බැංකු කටයුතු පරිගණක ක්‍රියාවලිය ඔස්සේ වේගවත් කළ හැකිය.

11.4. 2015 වර්ෂයට අදාළ සමෘද්ධි නිවාස සංවර්ධන ලොතරැයි දිනුම් ඇදීමේ දත්ත පද්ධතිය සකස් කර නිවාස 2,400 පිරිනැමීමට කටයුතු කිරීම.

11.5. දිවිනැගුම සංවර්ධන දෙපාර්ත්මේන්තුවේ නිල වෙබ් අඩවිය යාවත්කාලීන කරමින් පවත්වාගෙන යෑම. ආයතනය නිකුත් කරන චක්‍රලේඛණ වෙබ් අඩවිය තුළින් ප්‍රචාරණය කිරීම.

11.6. දිවයින පුරා විසිරී ඇති දිවිනැගුම මූලස්ථාන කාර්යාල 332 සඳහා පරිගණක 332 ක් ලබාදීම හා අන්තර්ජාල පහසුකම් ලබාදීම.

11.7. දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ක්ෂණික ඇමතුම් අංක 0112-887722 සේවාව ක්‍රියාත්මක කොට, එයට ලැබෙන පැමිණිලි අදාළ අංශ වෙත යොමුකර විසඳුම් ලබාදී මහජනතාවට සේවයක් සැලසීම.

12. මාධ්‍ය අංශයේ කාර්යසාධනය

සමාජ සාධාරණත්වය ඇති කරමින්, ජීවනෝපාය සංවර්ධන කටයුතු ඔස්සේ ජීවන තත්වය ඔප්නංවාලීම මඟින් රටේ දිළිඳුකම අවම කිරීමට දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව වාර්ෂිකව ක්‍රියාත්මක කරනු ලබන ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති, සමාජ සුභසාධන, සමාජ ආරක්ෂණ හා සමාජ සංවර්ධන වැඩසටහන් පිළිබඳව රටේ පොදු ජනතාව හා අනෙකුත් වගකිව යුතු අංශ නිරන්තරව දැනුවත් කිරීම මාධ්‍ය අංශයේ ප්‍රධාන කාර්යභාරයයි.

12.1 අරමුණ

දුගී බව අවම කිරීමේ සංවර්ධන කාර්යයන්ට හා අඩු ආදායම්ලාභී ජන කොටස්වල උත්සාහයන්ට උරදෙන සන්නිවේදන රටාවන් ගොඩ නගමින්, දිවි නැගුම ව්‍යාපාරය පුළුල් සංවාදයකට භාජනය කරමින්, එහි සංවර්ධනය පිළිබඳ තොරතුරු වඩාත් ඵලදායිව හා කාර්යක්ෂම ජනතාව අතරට ගෙන යාමට අදාල ප්‍රචාරණ කටයුතු සිදු කිරීම.

12.2 ව්‍යාපෘතිය

රටේ ජාතික ආර්ථික සංවර්ධනයට උරදෙන දිවි නැගුම ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති කාර්යක්ෂම හා සඵලදායී කර ගැනීමට විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය භාවිතයට ගැනීම.

12.3 විද්‍යුත් මාධ්‍ය කටයුතු

හිරු T.V Top Light වැඩ සටහනට දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ විගණන නිලධාරීන් සම්බන්ධ කොට කාර්ය මණ්ඩලය තුළ අභිප්‍රේරණය වැඩි කිරීම හා දෙපාර්තමේන්තුවේ කටයුතු පිළිබඳව පොදු ප්‍රචාරයක් ලබාදීම.

12.4 මුද්‍රිත මාධ්‍ය කටයුතු

ජාතික පුවත්පත්වල පල කෙරෙන දිවි නැගුම සංවර්ධන ව්‍යාපාරය ආශ්‍රිත දෛනික ප්‍රවෘත්ති වාර්තා අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ අවධානයට යොමු කර, ඒ මඟින් අදාල අංශ සම්බන්ධීකරණයෙන් අදාළ කටයුතු සඳහා පියවර ගැනීම. කාලීනව සිදු කෙරෙන උත්සව අවස්ථා සඳහා මාධ්‍ය ප්‍රචාරණ කටයුතු වශයෙන් ජාතික පුවත්පත්වල විශේෂ ලිපි වාර්තා පල කිරීම. (අලෙවි ප්‍රවර්ධන, සමෘද්ධි ළමා කැකුළු සමාජ, සාක්ෂරතා වැඩසටහන්)

13. ප්‍රජාමූල බැංකු අංශයේ කාර්යසාධනය

දිවිනැගුම පනතේ අරමුණු ප්‍රකාරව, දිළිඳුකම දුරලීම සඳහා, දිළිඳු සහ අඩු අදායම්ලාභී ජනතාවගේ ජීවන මට්ටම උසස් කරලිමට අදාළව ඔවුන්ට ශක්‍යතාවය ඇති ක්ෂේත්‍රවලට අදාළ ව්‍යාපෘති/ජීවන මාර්ග සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය ප්‍රාග්ධන සම්පාදනය ඉටු කරලීමට, විවිධ ක්ෂුද්‍ර මූල්‍ය ණය පහසුකම් සැපයීමත්, දිවිනැගුම (සමෘද්ධි) ප්‍රතිලාභීන්ගේ අනිවාර්ය ඉතුරුම් හා ඔවුන් හා අනෙකුත් අඩු ආදායම්ලාභී ජනතාවගේ, පිළිවෙලින්, අනිවාර්ය ඉතුරුම් හා තැන්පතු සුරක්ෂිත කිරීම හා ඒවා ආයෝජනයෙන් ඔවුනට ප්‍රමාණවත් ප්‍රතිලාභ සැලසීමත් ඒ ඔස්සේ, ජාතික ආර්ථිකයට එම ජනතාවගේ සක්‍රිය දායකත්වය ලබාදිමට සහායවීමත් , මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරයයි.

2015 වර්ෂය තුලදී මෙමඅංශය මගින් ක්‍රියාත්මක කරන ලද රාජකාරි කටයුතු පිළිබඳ විස්තරයක් පහත දක්වා ඇත.

1996 වර්ෂයේදී ආරම්භ කරන ලද සමෘද්ධි අධිකාරියේ " ණය අංශය " කාලීන වශයෙන් සිදුවූ ප්‍රතිපත්තිමය වෙනස්කම් හේතු කොටගෙන, 1998 වසරේදී "බැංකු මූල්‍ය කටයුතු " අංශය ලෙස නම් කරනු ලැබීය. ඒ අනුව, බැංකු මූල්‍ය අංශය ක්ෂුද්‍ර මූල්‍ය කටයුතු මෙන්ම දිවිනැගුම ප්‍රතිලාභීන්ගේ ඉතුරුම් පුරුද්ද වැඩි දියුණු කිරීම සඳහා ද කටයුතු කරනු ලබයි. එහෙත්, 2013 අංක 01 දරණ දිවිනැගුම පනත මඟින් ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව බවට පත් කරන ලදී. එතෙක් ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය යටතේ පැවති බැංකු සංගම් හා මහා සංගම් දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ප්‍රජාමූල බැංකු සංගම් හා ප්‍රජාමූල බැංකු සමිති ලෙස නම් කරන ලදී.

දර්ශනය:-

"තිරසර සංවර්ධනයේ ක්ෂුද්‍ර මූල්‍ය සවියවීම"

මෙහෙවර:-

"ධනාත්මක හා පරිසර හිතකාමී ආකල්ප ප්‍රවර්ධනය සමගින් සමාජ සවිබල ගැන්වීම සඳහා කාර්යක්ෂම හා සඵලදායී ලෙස ජාතියට ක්ෂුද්‍ර මූල්‍ය සේවා සැපයීම"

හැදින්වීම:-

1996 වර්ෂයේදී ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය ආරම්භවීමත් සමග එහි තවත් අංශයක් ලෙස "ණය අංශය" ආරම්භ කරන ලදී. කාලීන වශයෙන් සිදු වූ වෙනස්කම් හේතුකොට ගෙන මෙම අංශය 1998 වසරේදී "බැංකු මූල්‍ය කටයුතු" අංශය ලෙස නම් කරනු ලැබීය.

1995 අංක 30 දරණ ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ පනත අනුව සමෘද්ධි ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සමෘද්ධි බැංකු සංගම් 1996 දී ආරම්භ කළ අතර, අඩු ආදායම්ලාභීන්ගේ ඉතිරි කිරීම් වර්ධනය කර, ඒ තුලින් ආයෝජන ශක්තිය දිළිඳුකම පිටුදැකීමේ අරමුණුවලට අනුගතකරමින්, ප්‍රජා මූල මට්ටමින් ජනතාවගේ සකසුරුවම් පුරුද්ද වර්ධනය කිරිම, ප්‍රජාව ආර්ථික මට්ටමින් බලගැන්වීම හා ඔවුන්ගේ මූල්‍ය අවශ්‍යතා සංතෘප්ත කිරීම මඟින් ආදායම වර්ධනය කිරිම සඳහා මෙන්ම රටේ ජාතික නිෂ්පාදනයට වැඩි දායකත්වයක් ලබාගැනීමේ මූලික පරමාර්ථ ලඟා කර ගැනීම ක්ෂුද්‍රමූල්‍ය පද්ධතිය තුලින් සිදුකෙරේ. මෙම පද්ධතියට දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ ප්‍රජා මූල බැංකු අංශය, ප්‍රාදේශිය ප්‍රජාමූල බැංකු සමිති 332ක් සහ දිවයින පුරා පිහිටි ප්‍රජාමූල බැංකු 1074 ක් අයත් වේ. ප්‍රතිලාභීන්ගේ ඉතුරුම් වැඩි කිරීමටත් නිෂ්පාදන සහ සේවා වර්ධනයට අවශ්‍ය ප්‍රාග්ධනය (ණය පහසුකම්) සැපයීමටත්, අවිධිමත් ණය ගණුදෙනු අඩු කිරීමටත්, එමගින්, ඔවුන් ණය බරින් මුදවමින් ලාභදායී ආයතනික රටාවක් ඇති කිරීමටත් බලාපොරොත්තු විය.

පසුව 2013 අංක 01 දරණ දිවිනැගුම පනත අනුව, ආර්ථික සංවර්ධන ක්‍රියාවලිය පුළුල් කිරීමෙහිලා සහ දිළිඳුබව අවම කිරිම සඳහා මෙන්ම සමාජ සාධාරණත්වය සහතික කිරීමේ ජාතික ප්‍රතිපත්තිය බලාත්මක කිරීම උදෙසා වූ ප්‍රමුඛ අභිමතාර්ථය මුදුන්පත් කරගැනීමේ අරමුණින්, පවතින වාණිජ බැංකු පද්ධතිය විසින් සේවා සැපයීමේදී ප්‍රමුඛත්වයක් නොදක්වන ලද අඩු ආදායම්ලාභීන් කෙරෙහි නිසි අවධානයක් යොමු කරමින්, පහත අරමුණු ලඟා කර ගැනීමට මෙම අංශය 2015 වසරේදී ද මෙම අංශය කටයුතු කරන ලදී.

අරමුණු

01. දිවිනැගුම ප්‍රතිලාභීන්ගේ ඉතිරි කිරීමේ පුරුද්ද ප්‍රවර්ධනය කිරීම
02. ආයෝජන හැකියාව වැඩි දියුණු කිරීම
03. නිෂ්පාදන හැකියාව වැඩි දියුණු කිරීම මගින් ආදායම වර්ධනය කිරීම
04. දිවිනැගුම ප්‍රතිලාභීන්ට ණය පහසුකම් සැපයීම
05. දිවිනැගුම ප්‍රජාමූල බැංකුවල ප්‍රවර්ධනය සඳහා අවශ්‍යවන්නාවූ පහසුකම් සහ පුහුණුවීම් සැපයිම.

ඒ අනුව, පිහිටුවන ලද දිවිනැගුම ප්‍රජාමූල බැංකු සංගම් හා ප්‍රජාමූල බැංකු සමිතිවල ප්‍රධාන මෙහෙයුම් කාර්යාලය බවට ප්‍රධාන කාර්යාලයේ බැංකු මූල්‍ය කටයුතු අංශය පත්වූ අතර, ඉහත

සදහන් අරමුණු කරා මෙම අංශය මෙහෙයවීම බැංකු මූල්‍ය කටයුතු අංශයේ වගකීම සහ කාර්ය භාරය බවට පත්විය.

ප්‍රජාමූල බැංකු අංශයේ කාර්යභාරය

1. බැංකු පද්ධතිය සඳහා නව ණය ක්‍රම හඳුන්වා දීම හා ඒ සඳහා අවශ්‍ය චක්‍රලේඛ හා මෙහෙයුම් උපදෙස් නිකුත් කිරීම.
2. අනෙකුත් මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය වන්නාවූ මඟ පෙන්වීම්, උපදෙස් නිකුත් කිරීම.
3. තැන්පතු ප්‍රවර්ධන වැඩ සටහන් හඳුන්වා දීම හා ඒ සඳහා අවශ්‍ය මඟ පෙන්වීම් හා උපදෙස් නිකුත් කිරීම.
4. බැංකු අරමුදල් ආයෝජනය කිරීම හා ප්‍රාදේශීය මට්ටමින් උපදෙස් නිකුත් කිරීම.
5. ක්ෂුද්‍ර මූල්‍ය රක්ෂණ කටයුතු සිදු කිරීම.
6. සියළු බැංකුවල ජාතික මට්ටමින් විමර්ශණ කටයුතු සිදු කිරීම හා ඒ පිළිබඳ උපදෙස් නිකුත් කිරීම.
7. දිවිනැගුම ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතිවල අවසාන ගිණුම් සඳහා ලබාදෙන විගණන වාර්තා අනුව, අවසන් ගිණුම් සහතික කිරීම හා ලාභ විසර්ජනය සඳහා නියෝග ලබාදීම.
8. බැංකු සඳහා ප්‍රතිමූල්‍ය ණය පහසුකම් සැපයීම හා ණය විශ්ලේෂණ කටයුතු සිදු කිරීම.
9. දිවිනැගුම ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති සඳහා ඉඩම් පවරා ගැනීම/මිලට ගැනීම සහ බැංකු ගොඩනැගිලි ඉදි කිරීම සඳහා අරමුදල් සැපයීම හා වත්කම් කළමනාකරණය.
10. දිවිනැගුම ප්‍රජාමූල කළමනාකරණ මණ්ඩලය රැස් කිරීම, කළමනාකරණ මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීම හා එම නියෝග ක්‍රියාත්මක කිරීම.
11. සියළුම ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතිවල අධීක්ෂණ, ප්‍රගති පාලනය, පසු විපරම් කිරීම.
12. ලංකා විදුලිබල මණ්ඩලය හා එක්ව විදුලි අත්වැල ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
13. දිවිනැගුම ප්‍රතිලාභීන්, ප්‍රජාමූල බැංකු සමිති හරහා පිළිගත් ආයතන හා සංවිධාන මඟින් දියත් කරන ව්‍යාපෘති සමඟ සම්බන්ධීකරණය කිරීම.

14. ජීවනෝපාය හා අලෙවි අංශ ක්‍රියාත්මක කරන වැඩ සටහන්වලට ප්‍රජාමූල බැංකු සමිතිවල නිර්මාණශීලී දායකත්වය ලබාදීමට කටයුතු කරවීම.

මේ අනුව බැංකුමූල්‍ය කටයුතු අංශයේ ක්‍රියාකාරීත්වය දෙයාකාරවේ.

1. ප්‍රජාමූල බැංකු සංගම් වැඩසටහන.
2. බැංකු සංගම් තැන්පතු වැඩසටහන.

13.1. ප්‍රජාමූල බැංකු සංගම් වැඩසටහන.

බැංකු සංගම්වල ආරම්භය අදියර 07 කින් ක්‍රියාත්මක වූ අතර, 2015.12.31 දින වන විට උතුරු නැගෙනහිර දිස්ත්‍රික්ක ඇතුළුව දිවයින පුරා බැංකු සංගම් 1,074 ක් හා ප්‍රජාමූල බැංකු සමිති 332ක් ක්‍රියාත්මක විය.

මේ අනුව බලන විට, ප්‍රජාමූල බැංකු සංගම් ලෙස ආරම්භ වූ ශාඛා ජාලය මෙරට ක්ෂුද්‍ර මූල්‍ය ක්ෂේත්‍රයේ දීප ව්‍යාප්තව විහිදී ඇති විශාලතම කුඩා මූල්‍ය බැංකු ආයතනික ව්‍යුහය බවට කෙටි කාලයක් තුලදී පත්වී ඇති අතර, ප්‍රජාමූල බැංකු සංගම් පද්ධතිය ජාත්‍යන්තර මට්ටමින් ක්ෂුද්‍ර මූල්‍යක්ෂේත්‍රය තුල කැපී පෙනෙන ස්ථානයක් හිමි කරගෙන ඇත. සුළු මූල්‍යකරණයේ දැවැන්තයින් අතර, කැපී පෙනෙන ස්ථානයක් හිමි කරගෙන සිටින ප්‍රජාමූල බැංකු සංගම් පද්ධතිය, දිළිඳුකම පිටු දැකීමේ අරමුණුවලට අනුගත වෙමින්, තැන්පතු ඒකරාශීකරණය අතින් විශේෂත්වයක් හිමි කරගෙන සිටින අතර, නව බැංකු තාක්ෂණික ක්‍රමවේදයන් අනුගමනය කරමින් බැංකු සංගම් පරිගණක ගත කිරීමේ කටයුතු ආරම්භ කර ක්‍රියාත්මක වෙමින් පවතී.

13.1.1 බැංකු සංගම්වල සාමාජිකත්වය හා කොටස් ප්‍රාග්ධන ප්‍රගතිය

දිවිනැගුම ප්‍රතිලාභින් රු.500/- ක කොටසක් මිලදී ගැනීමෙන්, ඔවුනට ප්‍රජාමූල බැංකු සංගමයේ සාමාජිකත්වය හිමිවන අතර, ඔවුන් බැංකුවේ කොටස්කරුවන් බවට පත්වේ.

වගුව - **29** - බැංකු සංගම්වල සාමාජිකත්වය සම්බන්ධ ප්‍රගතිය - **(2000 - 2015)**

වර්ෂය	ගැහැණු	පිරිමි	එකතුව	පසුගිය වසරක සාපේක්ෂ වර්ධනය	වර්ධනය අනුපාතය %
2000	943,142	628,094	1,571,236	326,300	26
2001	1,042,158	663,905	1,706,063	134,827	9
2002	1,149,226	716,833	1,866,059	159,996	9
2003	1,275,273	777,222	2,052,495	186,436	10
2004	1,351,769	806,470	2,158,239	105,744	5
2005	1,428,848	824,846	2,253,694	95,455	4
2006	1,516,985	853,604	2,370,589	116,895	5
2007	1,575,509	872,490	2,447,999	77,410	3
2008	1,641,872	859,900	2,501,772	53,773	2
2009	1,691,112	896,947	2,588,059	86,287	3
2010	1,830,840	970,693	2,801,533	213,475	8
2011	1,881,808	987,740	2,869,548	68,015	2
2012	2,079,173	1,078,546	3,157,719	288,171	9
2013	2,199,135	1,121,833	3,320,968	163,249	5
2014	2,389,133	1,214,461	3,603,594	282,626	7.8
2015	2,503840	1,253,016	3,756,856	153,262	4.08

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

වසර 15 ක් තුල සාමාජිකත්වයේ ව්‍යාප්තිය ඉහත සංඛ්‍යා සටහන මඟින් දැක්වේ. 2015 වර්ෂයේදී නව සාමාජිකයින් 153,262ක සංඛ්‍යාවක් මෙම වැඩ සටහනට අළුතින් දායක වී ඇති අතර, විවිධ ආර්ථික හා සාමාජික ප්‍රශ්න හමුවේ, මූල්‍ය ආයතන මුහුණපෑ අර්බුදකාරී ආර්ථික තත්ත්වයන්තුල ද අපගේ ප්‍රජාමූල බැංකු සංගම් කෙරෙහි ගණුදෙනුකරුවන් තබා ඇති විශ්වාසය මේ තුල ගම්‍යමාන වේ.

විශේෂයෙන් 2015 වසර තුලදී ප්‍රජාමූල බැංකු හරහා හදුන්වාදෙන ලද දිරිය සවිය විශේෂ ණය යෝජනා ක්‍රමය ද ඇතුලත්ව එතෙක් ක්‍රියාත්මක වූ ස්වයං රැකියා, වගා, මිහිජය, ධීවර, ස්වශක්ති, ආපදා, කිරුල ණය, යොවුන් දිරිය, පාරිභෝගික, ජීවනෝපාය වැනි ණය යෝජනා ක්‍රමද මෙම වර්ධනය සඳහා බලපා ඇත

පහත වගුවෙන් 2000 - 2015 දක්වා කාලය තුලදී බැංකු සාමාජිකයින් ගෙවන ලද කොටස් මුදල් පිළිබඳ විස්තරයක් දැක්වේ.

වගුව - 30 - සාමාජිකයින් ගෙවූ කොටස් මුදල් (2000 – 2015)

වර්ෂය	මුදල (රු.ද.ල.)	වර්ධනය (රු.ද.ල.)	වර්ධන අනුපාතය (%)
2000	985.16	397.98	67.80
2001	1,383.15	397.99	40.40
2002	1,679.79	296.64	21.40
2003	1,930.37	250.57	14.90
2004	2,206.62	276.25	14.30
2005	2,601.01	394.40	17.90
2006	3,096.44	495.42	19.00
2007	3,639.53	543.10	17.50
2008	3,989.90	350.37	9.63
2009	4,212.42	222.52	5.58
2010	4,790.47	578.05	13.72
2011	5,370.53	580.06	12.11
2012	6,380.00	1,009.69	15.83
2013	7,101.00	721.00	10.15
2014	8,499.50	1,398.50	16.45
2015	9:927.81	1,428.31	14.39

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

පහත ප්‍රස්තාරයෙන් 2000 - 2015 දක්වා කාලය තුලදී කොටස් ප්‍රාග්ධනයේ වර්ධන අනුපාත දැක්වේ.

ප්‍රස්ථාරය- 09

කොටස් ප්‍රාග්ධනයේ වර්ධන අනුපාතය (%) - 2000 - 2015



ලා

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

වසර 15 ක් තුල කොටස් ප්‍රාග්ධනයේ ව්‍යාප්තිය අංක 30 වගුවෙන් හා අංක 09 ප්‍රස්තාරයෙන් පෙන්නුම් කෙරේ. ආරම්භක අවධියේ කොටස් ප්‍රාග්ධනයේ වර්ධන අනුපාතය 68% ක් වැනි ඉහල අගයක් පෙන්නුම් කළ ද, පසුගිය වර්ෂවලදී වර්ධන අනුපාතය සීඝ්‍ර ලෙස පහල ගොස් ඇත. ප්‍රවර්ථන වර්ෂයේදී පෙර වර්ෂයට සාපේක්ෂව කොටස් ප්‍රාග්ධනයේ වර්ධනයක් පෙන්නුම් කලද වර්ධන අනුපාතය මුල් කාලීන වර්ධනයට සාපේක්ෂව අඩු වී ඇත. කෙසේ වුවත්, ප්‍රවර්ථන වර්ෂයේ කොටස් ප්‍රාග්ධනයේ වර්ධනය සලකා බලන විට, කොටස් ප්‍රාග්ධන අනුපාතයන් පහළ යාමක් පෙන්නුම් කෙරේ. මෙම තත්වය තවදුරටත් විශ්ලේෂණය කරමින් බැංකු සංගම්වල ස්ථිර පැවත්මට දායක වන පරිදි බැංකු මූල්‍ය අංශයේ ඉදිරි සැළසුම් සකස් කිරීම කෙරෙහි අවධානය යොමු කර ඇත.

2014 වර්ෂයේ රු.මිලියන 8,499.5 ක් වූ කොටස් ප්‍රාග්ධනය, 2015 වර්ෂයේ අවසානයේදී රු.මිලියන 9,927.81 දක්වා වර්ධනයක් පෙන්නුම් කරයි.

13.2 බැංකු සංගම් තැන්පතු වැඩසටහන.

පහත සඳහන් වගුවෙන්, 2000 – 2015 කාලය තුලදී සාමාජික, සමාජික නොවන, සමූහ, ළමා සහ දිරිය මාතා තැන්පතු පිලිබඳ තොරතුරු දැක්වේ.

වගුව - 31 සාමාජික, සමාජික නොවන, සමූහ, ළමා සහ දිරිය මාතා තැන්පතු - 2000 – 2015

වර්ෂය	සංඛ්‍යාව	වර්ධනය	මුදල (රු.)	වර්ධනය(රු.)
2000	2,645,574	1,220,922	2,033.45	1,264.50
2001	3,035,233	389,659	3,111.16	1,077.71
2002	3,296,569	261,336	3,857.10	745.94
2003	3,680,786	384,217	4,710.80	853.70
2004	3,989,539	308,753	5,751.81	1,041.01
2005	4,229,575	240,036	6,824.88	1,073.07
2006	4,394,498	164,923	8,131.66	1,306.78
2007	4,613,504	219,006	9,875.63	1,743.97
2008	5,081,229	467,725	11,356.79	1,481.16
2009	5,167,854	86,625	13,536.65	2,179.86
2010	5,505,853	337,999	15,906.77	2,370.12
2011	5,524,025	18,172	18,907.33	3,000.56
2012	6,206,484	682,459	20799.06	1,891.73
2013	6,383,307	176,823	23,916.57	3,117.52
2014	6,822,409	439,102	29,436.10	5,519.53
2015	7,096,317	273,908	36,528.03	7,091.93

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

පහත සඳහන් ප්‍රස්තාරයෙන්, ඉහත තැන්පතු පිළිබඳව වැඩිදුර පැහිදිලි කිරීමක් පෙන්නුම් කරයි.

ප්‍රස්ථාරය-10 - තැන්පතුමුදල් වර්ධන (%)



මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

ප්‍රතිලාභීන් විසින් හා අඩු අදායම්ලාභී ජනතාව විසින් 2015 වසර තුල මිලියන 7,091.93 මුදල් තැන්පත් කරමින් බැංකු සංගම් වැඩසටහන කෙරෙහි තවදුරටත් විශ්වාසය තබා කටයුතු කර ඇති අතර, විශේෂයෙන් 2015 සිංහල හා හින්දු අළුත් අවුරුදු උත්සවය සඳහා වූ නව අවුරුදු ඉතුරුම් වැඩ සටහන හා මාර්තු 8 දිනට යෙදෙන ලෝක කාන්තා දිනය ඉලක්ක කොට ක්‍රියාත්මක කරන ලද දිරිය මාතා තැන්පතු වර්ධන වැඩසටහන් මෙම තැන්පතු ප්‍රසාරණය කෙරේ බලපෑම් කර ඇත. අනෙකුත් තරඟකාරී ක්ෂුද්‍ර මූල්‍ය ආයතන සමඟ සසඳන විට මෙවන් වර්ධනයක් අත්පත් කර ගැනීම අගය කළ යුතුය.

13.3 ප්‍රජාමූල බැංකු සංගම් ණය වැඩසටහන

මේ යටතේ 2015 වසර තුලදී පහත සඳහන් ණය පහසුකම් දිවිනැගුම ප්‍රතිලාභීන්ට හා වෙනත් අඩු ආදායම්ලාභී ජනතාවට සපයන ලදී.

- දිවිනැගුම සහනාධාරලාභීන් ඇතුළු අඩු ආදායම්ලාභීන්ගේ ව්‍යවසායකත්ව හැකියාවන් හඳුනාගෙන, ස්වශක්තිය මගින් දුගී බවින් මිදීමට අවශ්‍ය පරිසරය ගොඩ නැංවීමට අවශ්‍ය සුළු මූල්‍යකරණ පහසුකම ප්‍රජාමූල බැංකු සංගම් ණය ක්‍රමය යටතේ සිදුවේ.

- සාමාජිකයින්ගේ ප්‍රාග්ධන අරමුදල් හා හදිසි මුදල් අවශ්‍යතා පිරිමැසීම සඳහා වූ විශේෂ ණය වැඩසටහන් කිහිපයක් හඳුන්වා දී ඇත.

- ස්වයං රැකියා, මිහිජය ණය, කිරුළ සංවර්ධන, යොවුන් දිරිය, ජීවනෝපාය ණය වැඩසටහන් තුලින් ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා රු.100,000 සිට රු. 250,000/- දක්වා ණය නිදහස් කෙරේ. වගා කටයුතු සඳහා වූ අරමුදල් සඳහා රු. 75,000 දක්වා ණය මුදල් ලබාගැනීමට පහසුකම් සලසා ඇත. 2010 වසර අග භාගයේදී ක්‍රියාත්මක කරන ලද කිරුළ සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ එතෙක් ක්‍රියාත්මක කරන ලද ස්වයංරැකියා රු.100,000යේ ණය සීමාව රු.250,000/- දක්වා වැඩි කරන ලදී.

  - නිවසක් ඉදිකිරීම, අඩක්නිමවූ නිවාසයක වැඩ අවසන්කිරීම, නිවස අළුත්වැඩියාව වැනි අවශ්‍යතා වෙනුවෙන් රු.50,000/- දක්වා ණය පහසුකම් ලබාගෙන, නිවසේ අවශ්‍යතා සම්පූර්ණ කරගැනීමට අවස්ථාව සලසා ඇත.

  - හදිසි මුදල් අවශ්‍යතාවලදී ගිනි පොලීකරුවන්ගේ ග්‍රහණයෙන් මිදී ඉතා පහසුවෙන් මුදල් අවශ්‍යතා සම්පූර්ණ කරගැනීමට පාරිභෝගික, ආපදා, ස්වශක්ති ණය යෝජනා ක්‍රම තුලින් සමාජිකයින් හට සහනයක් දී ඇත.

  - 2010 වසර අවසානයේ ආරම්භ කරන ලද විදුලි අත්වැල ණය යෝජනා ක්‍රමය යටතේ සමෘද්ධි ප්‍රතිලාභී හා අඩු අදායම්ලාභී බැංකු සංගම් සාමාජිකයන්ට පදිංචි නිවසට විදුලිය ලබාගැනීම සඳහා රු30,000/- ක උපරිමයකට යටත්ව ණය ලබාදීම සිදු වේ.

- ආදායම් උත්පාදන ව්‍යාපෘති වෙනුවෙන් ලබාදෙන ණය සඳහා සමෘද්ධිලාභී හා අඩු ආදායම්ලාභීන් ගෙන් අය කරනුයේ 8% ක්, වැනි සහන වාර්ෂික පොලියකි.

- 2015 වර්ෂයේ අඩු ආදායම්ලාභී ප්‍රජාවට හඳුන්වා දෙන ලද රු.100,000ක දිරිය සවිය ණය යෝජනා ක්‍රමය යටතේ අයකරන පොලී අනුපාතය 4%කි.

- 1999 - 2015 කාලයතුලදී සාමාජිකයින් 462,970 දෙනෙකු සඳහා රු.මිලියන 26,184.25 ක මුදලක් ණය ලෙස ලබා දී ඇත. මීට අදාල වැඩිදුර විස්තර පහත වගුවේ දැක්වේ.

වගුව - 32 ණය නිකුත් කිරීම - 1999 - 2015

වර්ෂය	සංඛ්‍යාව (සමුච්චිත)	මුදල (රු.ද.ල.)	වසර තුල ණය නිකුත් කිරිම (රු.ද.ල.)
1999	209,818	966.31	966.31
2000	481,475	2,788.50	1,822.19
2001	813,334	5,552.75	2,764.24
2002	1,016,392	7,448.08	1,895.33
2003	1,340,126	10,503.30	3,055.22
2004	1,697,866	13,977.81	3,474.51
2005	2,149,135	20,725.03	6,747.22
2006	2,527,841	26,035.09	5,310.06
2007	2,952,840	32,843.04	6,807.93
2008	3,450,469	42,757.37	9,914.36
2009	3,721,662	48,352.73	5,595.36
2010	4,160,596	58,531.61	10,178.88

2011	4,682,822	71,721.04	13,189.43
2012	5,085,275	87,046.00	15,324.96
2013	5,360,115	98,056.00	11,010.00
2014	6,388,489	127,805.40	29,749.40
2015	6,851,459	153,989.65	26,184.25

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

1999 -2015 දක්වා කාලය තුළදී, ණය නිකුත් කිරීමේ වර්ධනය පහත සඳහන් ප්‍රස්තාරයෙන් දැක්වේ.

ප්‍රස්ථාරය-11 - ණය නිකුත් කිරීමේ වර්ධනය - 1999 -2015



මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

වගුව - 33 - 2015.12.31 දිනට සමුච්චිත ණය වර්ගීකරණය

ණය වර්ගය	මුදල (රු.මි.)	දායකත්ව %
ස්වයංරැකියා	84,900	55.13
වගා	11,084	7.19
වෙනත් (මිහිජය, ධීවර, ස්වශක්ති, ආපදා, කිරුළ ණය, යොවුන් දිරිය)	19,323	12.55
පාරිභෝගික	6,497	4.21
ජනපුබුදු	11,095	7.20
නිවාස	18,526	12.06
දිරිය සවිය	2,564	1.66
එකතුව	153,989	100.00

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

ඉහතන් දැක්වූ ණය වර්ගීකරණය පිළිබඳ තවදුරටත් පැහැදිලි කිරීම පහත ප්‍රස්තාරයෙන් දැක්වේ.

ප්‍රස්ථාරය-12 - 2015.12.31 දිනට ණය වර්ගීකරණය



මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

13.4 බැංකු සංගම්වල අතිරික්ත අරමුදල් ආයෝජනය කිරීම. (ස්ථිර තැන්පතු හා භාණ්ඩාගාර බිල් පත්වල)

බැංකු සංගම්වල වත්කම්වලින් උපරිම ප්‍රතිලාභ ලබාගැනීමේ අරමුණින් ණය ඉල්ලුම්කරුවන්ට ණය මුදා හැරීමෙන් අනතුරුව, අතිරික්ත අරමුදල් මහ සංගම් හරහා භාණ්ඩාගාර චක්‍රලේඛණ ප්‍රකාරව රාජ්‍ය බැංකුවල පමණක් ආයෝජන කිරීමට අවසර ලබාදී ඇත. මේ මගින් මහ සංගම් මූල්‍යමය වශයෙන් ශක්තිමත් කිරීම ප්‍රධාන අරමුණ වේ.

වගුව - 34 - ප්‍රජාමූල බැංකු සංගම්වල අතිරික්ත මුදල් ආයෝජනය කිරීම - 2000 – 2015

වර්ෂය	මුදල (රු.ද.ල.)	වර්ධනය (රු.ද.ල.)	වර්ධනය (%)
2000	1,620	1,038	178.00
2001	3,175	1,555	95.99
2002	5,097	1,922	60.54
2003	5,914	817	16.03
2004	7,828	1,914	32.36
2005	7,417	-411	(5.25)
2006	9,936	2,519	33.96
2007	13,791	3,855	38.80
2008	18,833	5,042	36.56
2009	24,039	5,206	27.64
2010	27,248	3,209	13.35
2011	39,048	11,800	43.31
2012	42,098	3,050	7.81
2013	55,690	13,592	3.229
2014	48,309	(7,381)	(15.27)
2015	55,906	7,597	13.53

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

ඉහත වගුවෙන් දැක්වූ විස්තරය, පහත ප්‍රස්තාරයෙන්ද පැහැදිලිව දැක්වේ.

ප්‍රස්ථාරය - 13 - මුදල් අනුපාත වර්ධනය - 2000 - 2015



මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

ප්‍රජාමූල බැංකු සංගම්වල අතිරික්ත මුදල් ආයෝජනය අංක 34 වගුව මගින් පෙන්නුම් කරන අතර, බැංකු සංගම් ආරම්භක අවධියේ ආයෝජන වර්ධනය ඉහළ අගයක් පෙන්නුම් කලද, පසුකාලීනව එය පහල ගොස් ඇත. ණය වැඩසටහනේ ප්‍රසාරණය හේතුවෙන් ආයෝජනය කළහැකි අරමුදල් ප්‍රමාණය ක්‍රමිකව සීමා වුවද, 2015 වර්ෂයේ තැන්පතු වර්ධනය හේතුවෙන් ආයෝජනයේ වර්ධනයක් පෙන්නුම් කෙරේ. එය සාධනීය ලක්ෂණයකි.

13.5 බැංකු මූලා කටයුතු අංශය තුල ක්‍රියාකාරකම්

බැංකු මූලා කටයුතු ශ්‍රී ලංකාව පුරා ස්ථාපිත ප්‍රජාමූල බැංකු සංගම් හා ප්‍රජාමූල බැංකු සමිති මෙහෙයුම් ඒකකය ලෙස කටයුතු කරගෙන යාමේදී, ඒ හා සබැඳිව අංශය තුළ විශාල කාර්ය භාරයක් සිදු කෙරේ.

ඒ අනුව, බැංකු මූලා කටයුතු අංශයේ සියළුම වියදම් එම අංශය විසින් දරා ගනු ලබන අතර, මීට අමතරව, ප්‍රජාමූල බැංකු හා ප්‍රජාමූල බැංකු සමිතිවල ගොඩනැගිලි ඉදි කිරීමේ හා අළුත්වැඩියා කිරීමේ වියදම්, විගණන නිලධාරීන් සම්බන්ධ ගමන් වියදම්, විමර්ශන නිලධාරීන් සඳහා ගමන් වියදම්, බැංකු සංගම් වාර්ෂික වාර්තා සැකසීම සඳහා වැයකරන වියදම් සහ පුහුණු වියදම් මේ යටතට ඇතුලත්වේ. එසේම, ප්‍රතිමූලා ණය බැංකු සංගම්වලට ලබාදීම, මිහිජය ණය පොලී ප්‍රතිපූර්ණය කිරීම සහ කාර්ය මණ්ඩල ණය පහසුකම් සඳහා අරමුදල් සපයන්නේද බැංකු මූලා අංශයේ ආදායමෙනි. බැංකු සංගම්වලට අදාල ප්‍රවර්ධන හා ප්‍රචාරණ කාර්යයන් සඳහා ද මෙම අංශයෙන් මුදල් වැය කෙරේ.

2015 වර්ෂයතුලදී බැංකු මූලා කටයුතු අංශයේ සමස්ත ආදායම හා වියදම පහත දැක්වේ.

වගුව - 35 - 2015 වර්ෂයට අදාල සමස්ත ආදායම හා වියදම

වියදම	රු.ද.ල.	ආදායම	රු.ද.ල.
අනිවාර්ය ඉතිරි කිරීම් සඳහා ගෙවූ පොලිය	763.00	ආයෝජනයෙන්	955.00
අංශයේ පරිපාලන වියදම්	151.00	ණයදීමෙන්	116.00
වියදම ඉක්මවූ ආදායම	**157.04**	බොල් ණය ආපසු අයවීම්	0
		අමතර ආදායම්	0.4
මුළු ආදායම	1,071.04	මුළු ආදායම	1,071.04

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

ඉහත වගුවේ දැක්වෙන තොරතුරු පහත සඳහන් ප්‍රස්තාර දෙකෙන්ද පැහැදිලිවේ.

ප්‍රස්ථාරය-14
වියදම (රු.ද.ල.)



මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

ප්‍රස්ථාරය-15
ආදායම (රු.ද.ල.)



මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

බැංකු මූල්‍ය කටයුතු අංශය කළමනාකරණ කටයුතු සඳහා පහත සඳහන් නිලධාරී මණ්ඩලය යොදවා බැංකු සංගම් කටයුතු මෙහෙයවීම, කාර්ය මණ්ඩල ණය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, ප්‍රගති කටයුතු හා අනෙකුත් මෙහෙයුම් කටයුතු සිදුකරනු ලබයි.

වගුව - 36 - බැංකු මූල්‍ය කටයුතු අංශයේ කාර්ය මණ්ඩලය

අ.අං	තනතුර	දැනට සිටින සංඛ්‍යාව
1	අධ්‍යක්ෂ	01
2	නි.අධ්‍යක්ෂ	-
3	ස.අධ්‍යක්ෂ	-
4	සමෘද්ධි කළමනාකරු	29
5	සම්බන්ධීකරණ නිලධාරී	01
6	ප්‍රවර්ධන නිලධාරී	01

7	සමෘද්ධි සංවර්ධන නිලධාරී	17
8	ලිපිකරුවන්	01
9	පරිගණක දත්ත සටහන්කරුවන්	0
10	යතුරු ලේඛිකා	0
11	කාර්යාල කාර්ය සහායක	02
12	රියදුරු	0
එකතුව		52

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

ඉහත සඳහන් කළ බැංකු මූල්‍ය අංශයට අදාල ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි විග්‍රහ කළ හැකිය.

13.6 ප්‍රජාමූල බැංකු සංගම්වල අනිවාර්ය ඉතිරි කිරීම් ගිණුම් ක්‍රියාවලිය

13.6.1 හැඳින්වීම

අඩු ආදායම්ලාභී ජනතාව වැඩි වැඩියෙන් ඉතිරි කිරීමට හුරුකිරීමක් වශයෙන් හා ඔවුන්ගේ අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් අනිවාර්ය ඉතිරි කිරීම් වැඩසටහන ආරම්භ කරන ලදී. මෙහිදී රජය මගින් දෙනු ලබන සහනාධාර මුදලින් කොටසක් මාසිකව අනිවාර්ය ඉතිරි කිරීම් ලෙස සෑම සහනාධාරලාභියකුටම වෙන් කෙරේ.

මේ වන විට දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින්නිකුත් කරනු ලබන සහනාධාර මුද්දර, පවුලේ සාමාජික සංඛ්‍යාව අනුව වෙනස් වේ. පවුලේ සාමාජික සංඛ්‍යාව 04 හෝ 04ට වැඩි නම් රු.3,500 ක් බැගින්ද, සාමාජික සංඛ්‍යාව 03ක් නම් රු.2,500 ක් බැගින්ද, සාමාජික සංඛ්‍යාව 3ට අඩුනම් රු.1,500 ක් බැගින්ද, සවිබල ගැන්වූ පවුලක් සඳහා රු.420 ක් බැගින්ද, ලබාදේ. එක් පවුලකට අදාල මෙම සහනාධාර වටිනාකමින් අනිවාර්ය ඉතිරි කිරීම් සඳහා පිළිවලින්, රු.300, රු.200, රු.100 හා රු.270 ක මුදලක් 2015 වසර සිට මාසිකව ප්‍රජාමූල බැංකුවේ පවතින ප්‍රතිලාභින්ගේ ගිණුම් සඳහා බැර කරනු ලබයි. 1995 සිට පැවති අනිවාර්ය ඉතිරි කිරීම් මුදල් ප්‍රධාන වශයෙන් අදියර දෙකකින් ක්‍රියාත්මකවේ.

1. 1999 නොවැම්බර් මස සිට 2012 වසර දක්වා අනිවාර්ය ඉතිරිකිරීම් අරමුදල්, අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඒ ඒ ප්‍රතිලාභීන් අයත්වන "බැංකු සංගම්" නමින් අදාල අනිවාර්ය ඉතිරි කිරීම් අරමුදල් මාසිකව ආයෝජනය පිණිස බැංකු මූල්‍ය අංශය වෙත එවනු ලැබ ඇත.

2. 1995 සිට 1999 ඔක්තෝබර් දක්වා මහජන බැංකුවේ හා ලංකා බැංකුවේ ආයෝජිත අරමුදල්වලින් (ප්‍රතිලාභීන් සතු අරමුදලින්) 25%ක් බැංකු මූල්‍ය අංශය වෙත ගෙන්වා ගෙන ආයෝජනය කිරීම සිදු කරන ලදී. 2012 මාර්තු මාසයේ සිට බැංකු සංගම් විසින්ම අදාල ආයෝජනය කරනු ලබන බැවින්, ප්‍රධාන කාර්යාලය මගින් අනිවාර්ය ඉතිරිකිරීම් සම්බන්ධව ආයෝජනයන් සිදු කරනු නොලැබේ.

බැංකු මූල්‍ය අංශයේ ආයෝජන කරන ලද අනිවාර්ය ඉතිරි කිරීම් අරමුදල් පිළිබඳ විස්තර පහත පරිදි වේ.

වගුව - 37 - ආයෝජනය සඳහා ලද අනිවාර්ය ඉතිරි කිරීම් - 2000 – 2013

වර්ෂය	අරමුදල් (රු.ද.ල.)	වර්ධනය (රු.ද.ල.)	වර්ධනය (%)
2000	1,045		-
2001	2,424	1,379	131.96
2002	3,852	1,428	58.91
2003	5,510	1,658	43.04
2004	6,652	1,142	20.73
2005	7,349	697	10.48
2006	8,282	933	12.70
2007	9,099	817	9.86

2008	9,960	861	9.46
2009	10,738	778	7.81
2010	12,886	2,148	20.00
2011	13,702	816	6.33
2012	11,726	(1,976)	(14.42)
2013	12,760	1,034	8.82
2014	-	-	-

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

ඉහත තත්වය පහත සඳහන් ප්‍රස්තාරයෙන් ද පැහැදිලි කෙරේ.

ප්‍රස්ථාරය-16 - අනිවාර්ය ඉතිරි කිරීම් - 2000 – 2014



මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

13.7 අනිවාර්ය ඉතිරි කිරීම් පොලී ගෙවීම

ආයෝජනය සඳහා බැංකු මූල්‍ය අංශය වෙත එවනු ලබන අනිවාර්ය ඉතුරුම් අරමුදල්, ආයෝජන ඒකකය හරහා ආයෝජනය කිරීමෙන් උපයන ලද පොලී මුදලෙන්, සෑම වසරක් අවසානයේම ඒ ඒ ප්‍රජාමූල බැංකු සමිති සඳහා පොලී ගෙවීම් සිදුකරනු ලැබේ. එමෙන්ම, 2006 වසරේ සිටම දිවිනැගුම සමිති ක්‍රියාකාරි හා ශක්තිමත් කිරීමේ අරමුණින් මෙම පොලී ගෙවීම ප්‍රජාමූල බැංකු සමිති ඔස්සේ සිදු කෙරේ. එලෙසම, ප්‍රජාමූල බැංකු සමිති/බැංකු සංගම් සඳහා තාක්ෂණික හා ඵලදායී ක්‍රම හඳුන්වාදීමේ අරමුණින් 2008 වසරේ සිට අනිවාර්ය ඉතිරි කිරීම් පොලී ගෙවීම සෘජුවම ප්‍රජාමූල සමිති ජංගම ගිණුමට ප්‍රේෂණය කිරීම මඟින් සිදු කෙරිණ. එම ක්‍රියාකාරිත්වය තුලින් බැංකු මූල්‍ය කටයුතු අංශයටද වසරකට මිලියන 3 ක පමණ අමතර ආදායමක් ලබා ගැනීමට හැකිවිය. (එනම්, මාර්ගස්ථ මුදල් රැඳවීමේ කාලය එක් දිනක් දක්වා අඩුකිරීම තුලින්) අනිවාර්ය ඉතුරුම් සඳහා ප්‍රතිලාභීන්ට ලබාදෙන පොලී ප්‍රතිශතය තරගකාරී වාණිජ බැංකු සමග සැසඳීමේ දී ඉහල අගයක් ගන්නා අතර, එය ගිණුම් හිමි ප්‍රතිලාභීන්ට ලබාදෙන විශේෂ වරප්‍රසාදයකි.

පහත වගුවෙන් 2000 - 2015 කාලයතුලදී, අනිවාර්ය ඉතිරිකිරීම් සඳහා ගෙවන ලද පොලී ප්‍රතිශත දක්වයි

වගුව - 38 - අනිවාර්ය ඉතිරි කිරීම් සඳහා ගෙවන ලද පොලිය - 2000 – 2015

වර්ෂය	ගෙවන ලද පොලී අනුපාතිකය %
2000	14.0
2001	17.75
2002	13.0
2003	8.1
2004	7.5
2005	7.75
2006	10.06
2007	14.0
2008	14.0
2009	14.0

2010	9.5
2011	7.1
2012	7.5
2013	6.5
2014	6.0
2015	6.0

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

ඉහත වගුවේ දැක්වෙන තත්වය පහත ප්‍රසත්තාරයෙන්ද පැහැදිලි කෙරේ.

ප්‍රස්ථාරය-17- අනිවාර්ය ඉතුරුම් සඳහා ගෙවනලද පොලී අනුපාතික (%)



මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

2015 වසරේ මූල්‍ය වෙළඳපොල පොලී අනුපාතය පහල අගයක්වුව ද, අනිවාර්ය ඉතුරුම් සඳහා 6.0% පොලී අනුපාතිකයක් බැංකු සංගම් වෙත ලබා දීමට හැකිවීම අගය කල යුතුය.

13.8 ණය යෝජනා ක්‍රමය

බැංකු මූල්‍ය කටයුතු අංශය විසින්, බැංකු සංගම් මගින් ක්‍රියාත්මක ණය යෝජනා ක්‍රමවලට අවශ්‍ය අරමුදල් සම්පාදනය කරන අතරම, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා ද ණය යෝජනා රැසක් දියත් කර ඇත. ඒ අනුව, බැංකු මූල්‍ය කටයුතු අංශය මගින් ක්‍රියාත්මක ණය වැඩසටහන් පහත පරිදි වර්ග කර දැක්විය හැක.

1 ප්‍රතිලාභීන් සඳහා ණය යෝජනා ක්‍රමය

2 කාර්ය මණ්ඩල සඳහා ණය යෝජනා ක්‍රමය

13.8.1 ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමය

බැංකු සංගම් ණය ලබා දෙන්නේ තමා විසින්ම ඒකරාශීකරණය කරනු ලබන තැන්පතු වලිනි. ඒ සඳහා බැංකු සංගම්වලට අවසර ඇත්තේ මුළු තැන්පතු වලින් 80% ක් දක්වා පමණි. ඉන් ඉදිරියට ලබාදෙන ණය සඳහා ඇති වන මූල්‍ය දුෂ්කරතා පියවීම සඳහා බැංකු මූල්‍ය කටයුතු අංශය විසින් බැංකු පොලී අනුපාතිකයට වඩා අඩු පොලී අනුපාතිකයක් යටතේ ප්‍රතිමූල්‍ය පහසුකම් බැංකු සංගම්වලට ලබාදේ. ස්වයං රැකියා, වගා, ධීවර, සත්ත්ව පාලන, වෙළදාම වැනි ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා ණය ලබාදේ. ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමය, ප්‍රජාමූල සමිති හරහා සිදුවන අතර, බැංකු මූල්‍ය කටයුතු අංශය වාර්ෂික 4% කට ප්‍රජාමූල සමිතිවලට මූල්‍ය පහසුකම් ලබාදෙන අතර, ප්‍රජාමූල සමිති විසින් ප්‍රජාමූල බැංකු සංගම්වලට 5% පොලියට ප්‍රතිමූල්‍ය ණය අරමුදල් ලබා දෙයි.

1999 -2015 කාලයතුලදී ප්‍රතිමූල්‍ය ණය වැඩසටහන ලබා ගත් ප්‍රගතිය පහත දැක්වේ.

වගුව - 39 - ප්‍රතිමූල්‍ය ණය වැඩසටහනේ ප්‍රගතිය - 1999 – 2015

වර්ෂය	ණය සංඛ්‍යාව	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	මුදාහල මුදල (රු.මි.)	අයවීමේ ප්‍රතිශතය (%)
1999	11	523	3.00	100
2000	175	5,578	52.00	92
2001	324	12,588	117.00	101
2002	472	18,400	177.00	100
2003	637	23,223	233.00	100
2004	786	27,605	283.00	101

2005	849	30,351	315.80	102
2006	971	36,155	389.00	100
2007	1,040	40,008	450.00	100
2008	1,072	42,631	499.71	100
2009	1,097	44,180	523.58	100
2010	1,110	45,284	571.11	91
2011	1,112	45,399	581.42	95
2012	1,132	46,145	613.12	100
2013	1,163	48,460	710.91	100
2014	1,175	49,332	761.64	100
2015	1,179	49,798	797.88	100

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

උක්ත වගුවේ ත්තවය පහත ප්‍රස්තාරයෙන්ද පැහැදිලි කෙරේ.

ප්‍රස්ථාරය-18 - ප්‍රතිමූලා ණය වැඩසටහනෙහි ප්‍රගතිය - 1999 - 2015



මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

2014 වසරේදී සහන අරුණ ණය වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේදී, ණය දීම සඳහා මුදල් ප්‍රමාණවත් නොවූ ප්‍රජාමූල බැංකු සඳහා බැංකු මූලා අංශය උපයාගත් මුදල් යොදවා ප්‍රතිමූලා ණය ලබාදෙන ලදී. සේවකයින් හට යතුරු පැදි ලබාදීම සඳහා ප්‍රමාණවත් මුදලක් නොමැතිවූ ප්‍රජාමූල බැංකු සමිති වෙත බැංකු මූලා අංශය විසින් උපයාගනු ලැබූ මුදල් යොදවා ප්‍රතිමූලා ණය ලබාදෙන ලදී.

2015 වසරේදී ක්‍රියාත්මක වූ දිරිය සවිය වැඩ සටහන සඳහා ණය ලබාදීමේ දී මුදල් ප්‍රමාණවත් නොවූ ප්‍රජාමූල බැංකු වෙනුවෙන් ඉහත පරිදිම බැංකු මූලා අංශය උපයාගත් මුදල් යොදවා ප්‍රතිමූලා ණය ලබාදෙන ලදී. සේවකයින්හට යතුරුපැදි ලබාදීම සඳහා ප්‍රමාණවත් මුදලක් නොමැති වූ ප්‍රජාමූල බැංකු සමිති වෙත බැංකු මූලා අංශය විසින් උපයා ගනු ලැබූ මුදල් යොදවා ප්‍රතිමූලා ණය ලබා දෙන ලදී.

2015 වසරේදී ක්‍රියාත්මක වූ දිරිය සවිය ණය වැඩසටහන සඳහා න්‍ය ලබාදීමේදී මුදල් ප්‍රමාණවත් නොවූ බැංකු වෙනුවෙන් ඉහත පරිදිම බැංකු මූලා අංශය උපයාගත් මුදල් යොදවා ප්‍රතිමූලා ණය ලබා දෙන ලදී.

2014 - 2015 කාලයතුලදී ප්‍රතිමූලා ණය වැඩ සටහන අත්කර ගෙන ඇති ප්‍රගතිය පහත දැක්වේ.

වගුව - 40 - ප්‍රතිමූලා ණය වැඩසටහනෙහි ප්‍රගතිය - 2014 – 2015

වර්ෂය	අදාල ණය වර්ගය	ණය සංඛ්‍යාව (බැංකු)	මුදල (රු.)
2014	සහන අරුණ -	**18**	**82,500,000**
2014	ප්‍රතිමූලා	**02**	**5,050,000**
2015	යතුරු පැදි ප්‍රතිමූලා	**36**	**558,077,600**

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

13.9 මිහිජය (8%, 10%) සහන පොලී ප්‍රතිපූරණය

සබඳ, ජන පුබුදු, ගෙදර යන ණය වැඩසටහන් 2010 වසරේ සිට අත්හිටුවා ඇති අතර, මෙම ණය යෝජනා ක්‍රමයට විකල්පයක් ලෙස ස්වයංරැකියා, පියස හා මිහිජය වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. මේ අනුව, ප්‍රජාමූල බැංකු සංගම් මගින් ක්‍රියාත්මක කරනු ලබන සියලුම ආදායම් උත්පාදන ව්‍යාපෘති සඳහා සහන පොලී ප්‍රතිපූරණයන් බැංකු මූල්‍ය අංශය මගින් සිදු කරන ලදී. බැංකු සංගම්වල මූල්‍ය අලාභයන් අවම කිරීම සඳහා සහන ණය පොලී ලබා දීම මෙහි අරමුණයි. 2013.12.31 දිනෙන් පසු අය කල පොලී සඳහා සහන පොලී ප්‍රතිපූර්ණය නොකල අතර, 2013.12.31 දක්වා අය කල පොලී සඳහා පමණක් මෙම වසරේදී ද පොලී සහන ලබා දෙන ලදී.

2009 - 2015 කාලය තුලදී ලබාදී ඇති සහන පොලී පිළිබඳ විස්තරයක් පහත වගුවෙන් දැක්වේ.

වගුව - 41 බැංකු සංගම් වෙත ලබා දී ඇති සහන පොලී ප්‍රමාණය - 2009 – 2015

වසර	මුදල (රු)
2009	250,143.00
2010	3,108,269.00
2011	2,496,830.25
2012	23,566,040.32
2013	91,706,854.90
2014	147,685,633.11
2015	240,179,298.54

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

ඉහත වගුවෙන් දැක්වෙන විස්තරය, පහත ප්‍රස්තාරය මගින්ද පැහැදිලි කෙරේ.

ප්‍රස්ථාරය-19 බැංකු සංගම් වෙත ලබා දී ඇති සහන පොලී ප්‍රමාණය - 2009 – 2015



මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

13.10 විදුලි අත්වැල ණය වැඩසටහන

සැමට විදුලිය සැපයීමේ අරමුණින් දිවිනැගුම ප්‍රතිලාභීන් හා අඩු ආදායම්ලාභී පවුල් ඒකක සදහා විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශය විසින් විදුලි අත්වැල ණය යෝජනා ක්‍රමය ආරම්භ කර ඇත. මෙම වැඩසටහනට ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශය මග පෙන්වූ අතර, වර්තමානයේ එය සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශයත්, ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය (වර්තමානයේ දිවිනැගුම දෙපාර්තමේන්තුව) හා ලංකා විදුලි බල මණ්ඩලයත් මේ සදහා සක්‍රිය දායකත්වය සපයයි.

දීප ව්‍යාප්ත දිවිනැගුම ප්‍රජාමූල බැංකු ජාලය හරහා එකවරම මෙම සහනදායි "විදුලි අත්වැල" ණය වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාල අරමුදල් බැංකු මූල්‍ය අංශය මගින් ලබා දෙනු ලබයි.

මෙම වැඩසටහනින් අපේක්ෂිත ප්‍රතිලාභ වන්නේ,

I. අඩු අදායම් ලාභීන් විසින් පවත්වාගෙන යන හෝ පවත්වාගෙන යාමට අපේක්ෂිත සුළු කර්මාන්ත හා අලෙවි සංවර්ධන වැඩසටහන් කාර්යක්ෂම කර ඔවුන්ගේ ආර්ථික ශක්තිය ඉහල නැංවීම.

II. දිවිනැගුම සංවර්ධන වැඩසටහන සඳහා ණය ඉල්ලුම වැඩිවී නව සාමාජිකයන් ප්‍රජාමූල බැංකු සංගම් වලට ඒකරාශි වී තැන්පතු වර්ධනය වීම.

III. බැංකු මූල්‍ය කටයුතු අංශය මගින් ලබාදෙන සේවා ගාස්තු හේතුකොටගෙන බැංකු සංගම් වල ආදායම් ශක්තියද ඉහල නැංවීමට හැකි වීම.

IV. ප්‍රජාමූල බැංකු සංගමවල මූල්‍ය ශක්තිය, කාර්යක්ෂමතාවය, විශ්වාසය තවදුරටත් වර්ධනය වීම.

මෙම විදුලි අත්වැල ණය වැඩසටහන සඳහා ප්‍රතිලාභින් වෙත ලබාදෙන උපරිම ණය මුදල රු. 30,000/= වන අතර, මාස 60 ක කාලයක් තුල 12% වාර්ෂික පොළිය සමග ණය මුදල වාරික වලින් අයකර ගනු ලැබේ.

මෙහිදී විදුලි බල මණ්ඩලය මගින් හඳුන්වා දෙන ණය ඉල්ලුම් පත්‍රය අදාල පාරිභෝගික සේවා මධ්‍යස්ථානය මගින් ලබා ගෙන, මෙහෙයුම් උපදෙස් අංක 05 පරිදි සුදුසුකම් සම්පූර්ණ කර ඇති ඉල්ලුම් පත්‍ර පිලිවෙලින් දිවිනැගුම සංවර්ධන නිළධාරී, දිවිනැගුම කළමනාකරු හා ප්‍රාදේශිය ලේකම් විසින් නිර්දේශ කර, විදුලිබල මණ්ඩලය වෙත ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමෙන් පසු විදුලි පහසුකම් ලබාදෙනු ලබයි.

2010 වර්ෂය තුල මෙම විදුලි අත්වැල ණය වැඩසටහනට සම්බන්ධ ද්විපාර්ශ්වික ගිවිසුම් ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය (වර්තමානයේ දිවිනැගුම දෙපාර්තමේන්තුව) හා ලංකා විදුලි බල මණ්ඩලය විසින් අත්සන් කල අතර, එම වර්ෂයතුල ණය නිකුත් කිරීමක් සිදු කර නොමැත.

2014 වර්ෂය තුලදීද මෙම විදුලි අත්වැල ණය වැඩ සටහන සම්බන්ධයෙන් ද්විපාර්ශ්වික ගිවිසුම දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව හා ලංකා විදුලි බල මණ්ඩලය විසින් අත්සන් කරන ලදී.

මෙම වැඩසටහනේ ප්‍රගතියට අදාල දත්ත පහත වගුවෙන් දැක්වේ.

වගුව - 42 විදුලි අත්වැල ණය වැඩ සටහනේ ප්‍රගතිය -2011 – 2015

වර්ෂය	බැංකු මූල්‍ය අංශය විසින් විදුලිබල මණ්ඩලයට			විදුලි බල මණ්ඩලය විසින් ප්‍රතිලාභීන්/අඩු ආදායම්ලාභීන්ට	
	ලබාදී ඇති			ලබාදී ඇති	
	ණය සංඛ්‍යාව	මුදල (රු.මි)	පිටහිටි මුදල (රු.මි)	ණය සංඛ්‍යාව	මුදල (රු.මි)
2011	02	350	335.08	20694	354
2012	07	747	675.32	44932	853
2013	09	1080	861.67	64520	1237
2014	13	1537	1106.18	80153	1537
2015	15	1782	1036.93	97831	1899

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

13.11 දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා වන ණය යෝජනා ක්‍රමය

13.11.1 පාරිභෝගික ණය යෝජනා ක්‍රමය

2004 පෙබරවාරි මාසයේදී ආරම්භ වූ මෙම වැඩසටහන 2008 දක්වා එවක සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සඳහා පමණක් 9% ක වාර්ෂික පොලී අනුපාතිකයට රු.50,000 ක ණය මුදලක් ලබාදෙන ලදී. මෙම ණය ක්‍රමය සියළුම කාර්ය මණ්ඩලයට විවෘතය. ණය මුදල ආපසු ගෙවීමේ කාලය මාස 60 කි. 2010.10.18 දින සිට, 50,000/- ක් වූ ණය මුදල රු. 100,000/- දක්වා වැඩි කරන ලදී. 2013.12.18 දින සිට මෙම වැඩසටහන දිස්ත්‍රික්ක වෙත විමධ්‍යගත කර ඇත.

2015.01.19 දින සිට මෙම ණය ලබාදීම අත්හිටුවා ඇති අතර, අය කිරීම් දිස්ත්‍රික්ක මට්ටමින් සිදු කරනු ලබයි.

සේවක පාරිතෝෂික ණය පිළිබඳ දත්ත විස්තරයක් පහත වගුවේ දැක්වේ.

වගුව - 43 - 2015.12.31 දිනට සමුච්චිත සේවක පාරිභෝගික ණය

ලබාදුන් ණය සංඛ්‍යාව	මුදල (රු.ද.ල.)
28308	2001.00

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

13.11.2 කාර්ය මණ්ඩලය සඳහා නිවාස ණය යෝජනා ක්‍රමය

දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා 2004 ජූනි මාසයේදී ආරම්භ වූ මෙම වැඩසටහනට ප්‍රජාමූල බැංකු අංශයේ ආයෝජන වලින් උපයාගත් ආදායම් මගින් ප්‍රතිපාදන වෙන් කරන ලදී. ණය වැඩසටහන යටතේ ඉඩමක් මිලට ගැනීම, නව නිවසක් ඉදිකිරීම, නිවසක් මිලට ගැනීම හා නිවසකට කොටසක් එකතු කිරීම හෝ පුළුල් කිරීම යන කරුණු සඳහා ණය ලබාදීම සිදු කරයි. ණය මුදලෙහි ආපසු ගෙවන කාලය වසර 15 දක්වා දීර්ඝ කර ඇත. නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ 2015.12.31 දිනට පහත වගුවේ පරිදි ණය නිකුත් කර ඇත. 2010.01.01 දින සිට මීට අදාල පොලී අනුපාතය 10% දක්වා අඩු කර ඇති අතර, 2014.11.01 දින සිට මෙම ණය අයකිරීම් ද දිස්ත්‍රික් මට්ටමට විමධ්‍යගත කර ඇත. 2015.01.19 දින සිට මෙම ණය ලබාදීම අත්හිටුවා ඇත.

වගුව - 44 - 2015.12.31 දිනට (සමුච්චිත) නිවාස ණය

ලබාදුන් ණය සංඛ්‍යාව	මුදල රු.ද. ලක්ෂ
2129	905.08

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

13.11.3 යතුරුපැදි ණය යෝජනා ක්‍රමය

2004 නොවැම්බර් මාසයේදී ආරම්භ වූ මෙම ණය වැඩසටහන සඳහා, බැංකු මූල්‍ය කටයුතු අංශයේ ආයෝජනවලින් උපයාගත් ආදායමින් ප්‍රතිපාදන වෙන් කරන ලදී. දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ස්ථිර කාර්ය මණ්ඩලය සඳහා පමණක් මෙම ණය වැඩසටහන සීමා වී ඇත. 10% ක වාර්ෂික පොලී අනුපාතයක් යටතේ උපරිමය රු.150,000 ක ණය මුදලක් මාස 60 ක ආපසු ගෙවීමේ කාලය මත යතුරු පැදි ණය ලබාදෙනු ලැබිණි.

2014.12.31 දිනෙන් පසු යතුරු පැදි ණය දිස්ත්‍රික් මට්ටමින් නිකුත් කිරීමට භාර දී තිබූ අතර, 2014.11.01 දින සිට මෙම ණය අයකිරීම් ද දිස්ත්‍රික් මට්ටමට විමධ්‍යගත කර ඇත. 2015.01.19 දින සිට මෙම ණය ලබාදීම අත්හිටුවා ඇත.

මීට අදාල දත්ත විස්තරයක් පහත වගුවේ දැක්වේ.

වගුව - 45 2015.12.31 දිනට සමුච්චිත යතුරු පැදි ණය

ලබාදුන් ණය සංඛ්‍යාව	මුදල රු.මි.
4067	368.03

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

13.12 සේවක ශාරීරික අනතුරු රක්ෂණය

ප්‍රජාමූල බැංකු සංගම් සතු මුදල් බැංකු සංගම්වල සිට වානිජ බැංකුවල තැන්පත් කිරීමට ගෙනයාමේදී හා වානිජ බැංකුවේ සිට ප්‍රජාමූල බැංකු සංගම්වලට මුදල් ගෙන ඒමේදී සිදුවන මුදල් මංකොල්ලකෑම්වලදී බැංකු කාර්ය මණ්ඩලයට සිදුවන ශාරීරික අනතුරු වෙනුවෙන් මෙම වැඩසටහන යටතේ වන්දි ප්‍රදානය කරනු ලැබේ. 2005 ඔක්තෝබර් මාසයේ සිට ක්‍රියාවට නැංවූ ශාරීරික අනතුරු රක්ෂණ අරමුදලට සෑම බැංකු සංගමයක්ම වසරකට රු. 1,000/- බැගින් වාරික මුදලක් ගෙවා රක්ෂණ ආවරණය ලබාගත යුතුය. මේ යටතේ ලබාගත හැකි උපරිම වන්දි මුදල 2015.08.19 දින සිට ක්‍රියාත්මක වන පරිදි සියළුම නිලධාරීන් සඳහා රු.300.000ක් වේ. 2014 වසරේ මෙම වැඩසටහන යටතේ රක්ෂණ වාරික ලෙස බැංකු සංගම් වෙතින් රු.808,400/- ක මුදලක් ලැබී ඇති අතර, 2015 වසරේ එලෙස ලැබී ඇති මුදල රු.1,295,480.00 කි. ශාරීරික අනතුරු සඳහා වන්දි ලෙස 2015.12.31 දිනට රු.1,786,270/- ක මුදලක් ගෙවා ඇත.

13.13 දිවිනැගුම ප්‍රජාමූල බැංකු සංගම් අතරුදි මුදල් රක්ෂණය

13.13.1 දිවිනැගුම ප්‍රජාමූල බැංකුසංගම්වල අතරුදී මුදල් හා එකී බැංකු සංගම්වල සිට වාණිජ බැංකුවලට රැගෙන ඒමේදී සහ රැගෙන යාමේදී ඇතිවන මුදල් සොරකම් කිරීම හෝ මංකොල්ලකෑම් වලදී මුදල්වලට ඇතිවන හානිය මෙමගින් ප්‍රතිපූර්ණය කෙරේ.

13.13.2 බැංකු සංගම් හා මහා සංගම්වල එදිනෙදා ද්‍රවශීලතා වුවමනාවන් සලකා බලා ඒ අනුව මෙම රක්ෂණ ආවරණය සඳහා බැංකු මූල්‍ය අංශයෙන් විමසීමට අවස්ථාව සලසා ඇත. ඒ සඳහා වාර්ෂිකව වාරික මුදල් බැංකු මූල්‍ය අංශයට එවා රක්ෂණ ආවරණය ගැනීමට අවශ්‍ය කටයුතු සංවිධානය කර ඇත. එහි ප්‍රගතිය 2015.12.31 දිනට බැංකු සංගම් 1074 හා මහා සංගම් 270 ක් මෙම රක්ෂණය ආවරණය ලබාගෙන ඇත.

13.13.3 සේවක ශාරීරික අනතුරු සහ අතරුදී මුදල් රක්ෂණය සම්බන්ධයෙන් 2015 වසර තෙක් නිකුත් කර තිබූ සියළුම චක්‍රලේඛ හා සංශෝධන අවලංගු කර, 2015.08.14 දින නව චක්‍රලේඛයක් නිකුත් කර ඇත. ඒ අනුව, 2015 වසරේදී අතරුදී මුදල්

රක්ෂණ සීමාව රුපියල් ලක්ෂ 10 සිට රුපියල් ලක්ෂ 20 දක්වා ඉහල නැංවීමට කටයුතු කර ඇත.

13.13.4 බැංකු සංගම් (ශාරිරික අනතුරු රක්ෂණ මුදල ද ඇතුලත්ව) හා මහා සංගම් විසින් එවන ලද වාරික මුදල් බැංකු මූල්‍ය අංශය විසින් ගොඩනංවා ඇති අරමුදලකට බැර කර ඵලදායී ආයෝජනවල යොදවා අරමුදල පුළුල් කර ඇත.

13.13.5 2015.12.31 දිනට බැංකු සංගම් සඳහා අතරැදි රක්ෂණ වන්දි ලෙස රු. 3,778,218.91/-ක මුදලක් (සමුච්චිත) ගෙවා ඇත.

13.14 බැංකු සංගම්, මහා සංගම් බාහිර විගණනය

දිවිනැගුම ප්‍රජාමූල බැංකු සංගම් හා බැංකු සමිති කටයුතු සෑම මුදල් වර්ෂයක් අවසානයේ එනම් ජනවාරි 1 වෙනි දින සිට දෙසැම්බර් 31 දක්වා කාලය තුල සිදුවූ කටයුතු පිළිබඳව විගණනය කර, වාර්ෂික විගණන වාර්තාවක් සකස් කරනු ලබන අතර, මුල් කාලීනව එම වාර්තා සකස් කිරීමේ බලය පැවරී තිබුණේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරිවරුන් වෙතය. එහෙත්, එම කටයුත්ත සාර්ථකව ඉටු නොවුණ හෙයින්, එම වර්ෂවලට අදාලව සකස් නොකරන ලද විගණන වාර්ථා සකස් කිරීම සඳහා රාජ්‍ය/ අර්ධ රාජ්‍ය ආයතනයන්හි ගණකාධිකාරිවරු බාහිර විගණන නිලධාරින් ලෙස යොදා ගනිමින් එම සේවය ලබා ගන්නා ලදී.

2006 වර්ෂයට පසු වර්ෂයන් විගණනය කර මූල්‍ය ප්‍රකාශණයන් සකස් කර, විගණන මතය සමග ප්‍රජාමූල බැංකු අංශයට යොමු කිරීම අභ්‍යන්තර විගණන අංශය මගින් මේ දක්වා සිදු කරනු ලබයි.

13.15 බැංකු අධීක්ෂණ ඒකකය

බැංකු මූල්‍ය කටයුතු අංශය විසින් නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් හා චක්‍රලේඛ අනුව දිවිනැගුම ප්‍රජාමූල බැංකු සංගම් හා බැංකු සමිති මෙහෙයුම් ක්‍රියාවලිය විධිමත්ව සිදුවන්නේ ද යන්න අධීක්ෂණ කිරිම හා මග පෙන්වීම් කටයුතු සිදු කිරීමටත්, සමස්ත බැංකු සංගම් පද්ධතියේ කාර්යක්ෂමතාවය හා සඵලදායීතාවය වර්ධනය කිරීම අරමුණු කරගෙන "බැංකු අධික්ෂණ ඒකකය" ප්‍රජාමූල බැංකු අංශය තුල ස්ථාපනය කර ඇති අතර, පහත සඳහන් කටයුතු එම ඒකකය තුලින් ඉටු කරනු ලැබේ.

* දිවිනැගුම ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතිවල විගණන විමසුම්, සෝදිසි විගණන වාර්තා මගින් හා වෙනත් ආකාරයෙන් ලැබෙන පැමිණිලි අනුව පසු විපරම් කටයුතු සිදු කිරිම, ඒ අනුව අනාවරණය වන අඩුපාඩු නිවැරදි කිරිම හා අභ්‍යන්තර විගණන, නීති විමර්ශන හා අදාල අංශ වෙත අවශ්‍ය තොරතුරු යොමු කර, අවශ්‍ය කටයුතු සම්බන්ධිකරණය සිදු කිරීම

* දිවිනැගුම ප්‍රජාමූල බැංකු හා බැංකු සමිතිවල ගිණුම් කටයුතු, ආයතන කටයුතුවල හා දෛනික කටයුතුවල පවතින අඩුපාඩු නිවැරදි කිරිමට කටයුතු කිරිම හා අවශ්‍ය උපදෙස් ලබාදීම හා ගණුදෙනුකරුවන් ආරක්ෂා කිරීම සිදු කිරීම.

* මාසික කේවල ශේෂ පිරික්සුම් තුලනය කිරිමේ කටයුතු, බැංකු ජංගම සේවා, දිවිනැගුම බැංකු ඒකාබද්ධ කිරිම, ස්වාභාවික ආපදා හේතුවෙන් බැංකු සමංගම්වලට සිදුවන හානි හේතුවෙන් බැංකු මෙහෙයුම් කටයුතු නැවත යථා තත්ත්වයට පත් කිරිමට අවශ්‍ය උපදෙස් ලබාදීම හා නිවැරදි කිරිම් කටයුතු සිදු කිරිම.

* දිවිනැගුම ප්‍රජාමූල බැංකුවල හා බැංකු සමිතිවල ඇති වන විවිධ කාලීන අවශ්‍යතා අනුව අවශ්‍ය මෙහෙයුම් උපදෙස් හා මග පෙන්වීම් නිකුත් කිරිම තුලින් බැංකු සංගම් හා බැංකු සමිතිවල ඵලදායිතාවය ඉහළ දැමීමට දායකවීම “බැංකු/බැංකු සමිති නියාමනය හා අධීක්ෂණ ඒකකය මගින්” සිදු කෙරේ.

* අඛණ්ඩව අධික්ෂණය කිරිම මෙන්ම, ක්ෂණිකව ඇති වන අවශ්‍යතා සඳහා අවශ්‍ය සහාය ලබාදීම හා සම්බන්ධිකාරක කටයුතු පහසු කිරිම පිණිස, බැංකු මහා සංගම් නියාමන අධික්ෂණ ඒකකය, දිස්ත්‍රික්ක 25පුරාම පිහිටුවා ඇත. 2015 වර්ෂය බැංකු/බැංකු සමිති නියාමන අධීක්ෂණ ඒකකයේ ජාතික මට්ටමින් ප්‍රගති සමාලෝචන 3ක් පවත්වා ඇති අතර, එහි දී හඳුනා ගන්නා ලද ගැටළු විශාල ප්‍රමාණයක් එම වර්ෂය තුළම නිරවුල් කර ඇත.

13.16 පුහුණු කටයුතු

1074 වන සමෘද්ධි බැංකු සංගම් ජාලයේ හා 332 ක පමණ වන මහ සංගම් හි සේවය කරන කාර්ය මණ්ඩල බැංකු කටයුතු හා අනෙකුත් විෂයන්ට අදාලව පුහුණු කිරිම් බැංකු මුලා අරමුදල් මගින් දෙපාර්තමේන්තුවේ පුහුණු අංශය සම්බන්ධිකරණය සිදුකරයි.

ගණුදෙනුකාර ප්‍රජාව වෙත වඩාත් කාර්යක්ෂම ඵලදායි සේවාවක් සැකසීම උදෙසා බැංකු කාර්ය මණ්ඩලය සඳහා දැනුම කුසලතාවය හා යහපත් ආකල්පයන් ප්‍රගුණ කිරිම මෙම ඒකකයේ කාර්ය භාරයයි.

ඒ අනුව බැංකුවේ කටයුතු පිළිබඳ අවබෝධය ලබාදෙන බැංකු කටයුතු හා ගිණුම් ක්‍රියාවලිය පිළිබඳ මුලික පුහුණු පාඨමාලාව සෑම බැංකු නිලධාරියකුට ලබාදීමට කටයුතු කරයි. මෙයට අමතරව මහ සංගම් කටයුතු හා මහ සංගමයේ ගිණුම් කටයුතු පිළිබඳ නුපුහුණු මහ සංගම් කාර්ය මණ්ඩලය පුහුණු කිරිමට කටයුතු කර ඇත. එසේම ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ පුහුණු ආයතනය හරහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති අතර 2015 වසර තුල බැංකු නිලධාරින් සඳහා නියාමන හා අධීක්ෂණ පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදි. ඒ යටතේ පුහුණුව ලැබු කළමණාකරුවන් සංඛ්‍යාව 61කි.2015 වසරේ ක්ෂුද්‍ර මුලා සහතික පත්‍ර පාඨමාලාව අවසන් කළ නිලධාරින් සංඛ්‍යාව 489කි.

13.17 කළමනාකරණ තොරතුරු ඒකකය

1074 ක් වූ ප්‍රජාමූල බැංකු සංගම්හී තොරතුරු කළමනාකරණය සිදු කෙරෙන්නේ බැංකු මූල්‍යකටයුතු අංශයේ කළමනාකරණ තොරුතුරු ඒකකය මගිනි. ඒ අනුව සෑම බැංකු සංගමයක් හා බැංකු සමිතියක් මාසිකව තම බැංකු සංගම් ප්‍රගතිය, ලබා දී ඇති ආකෘති මගින් තොරතුරු හා කළමනාකරණ ඒකකය වෙත වාර්තා කළ යුතු අතර, එම දත්ත සකස් කර බැංකු සංගම්හී පවතින තත්වය විශ්ලේෂණය කර තොරතුරු ඉදිරිපත් කිරීමත් බැංකු සංගම්හි ප්‍රගතිය ඇගයීම සඳහා අවශ්‍යා අනුපාත විශ්ලේෂණයන් ගොඩ නැගීම හා ඒ අනුව බැංකු සංගම් ඇගයීම් සිදු කිරිමට සැලසුම් කර ඇත. තවද පරිගණක තාක්ෂණය උපයෝගි කරගෙන බැංකු සංගම් හා බැංකු සමිතියෙහි තොරතුරු බැංකු මූල්‍ය කටයුතු අංශය වෙත සම්ප්‍රේෂණය කිරිමට කටයුතු කර ඇත.

ප්‍රජාමූල බැංකු සංගම් පරිගණකගත කිරීමේ කටයුතු සාර්ථක වීමත් සමග මෙම ඒකකය මගින් තවත් ඵලදායීව හා කාර්යක්ෂම අන්දමින් බැංකු සංගම් පවත්නා තත්ත්වය විශ්ලේෂණය කිරීම හා ඇගයීම් කාර්ය සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.2015 වසරේ ජාතික මට්ටමින් බැංකු සංගම් ප්‍රගති සමාලෝචන වැඩසටහන් 21 ක් දිස්ත්‍රික්ක මට්ටමින් ක්‍රියාත්මක කරන ලදි.

13.18 තැන්පතු ප්‍රවර්ධන ඒකකය.

බැංකුකරණය තුල වැදගත් අංශයක් වන තැන්පතු ප්‍රවර්ධනය මෑත කාලීනව ප්‍රජාමූල බැංකු සංගම් ක්ෂේත්‍රයට හඳුන්වාදීමට බැංකු මුලා කටයුතු අංශය කටයුතු කර ඇත. ඒ අනුව ප්‍රජාමූල බැංකු සංගම්වල තැන්පතු ප්‍රවර්ධන කාර්යය උදෙසා බැංකු මුලා කටයුතු අංශයේ තැන්පතු ප්‍රවර්ධන ඒකකය මගින් විශේෂ වැඩසටහන් දියත් කර ඇත.

- 2015 වසර තුලද හෙළ සංස්කෘතික සිරිත් හා ජන ක්‍රීඩා ඉදිරි පරපුරටරැකදීම හා ප්‍රජාමූල බැංකු සංගම්ජනතාව අතර ප්‍රචලිත කිරීම අරමුණුකරගත්,රට වටාසෑම බැංකු සංගමයක්මආවරණය වනපරිදි අළුත් අවුරුදු උත්සව1000 ක්පවත්වනලදී. ඒ සඳහාඉතුරුම් රු.ද.ලක්ෂ10.5 ක මුදලක් බැංකු මුලා කටයුතු අංශය මගින් බැංකු සංගම්වලට දෙන ලදී.
- ප්‍රජාමූල බැංකු සංගම්වල ඉතුරුම්ප්‍රවර්ධනය සඳහා 2015 වසර තුලපහත වැඩසටහන් 5 ක් සැලසුම් කර දියත් කරන ලදී.

I. සිංහල -හින්දුඅවුරුදු උත්සවයටසමගාමීවඅවුරුදුගණුදෙනු සතියක් නම් කර එමගින් රු.මි.1,756/- ක තැන්පතු ඒකරාශී කරන ලදී.

II. 2015 මාර්තු 08 ජාත්‍යන්තර කාන්තා දිනය සමරමින්දිරියමාතා තැන්පතුප්‍රවර්ධන ක්‍රමෝපායක්බැංකු සංගම් 1 තුල ක්‍රියාවට නංවා සාර්ථක ලෙසපවත්වන ලදී. එහිදි අළුතින් ගිනුම් 26,434ක ප්‍රමාණයක් ආරම්භ කරන ලද අතර රු.මි.35.2 මුදලක් ඒකරාශී කරන ලදී.

III. ලෝක ළමා දින පදනම් කරගෙන ළමා තැන්පතු ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

IV. තෛයිපොංගල් උත්සවය පදනම් කරගත් ප්‍රවර්ධන වැඩසටහන.

V. නත්තල් උත්සවය පදනම් කරගත් ප්‍රවර්ධන වැඩසටහන.

13.19. පොදු කරුණු.

නව වසර තුල අංශය මගින් දියත් කරන ලද අනෙකුත් වැඩසටහන් හා ක්‍රියාකාරකම්

❖ 2015 වර්ෂය සඳහා බැංකු සංගම් සඳහා ඉලක්ක පහක් සහිත විධිමත් පරිදි වර්ෂය පුරා විහිදී යන බැංකු සංගම් කටයුතු පිළිබඳ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර බැංකු සංගම් ඒ සඳහා යොමු කරන ලදී.

බොහෝ බැංකු සංගම් කටයුතු මේ වනවිට පරිගණක පහසුකම් සලසාදෙමින් අන්තර්ජාල පහසුකම් මගින් ප්‍රධාන කාර්යාලයේ කළමනාකරණ තොරතුරු ඒකකය වෙත තොරතුරුලබාදීම ද අවශ්‍ය මග පෙන්වීම කර ඇත.

❖ 2015 වසර තුල රාජ්‍ය ප්‍රතිපාදන යටතේ බැංකු සංගම් හා බැංකු සමිතිහි යටිතල පහසුකම් වැඩිදියුණු කිරීමේ ප්‍රගතිය පහත පරිදි වේ.

වගුව - 46 ගොඩනැගිලි ඉදිකිරීම්, අළුත්වැඩියා කිරීම් හා ඉඩම් මිලදී ගැනීම් ප්‍රගතිය

2015.12.31 දිනට

වැඩසටහන	ව්‍යාපෘති සංඛ්‍යාව	මූල්‍ය ප්‍රගතිය (රු.මි)
අළුතින් ඉදිකරන ලද බැංකු සංගම් හාබැංකු සමිති ගොඩනැගිලි කොටසක් එකතු කිරීම	31	34.99
අලුත්වැඩියා කරන ලද බැංකු සංගම් හා බැංකු සමිති ගොඩනැගිලි	06	1.49
ඉඩම් මිලදී ගැනීම	02	7.4

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

❖ බැංකු සංගම් පරිගණකගත කර ඇති රත්නපුර, හම්බන්තොට, මොණරාගල අමතරව අනෙකුත් දිස්ත්‍රික්කවල වූ බැංකු සංගම් පරිගණකගත කිරිම සඳහා අවශ්‍යවන මෘදුකාංග නිර්මාණය කිරීම ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය තෝරාගෙන ඇත. තවද, සියළුම බැංකු සංගම්වල ප්‍රතිලාභින්ගේ දත්ත පද්ධතියක් ගොඩනැංවීමට කටයුතු ආරම්භ කර ඇත.

14.ගිණුම් වාර්තා

වියදම් ශීර්ෂ අංකය: 331

දෙපාර්තමේන්තුවේ නම : දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව

වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි වැඩසටහන් අංකය	වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි වැඩසටහනෙහි නම	(1) අයවැය ඇස්තමේන්තුවෙන් කිරීම	(2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම	(3) මු.රෙ. 66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම	(4) මුළු ශුද්ධ වෙන්කිරීම (1+2+3) (1+2+3)	(5) මුළුවියදම	(6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/(ඉක්මවීම) (4-5)	සිටු අංකය (අදාළ ශී.සී.එෆ්.ඒ 2 අකෘතියට අනුව)
		රු.	රු.	රු.	රු.	රු.	රු.	
	පුනරාවර්තන							
1	මෙහෙයුම් වැඩසටහන	414,860,000	9,600,000	15,000,000 (15,000,000)	424,460,000	328,406,481	96,053,519	2
2	සංවර්ධන වැඩසටහන	47,277,040,000	5,738,400,000	901,000,000 (901,000,000)	53,015,440,000	50,977,685,264	2,037,754,736	3
	උප එකතුව (පුනරාවර්තන)	**47,691,900,000**	**5,748,000,000**	**0**	**53,439,900,000**	**51,306,091,745**	**2,133,808,255**	
	මූලධන							
1	මෙහෙයුම් වැඩසටහන	86,950,000	0	0	86,950,000	21,094,203	65,855,797	2
2	සංවර්ධන වැඩසටහන	1,233,000,000	0	0	1,233,000,000	1,002,902,728	230,097,272	3
	උප එකතුව (මූලධන)	**1,319,950,000**	**0**	**0**	**1,319,950,000**	**1,023,996,931**	**295,953,069**	
	මුළු එකතුව	**49,011,850,000**	**5,748,000,000**	**0**	**54,759,850,000**	**52,330,088,676**	**2,429,761,324**	

ආර්. එම්. එම්. පී. රත්නායක
ප්‍රධාන ගණකාධිකාරී
දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
4 වන මහල, සෙත්සිරිපාය,
බත්තරමුල්ල.